සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2557ක් වූ නිකිණි මස (ව්‍යවහාරික වර්ෂ 2013 අගෝස්තු)

22 වෙනි කලාපය



## දෙව් ලොව දෙවියන් විඳින දුක

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

රු. 20/-



# දකින සහ නොදකින

# වෙ ණ සි



උපතින් රැගෙන එන කම් එල ඉවත දමා
වරිගෙන් ජාතියෙන් කුලයෙන් ලොවම තෙමා
අදමින් දිවි ගෙවා පස් පවු කරන සැමා
සදමින් ජාති ඇත පර ලොව නොදැක තමා

කළු සුදු කුල මලද මතු පිට වෙනස දෙස
බැලූ විට තවද එක් කර උන් දොඩන බස
සළු පිළි පළඳවා තමනට සිතැඟි ලෙස
සුළු කොට තකයි අනුනගෙ පිළ ලෙසට වස

නොකළත් කතා නෙක බස් ඇති මනු ජාති
එකමත් එක කලක දහමින් විය ජෝති
දැකලත් වෙනස හඳුනා ගනු බැරි නීති
මෙකලත් හදා මිනිසුන් පහළට දාති

පෙර භවවලත් මේ ලෙස වෙන් කරපු දොස
ජර මර මිසක් ගෙන දුන්නේ නොමැත තොස
හැර එක කයක් කුණු වී යන විටදී මස
තිර ඇති ජාතියක් විද මරු දීනුව මිස


පිලකට බෙදී විඳවන මනු ලොවෙහි සත
කලකදී ජය ලබා කලකදී පැරද යත
සුල මුල නොදැක යුද වැදුනද උපත මත
මළ විට පරලොවෙහි මනු ලොව වෙනස නැත

වෙනස් වෙවී යන ජාතිය සසර පුරා
හිනැස්සුවා මිස දුක නම් නොමැත ඉරා
මනස්ගාතයක් වී භව කතර සරා
නැණැස් නොපාදයි මේ දොස තියෙන තුරා

මස් ලේ ඇසට පමණක් හසු වන වෙනස
දොස් ඇත බොහෝ අවුරයි කළු කර මනස
හිස් මතවාද අත හැර වැඩූ විට නැණස
ඇස් පාදවයි සත හට අවිදුව වනස

ජන්මෙන් වසලයෙක් හෝ බමුණෙක් නොවන
රන් මෙන් වටින කියමන දහමක් දෙවන
දුන්නෙන් එ මුනි වදනින් දහසක් නුවණ
බින්දෙන් අවිදු නොකරයි වෙනසක් නිවන


පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන





# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

**2 වන කොටස**



සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට පමණ පෙර, සුමේධ තාපසතුමා මුලින්ම නියත විවරණ ගත් දීපංකර බුදුන් වහන්සේ වැඩ සිටින කාලයේ සිදු වෙච්ච එක්තරා සිදුවීමක්, යසෝධරා රහත් තෙරණින් වහන්සේ විසින් ගෞතම බුදු පියාණන් වහන්සේ ඉදිරියේ කියා සිටියා. ඒ කාලයේ එතුමිය බමුණු කුලයක උපන් තරුණියක්. නමින් සුමිත්තා. මේ තරුණිය ඇගේ යෙහෙළියන් සමග දීපංකර බුදුන්වහන්සේ පුදන්න නෙලුම් මල් මිටි අටක් ගෙන යමින් සිටියා.

''එකල්හි මම බමුණු කුලෙහි උපන්නෙමි නමින් සුමිත්තා නම් වූ කන්‍යාවක් වූමු. (තථාගත) සමාගමයටද එළැඹුණුමු.'' (අපදාන පාලිය - 2-2 - යසෝධරාපදානය - 167 පිටුව)

එතනදී ඇය අති දුර්ලභ විශේෂ සිදුවීමක් දකිනවා. ඒ සුමේධ ඍෂිවරයා, එහෙම නැත්නම් තාපසතුමා මඩ ගොඩේ බිම දිගාවෙලා, දීපංකර බුදුපියාණන් වහන්සේට තමන්ගෙ ශරීරය මතින් යාමට ඉඩ සලසා දෙනවා. ඉන්පසු දීපංකර බුදුන්වහන්සේ, මේ තාපසතුමා ගෞතම නමින් මතු බුදු වෙන උත්තමයෙක් බව ලොවට කියා පානවා. මේ සිද්ධියෙන් පසු මේ තරුණියට අර තාපසතුමා ගැන ලොකු පැහැදීමක් ඇතිවෙනවා.

''එදවසැ (සුමේධ) ඍෂිහුගේ ඵල සහිත ඒ (ජීවිත පරිත්‍යාග සංඛ්‍යාත) පරාක්‍රමය දුටුමු. පූර්ව පුණ්‍ය කර්ම හේතුයෙන් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහි මාගේ සිත ද ප්‍රසන්න වී.'' (අපදාන පාලිය - 2-2 - යසෝධරාපදානය - 167 පිටුව)

මෙතනදී පැහැදිලි කර ගන්න ඕන වැදගත් කාරණයක් තියෙනවා. ''පූර්ව පුණ්‍ය කර්ම හේතුයෙන් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහි මාගේ සිත ද ප්‍රසන්න වී.'' මේ කියන කොටසේ අර්ථය සරලව කියනව නම්, මගේ පෙර පින් නිසා බුදුපියාණන් වහන්සේ කෙරෙහි සිත පැහැදුනා කියන එක තමයි මේකෙන් කියන්නෙ.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, බුදුවරයන් වහන්සේ නමක් කෙරෙහි පැහැදෙන්න පෙර පින් ඕනද කියල.

මෙතනදී මේ තරුණිය සුමේධ තාපසතුමා ගැන කලින් දැනගෙන තියෙනවා. ඊට හේතුව ඇය බමුණු කුලයක උපන් තරුණියක් වීම. නොයෙක් කාරණා සඳහා වෙද හෙදකම්, නැකැත් බැලීම් ආදිය තම දෙමවුපියන් හරහා මේ තාපසතුමාගෙන් කරගන්නත් ඇති. ඒ නිසා එතුමාගේ බලය ගැන සැකයක් නෑ. ඒත් එහෙම බලයක් තියෙන කෙනෙක් මඩ ගොඩක දිගා වෙලා තමන්ගෙ ශරීරය මතින් යන්න ඉඩ දුන්න, ඊටත් වඩා බලවතා කවුද කියල හොයල බැලුවා. ඒ නම් මේ ඍෂිවරයාටත් වඩා ගුණ යහපත්, ඊටත් වඩා උත්තමයෙක් වෙන්න ඕන. එහෙම හිතන්න නිකන් කෙනෙකුට බෑ. ඒකට ඉතාමත් පැහැදිලිවම තේරුම් ගන්න පුළුවන් මනසක් තියෙන්න ඕන. **ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ කියන මේ කාරණා කෙනෙකුට නිකන් ලැබෙන්නෙ නෑ. ඒකට පෙර අත්බැව්වල දන් දීල, බණ භාවනා කරල, ගුණ වඩල තියෙන්න ඕන.** ඒ නිසා තමයි එතුමිය කිව්වෙ, මගේ පෙර පින නිසයි අර මහා උත්තමයා (දීපංකර බුදුන් වහන්සේ) කෙරෙහි පැහැදුනේ කියල.

ඉතින් ඒ පැහැදීම උඩ, අර සුමේධ තාපසතුමා ගැනත් බොහොම පැහැදුනා. විශේෂයෙන් එතුමාගේ නිරහංකාරකම ගැන. මේ නිසා අර බුදුන් පුදන්න ගෙනිච්ච මල් මිටවල් අටෙන් පහක් එතුමට දුන්නා. තුනක් ඒ තරුණිය තියාගෙන බුදුන් වහන්සේට පූජා කරල පැතුමක් පැතුවා, අප දෙදෙනාගේම පැතුම් එකම වේවා, එසේම නුඹගේ බුද්ධත්වයටත් මේ මල් පූජා වේවා කියල. සුමේධ තාපසතුමා ඒ මල්වලින් බුදුන් වහන්සේ පිදුවා.

බුදුපියාණන් වහන්සේලාගේ සිරිතක් තමයි, මේ වගේ විශේෂ කෙනෙක් හමුවුනොත්, ලෝකයාට වැඩ පිණිස ඒ කරපු දේ කොච්චර වටින එකක් ද, ඒකෙන් ලැබෙන විපාක මොනවද, එහි අවසානය කුමක් ද කියන කාරණා පහදා දීම. උන් වහන්සේ සුමේධ තාපසතුමාට මෙහෙම කාරණයක් කියනවා. මේ තරුණිය ඔබ හා සමාන සිත් ඇති, සමාන කර්ම ඇති කෙනෙක්, නුඹගේ ගමනට ලොකු උදව්වක් වෙන කෙනෙක්, නුඹගේ ධර්මයට දායාද වෙන ප්‍රිය භාර්යාවක් වෙයි.... ආදී වශයෙන් විවිධ ආකාරයෙන්, මැය බෝසතාණන් වහන්සේ පාරමිතා පුරන කාලයට උදව් වෙන හැටි කියා පෑවා.

දැන් මේ කාරණා කියවන කොට කෙනෙකුට ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන්, යසෝධරාවත් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක කාලයක ඉඳන් පාරමිතා පුරාගෙන ආව නම්, දීපංකර බුදුන් වහන්සේ විසින් විවරණ දෙන අවස්ථාවේදී ''නුඹ හා සම සිත් ඇති සම කර්ම ඇති'' කියල මෙහෙම කාරණයක් කියනවා, ඉතින් එතුමිය පිරිමියෙක් වුනානම් බුදුවෙන්නත් තිබුණනෙ කියල.

මෙතනදී සම සිත්, සම කර්ම ඇති කියල කිව්වෙ ඇයි ද කියල බලන්න ඕන. එතනින් තෝර ගන්න පුළුවන් මෙතුමියගේ පාරමිතාවේ වෙනස. මෙතනදී සම සිත් කිව්වෙ සිතිවිලි සර්ව සම්පූර්ණයෙන් සමාන වීම නෙවෙයි, අනෙකාගේ සිතිවිලිවලට ගැලපීම. උදාහරණයක් විදියට ගත්තොත් ලොකු ඇන්ජිමක් පණ ගන්වන්න ඒකට ගැලපෙන ඇණයක් / මුරිච්චියක් අල්ලනවා. එතකොට ඒක පුංචි කොටසක් වුණත් ගැලපෙන මුරිච්චියක් නිසා එන්ජිම හොඳින් වැඩ කරනවා. එකක් ලොකු වෙලා අනෙක පුංචි වුණාට ගැලපීම තියෙනවා. විසම නැති නිසා සමානයි. ඒ වගේ තමයි මෙතනත් දෙන්නම විසම නෑ, එක් කෙනෙකුට එක් කෙනෙක් විසම නෑ, විසම චර්යා රටා නෑ. ඒකයි මේ කියන්නෙ.

දැන් මෙහෙම හිතන්න. ගෙදර ස්වාමි පුරුෂයෙක් ඉන්නවා. ගෙදරට හිඟන කාන්තාවක් මෙහෙම කියාගෙන එනවා. ''අනේ මහත්තයා මට හරියට අඳින්නවත් ඇඳුමක් නෑ. වැඩිපුර ඇඳුම් තියෙනව නම් දෙන්න.'' දැන් අර ගෙදර මනුස්සයට හිතෙනවා, අනේ මේ අසරණ කාන්තාවට ඇඳුමක් දුන්නොත් කොච්චර වටිනවද කියල. දැන් දන් දෙන සිතිවිල්ලක් ආවා. ගෙදර නෝනගෙන් අහනව, මේ ඔයාගෙ වැඩිපුර ඇඳුම් එහෙම තියෙනවද අර හිඟන මනුස්සයට දෙන්න කියල. ඒ ගෙදර නෝනට තමන්ගෙ ස්වාමි පුරුෂයා කරන්න යන වැඩේ ගැන, ඒ සිතිවිල්ල ගැන සමානව ඒ විදිහටම, අනේ කොච්චර හොඳ වැඩක්ද ඒ කෙනාට මගේ වැඩිපුර ඇඳුමක් දුන්නොත් කියල හිතුනොත් මොකද වෙන්නෙ. අර ස්වාමි පුරුෂයා කරන්න ගිය පින්කමට උදව්වක් වෙනවා. හැබැයි දෙන්නගෙම සිතිවිලි අසමාන වුනොත් මොකද වෙන්නෙ? ''පිස්සුද මට තියෙන්නෙත් ඇඳුම් දෙක තුනයි, ඒකත් දීල කොහොමද?'' මෙහෙම කිව්වොත් දැන් අර ස්වාමි පුරුෂයාගේ සත් කාර්ය කරන්න බැරුව යනවා, ගැටුමක් ඇතිවෙනවා.

ඉතින් බුද්ධත්වය කරා යන ගමන ලේසි පහසු ගමනක් නෙවෙයි. දාන, සීල, භාවනා උපරිමයෙන් කරගෙන යන්න ඕන ගමනක්. ඒ වැඩේට ඊටම ගැලපෙන සමාන සිත් ඇති, සමාන කර්ම (සමාන ක්‍රියා) ඇති කෙනෙක් ඕන. මෙතන සම කර්ම කිව්වෙ උදව්වට කරන ක්‍රියා. ඒ කියන්නෙ, කොහේද යන්නෙ මාත් එනව පස්සෙන් ඒ වැඩේට උදව්වක් වෙන්න කියල කිසිම ප්‍රශ්න කිරීමක් නැතුව යනවා. යසෝධරාව එහෙම කෙනෙක් වෙනව කියන එකයි, දීපංකර බුදුන් වහන්සේ විවරණ දෙන වෙලාවෙ කිව්වෙ.

මේ නිසා බෝසතාණන් වහන්සේ සමඟ එකට ගමන් කරල, උන්වහන්සේ පාරමී ධර්ම පුරණ කොට ඒවට සහයෝගය දීල කරගත්ත කුසල කර්ම ලේසි පහසු දේවල් නෙවෙයි. ඒකට ලැබීමත් ඒ වගේමයි. අවසාන අත්බැව වෙනකල්ම නිතරම ගැලපීම් සහගතව පසුපස ආවා. ඒකත් සැප හා දුක් කරදර සියල්ල ඉවසීමෙන් විඳගෙන ආපු ගමනක්. ඇගේ අවසාන අත්බවයේදී කෝලිය වංශයේ ඉපදිලා උපරිම සැප සම්පත් විඳිමින්, බෝසතාණන් වහන්සේට උපරිමයෙන්ම ගැලපෙන චරිතයක් බවට පත් වුණා.

දැන් කෙනෙකුට මෙහෙම හිතෙන්න පුළුවන්. ''සිදුහත් කුමාරයා ගිහි ගෙය අතහැරල ගිය වෙලාවෙ, ඇයට උන්වහන්සේ කෙරෙහි වෛරයක් ඇති වුණේ නැද්ද? තනි කරලනේ ගියේ? සිදුහත් කුමාරයා සමග විවාහ වෙලා ඉඳෙද්දි කාම භෝගී ජීවිතයක් ගත කළාද? දරුවෙකුත් හිටියනේ?'' මේ වගේ ප්‍රශ්න එන්න පුළුවන්.

මේ ගැන ඉඟියක් ගන්නව නම්, යසෝධරා ථේරාපදානයේ වැදගත් තැනක් තියෙනවා. එකක් තමයි දීපංකර බුදුන් වහන්සේ විවරණ දුන් අවස්ථාවේ මැය ගැන පවසපු දේ. ''ඔබ වගේම සම සිත් සහ සම කර්ම තියෙන කෙනෙක්''. කොටින්ම කියනව නම්, සිදුහත් කුමාරයා සිතන පතන විදිහට චරිතවත්ව හැසිරෙන්න, කටයුතු කරන්න ඇයත් දන්නවා. කවදා හෝ ගිහි ගෙය හැර යනව කියලත් දන්නවා. ඒකට උදව්වක් හැටියට හැසිරුනා මිසක්, අපි හිතන විදිහට කාමයෙන් මුසපත් වෙලා ඒකට මුල් තැන දීල අඹු සැමියන් ලෙස හැසිරුනා වෙන්න විදිහක් නෑ. ඒකට හේතුත් නෑ. පතිව්‍රත්තතාවයෙන් යුත් උතුම් කාන්තාවක් විදියටයි හැසිරුනේ.

කොහොමද එහෙම කියන්නෙ කියල ඊළඟට ප්‍රශ්නයක් එන්න පුළුවන්. යසෝධරා ථේරාපදානයේ එන වැදගත් කාරණයක් ගත්තොත්,

''කාම ධාතු ඉක්මැ වූවා රූප ධාතුහි සිටියා වෙමි. ලෝක නායකයන් තබා රූපයෙන් (මට) සමාන වූවක් නැති'' (අපදාන පාලිය - 2-2 - යසෝධරාපදානය - 161 පිටුව)

ගිහි කාලයේ වුණත් කාම සම්පත්වලට, ඒ ක්‍රියාකාරකම්වලට නොඇලුන සිතක් ඇයට තිබිල තියෙනවා. ඊට එහා දෙයක් තිබිල නෑ කියල මේ කියමනින් වැටහෙනවා. මුළු පාරමිතා කාලයේදීම බෝසතාණන් වහන්සේට 100%ක්ම ගැලපෙන පතිනියක් වීම තමයි ඇගේ මානසිකත්වය වුණේ. බාධාවක් නොවීම, උපකාරයක්ම වීම... මේ තමයි ඇය ගිහි කාලයේ ගත කරපු විදිහ.

අවසානයේ ඇය මේ බුද්ධ සාසනයේ පැවිදි වෙලා, සති දෙකක් ඇතුලත අරිහත්වයට පත්වෙනවා. ඒ වගේම යසෝධරා රහත් තෙරණිය සම්බන්ධයෙන් එතුමිය සතු අභිඥා ශක්තිය, සිවුපිළිසිඹියාව ගැන මනා සඳහනක් තියෙනවා. පිරිනිවන් පාන මොහොතේ ගෞතම බුදු පියාණන් වහන්සේගේ ආරාධනයෙන්, ලෝ සතුන්ගේ සැක දුරු කිරීම සඳහා යසෝධරා අරිහත් තෙරණින් වහන්සේ විවිධ ආකාරයේ ප්‍රාතිහාර්ය පෑවා. මේ එතුමිය සහ බුදු පියාණන් වහන්සේ අතර ඇතිවුන කතා බහක්.

''මහා වීරයාණනි, සැල කරමි. සසර සර ඇවිඳුනා සෙමෙහි තොප කෙරෙහි ඉදින් මාගේ දොසෙක් වී නම් එය ක්ෂමා කරව.''

ඇගේ වදන් අසා මුනීන්ද්‍රයන් වහන්සේ මෙය වදාළ සේක. ''නිවනට යන තොපට මතු කුමක් නම් කියම්ද?'' (අපදාන පාලිය - 2-2 - යසෝධරාපදානය - 161 පිටුව)

මේ කතා බහෙන් ගන්න පුළුවන් වැදගත් කාරණයක් තියෙනවා. එතුමිය සසර පුරා ආපු ගමනේදී, බෝසතාණන් වහන්සේට තමන් අතින් යම් වරදක් ප්‍රමාදයක් වුනා නම් කමාව ඉල්ලා සිටිනවා. උත්තමයෙකුට වුන වැරැද්දක් තියෙනව නම් කමාව ඉල්ලනවා. නමුත් බුදුන් වහන්සේ ඒකට දුන්න පිලිතුර බලන්න.

''නිවනට යන තොපට මතු කුමක් නම් කියම්ද?'' ඒ කිව්වෙ සියලු කෙලෙසුන් නසා, රාග-ද්වේශ-මෝහ අංශුමාත්‍රයක් වත් නැතුව පිරිනිවෙන්න යන කෙනෙකුට තවත් මොනව කියන්නද?, මොන උපදෙසක් දෙන්නද?, මොනවා කමා

කරන්නද? අපිටත් ඒකෙන් පාඩමක් ඉගෙන ගන්න පුළුවන්. **අපි අතිනුත් අනන්ත අප්‍රමාණ සසරේ ලෝක සත්වයන්ට, උතුමන්ට, බුද්ධ සාසනයට වැරදි වෙලා තියෙන්න පුළුවන්. නමුත් ඒ සියලු වැරදිවලින් කමාවක් ගන්න පුළුවන් ක්‍රමයක් බුද්ධ සාසනය තුලම තියෙනවා.** ඒ තමයි මේ ලැබිල තියෙන මොහොතේ ආර්ය ධර්මය වටහා ගෙන අපේ ගමන නිමා කරගැනීම. ඉතින් සියල්ල සියලු ආකාරයෙන් දැක්ක බුදුන් වහන්සේත්, නිවනට යන නුඹට මම මොනවා කියන්නද කියල ඇහුවෙ ඒ නිසයි.

''මාගේ අනුසසුන් කරන්න, සෘද්ධි ද දක්ව, සසුන්හි ලා සියලු පිරිස් හි සැක ද සිඳලව.''

(අපදාන පාලිය -2-2- යසෝධරාපදානය- 161 පිටුව)

මේ තමයි ගෞතම බුදුන් වහන්සේ, යසෝධරා රහත් තෙරණියට කරපු ආරාධනාව. මේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක අති විශාල කාලයක පටන් ගෙනා පාරමිතා ශක්තියේ උපරිම ප්‍රතිඵලය වෙච්ච අරිහත් ඵලය සහ ඉන් ලැබුන අනෙක් හැකියාවන් පෙන්වන්න කරපු ආරාධනාවක්.


ඊට පස්සෙ එතුමිය හිස උතුරු කුරු දිවයිනට සමව, පියාපත් යුවල පූර්ව විදේහය, අපර ගෝයානයට සමව, සිරුර දඹදිවට සමව, පිල් කලඹ මහ සයුර හා සමානව, ඇස් දෙක ඉර හඳට සමානව, හිස මහාමේරු පර්වතය සමව, ලිහිණි රුවක් මවාගෙන, මහ ගස් මුලින් ගලවා ඉන් පවන් සලමින් බුදු පියාණන් වහන්සේට නමස්කාර කළා. ඒ වගේම ඇත් රුවක්, අස් රුවක් ආදී විවිධ රූප මවමින් උන්වහන්සේට නමස්කාර කළා. (මේකට කියන්නෙ විකුබ්බන සෘද්ධි කියල. ඒ කියන්නෙ විවිධ වෙස් මවන්න පුළුවන් හැකියාව.) ඒ වගේම බ්‍රහ්ම රූපයක් මවාගෙන චතුරාර්ය සත්‍යය කැටිවූ, එතුමියගේ සිවුපිළිසිඹියාව, එනම් අර්ථයෙන්, ධර්මයෙන්, නිරුක්තියෙන්, පටිභාන නුවණින් පරිපූර්ණ වූ ධර්ම දේශනාවක් කළා. ඉන්පසු පිරිනිවන් පෑවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

***අපදාන පාලිය 2 – 2 – යසෝධරාපදානය ඇසුරින් සකස් කළේ,***

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# ලොව උතුම් පියා....



**සම්බුදු හිමිගෙ ගුණ කඳ අපමණයි පුතේ**
**සම්බුදු හිමිගෙ දම් ගුණ අපමණයි පුතේ**
**සම්බුදු සසුනෙ සඟ ගුණ අපමණයි පුතේ**
**සම්බුදු පියා දෙසු දම් අපමණයි පුතේ**

**අප හැම දෙනගෙ පෙර පින් මතු වෙලා පුතේ**
**ලොව තුම් පියෙක් අප හට හමුවුණා පුතේ**
**බුදු දම් අසා ලොව තතු වැටහුණා පුතේ**
**මහ ගිනි ගොඩෙන් මම අද බේරුණා පුතේ**

**පායන හිරු කිරණ මෙන් ලොව බබළන්න**
**මෙත් මල් සුවඳ ලොව හැම තැන පතුරන්න**
**පෙර පින් බලය ගෙන නිවනින් සැනසෙන්න**
**පිය මග යන්න පුත අදිටන් කරගන්න**

**පියා නොමැති අසරණ වූ පුතෙකු කියා**
**මුලා කරන්නට ආවත් නොමග නොයා**
**ලබා ඇති මිනිස් භවයෙන් නිවන සොයා**
**මෙදා හඳුන ගන් පුත දම් බෙදන පියා**

**මුරුතමුරේ ධම්මින්ද හිමි**

# හඳුන් කූරු පූජාවෙන් නිවන් දකින හැටි

මේ තුන් ලෝකෙ කොතැනකවත්, ඉඳිකටු තුඩක තරම්වත් තැනක සුවයක් නිදහසක් බුදු ඇසින් දකින්න නෑ කියලයි බුදු පියාණන් වහන්සේ දේශනා කළේ. සුවය නිදහස කියන්නෙ නිවීම. ඒ තමයි නිවන. ඒ නිවනට මග තමයි සීල, සමාධි, ප්‍රඥා ගුණ පූර්ණ කර ගැනීම. මේ ගුණ පූර්ණ කර ගන්න කටයුතු කරන්නෙ ප්‍රඥාවෙන් සිවු අරිසස් (චතුරාර්ය සත්‍යය) අවබෝධ කරගත් තැනැත්තා.

''.... මේ ධර්මය, ඇරඹූ වීර්‍යයී ඇත්තාටය - කුසීතයාට නොවේ. මේ ධර්මය, එළඹ සිටි සිහි ඇත්තාටය - මුළා සිහි ඇත්තාට නොවේ. මේ ධර්මය, සමාහිතයාටය - අසමා-හිතයාට නොවේ. (සමාධි හිතක් තියෙන කෙනාට මිසක් සමාධි නැති කෙනාට නෙවෙයි. ඒ කියන්නෙ වික්ෂිප්ත හෙවත් කැළඹුණු හිත් ඇත්තෙකුට නෙවෙයි.) මේ ධර්මය ප්‍රඥාවන්තයාටය - දුෂ්ප්‍රා-ඥයාට නොවේ .....''

මේ ආදී වශයෙන් අංගුත්තර නිකායේ 5 වෙනි කාණ්ඩයේ 136 පිටුවේ එන අනුරුද්ධ සූත්‍ර දේශනාවෙනුත් මේ බව පැහැදිලි කරල තියෙනවා.



කෙනෙක් ගුණ දකල පැහැදීමෙන් බුද්ධ ශාසනයට ඇතුළු වෙනවා. මනා සිහි නුවණින්, කල්‍යාණ මිතුරු ඇසුරෙන්, ධර්ම ශ්‍රවණය කරල ආයුෂ ප්‍රඥාව ලබනවා. එතැන් පටන් ප්‍රඥාවන්තයා මේ ධර්ම මාර්ගය අනුගමනය කරල මග ඵල ලබනවා. සීල, සමාධි, ප්‍රඥා කියන ගුණ පූර්ණ කර ගැනීම තමයි ධර්ම මාර්ගය. මේ මාර්ගය පූර්ණ කර ගැනීමෙන් අරි අටඟි මග වැඩෙනවා. සප්ත බොජ්ජංග වැඩෙනවා. වැඩීම පූර්ණ වෙනකොට දකපු නිවන, ආර්ය ප්‍රඥාව පූර්ණ වෙනවා. සීල, සමාධි, ප්‍රඥා කියන ගුණ පූර්ණ කරනව කියන එක තව විදියකින් කියනව නම්, සිත, කය, වචනය ආර්ය ධර්මයට අනුව සංවර කර ගැනීම. (සං වරණවා, සං කියන එකතුවෙන් වෙන්වීම, නිදහස්වීම) සංවර වෙන්න නම්, සිත - කය කියන්නෙ අපි කැමති පරිදි නොපවත්නා

(අනිච්ච), ක්ෂණයක් පාසා විපරිනාමයට පත්වෙන (ජරා, මරණ), ඒ හේතුවෙන් දුක් උපදවන (දුක්ඛ), ආස්වාද මායාවකින් වසන ලද අසාර (අනත්ත) එකක් බව වැටහෙන්න ඕන. මේ වැටහීම එන්න නම් බුදු කෙනෙක් ලෝකෙට පහළ වෙලා, දෙවියෙක්, මාරයෙක්, බ්‍රහ්මයෙක් හෝ වෙන කිසි කෙනෙක් (ශාසනය පිහිටුවීමෙන් පසු නම් මග ඵල ලාභියෙක් හැර) දේශනා කරන්නෙ නැති ධර්මයක් දේශනා කරන කොට, අන්න ඒ ධර්මය අවබෝධ කර ගන්න ඕන. බුදු කෙනෙක් මේ ලෝකෙට පහළ වෙන්නෙම තිලකුණ කියන මේ අකුරු අටකින් හා පද තුනකින් යුත් ධර්මය දේශනා කරන්න. ඒ ධර්මය තමයි කාම ලෝක, රූප ලෝක, අරූප ලෝක කියන තුන් භවයම අනිච්ච, දුක්ඛ, අනත්ත කියන ධර්මතාවයෙන් යුක්තයි කියන කාරණය. ඒ ධර්මය වැටහෙන්න නම් මුලින් සඳහන් කළා වගේ කල්‍යාණ මිතුරු ඇසුරෙන්, මනා සිහි නුවණින්, ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කරන්න ඕන. මේ ධර්මය කියන්නෙ ප්‍රඥාවන්තයින්ට. පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි කියන දහම් ගුණය තමයි ඒ කිව්වෙ. ඥානවන්තයින් ධර්ම ශ්‍රවණය කරල නොදන්න දේ දැනගන්නවා. නොදන හිටියෙ මේ ලෝකය අනිච්ච, දුක්ඛ, අනත්ත බව. ඒක දැනගත්තම ඊළඟට කරන්න ඕන දේ තමයි සීල, සමාධි, ප්‍රඥා ගුණ පූර්ණ කර ගැනීම.

මල් පූජ කරල සීල ශාසනය වැඩි දියුණු කර ගන්න විදර්ශනා පිළිවෙල පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. බුදුන් වහන්සේ උපමා සංසන්දනය කරල ගැඹුරු දහම් කරුණු පහසුවෙන් අවබෝධ කර ගන්න හැටි දේශනා කරල තියෙනවා. ''......පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි ......'' ආදී වශයෙන් ධම්ම චක්කප්පවත්තන සූත්‍ර දේශනාවෙදි, ප්‍රඥාව ආලෝකයට උපමා කරල තියෙනවා. මේ වගේ සීලය සුගන්ධයට උපමා කරල තියෙනවා.

සමාධිය කියන්නෙ එක තැනක වාඩිවෙලා, හෙළවෙන්නෙ නැතිව ඉන්න එක කියලයි බොහෝ පිරිස් හිතාගෙන ඉන්නෙ. නමුත් සමාධිය කියන්නෙ යම්කිසි කටයුත්ත-කට සිතින් බැඳිල, ඒ තුළම සිත, කය, වචනය පවත්වා ගැනීමට, ඒ සමයට ඇදී සිටීමට. මේ විදියට යම්කිසි කටයුත්තක් කිව්වම හොඳ නරක දෙකම තියෙනවා. නරක දේකට හිත තිව්වොත් ඒකෙන් මිච්ඡා සමාධියක් ගොඩ නැගෙනවා.

උදාහරණයක් හැටි-යට **හොරකම් කරන්න හිත තිව්වොත් හොරකම් කරන දේවල්, හොරකම් කරන්න පුළුවන් වෙලාවල්, ඒවා කළ හැකි ක්‍රම සහ විධි..... මේ වගේ හොරකම පිළිබඳ මිච්ඡා සමාධිය පහළ වෙලා ඒ සම්බන්ධ මිච්ඡා ඥානයක් පහළ වෙනවා. ඒ වගේ සමාධිවල අවසාන ඵලය තමයි සතර අපාය.** නිවන අරමුණු කරගෙන හොඳ දේකට හිත තිව්වොත්, ඒ සඳහා කළ යුතු පින් දහම්, කළ යුතු වතාවත්, ඇසුරු කළ යුතු කල්‍යාණ මිතුරන්, ඇසුරු කළ යුතු පූජනීය ස්ථාන...... ආදිය පිළිබඳ ඥාන පහළ වෙලා සම්මා සමාධිය පිහිටනවා. මේ ආයුෂ සමාධිවල අවසාන ඵලය තමයි නිවන.

අද අපි ගාථාවක් කියල සුවඳ හඳුන් කූරු පූජා කරනවා. හැබැයි ඒ ගාථාවෙ දහම් අරුත ගැන අපි හිතුවෙ නෑ. මේ සුවඳ දුම් බුදුන් වහන්සේට පූජා කරමි, පූජා වේවා කියල බොහොම ගෞරවයෙන් වැඳල නිවනත් පැතුවා. ඒ වුනාට බුද්ධ දේශනාවෙ තියෙන්නෙ රූප, ශබ්ද,

ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම කියන මේවා සතර මහා ධාතුවල ඵල වශයෙන් සකස් වූ, විපරිනාමයට පත්වෙලා වැනසිලා යන දේවල් නිසා අත්හැරිය යුතුයි, නොඇලිය යුතුයි, මිදිය යුතුයි කියල. එහෙනම් පූජා කළේ හඳුන් කූරෙ තිබ්බ්ච සුවඳ නම්, කරපු වැඩෙන් පූර්ණ නිවනට (අරිහත් ඵලයට) බාධාවන නිකාන්ති තෘෂ්ණාවක් හට ගන්නවා (තමන් ලබන පුණ්‍ය ආස්වාදයේ හිත බැඳීම නිසා). එහෙනම් මතු පිටින් පෙනෙන අර්ථයට වඩා ගැඹුරු අර්ථයක් හඳුන් කූරු පූජාවෙ තියෙන්න ඕන. මේ වෙන කොට ඒ අර්ථය වැහිල, ක්‍රියාව විතරක් තියෙනවා. ඒකයි සැඟවුන බොදු මග මතු කරල දෙනව කියන්නෙ. අර්ථය වැහිල ගියාම, මේව මෝඩ සද්ධාවෙ වැඩ කියලත් සමහරු කියනවා. ඒ සැබෑ අර්ථය නොදන්න නිසා.

සුගන්ධි කාය වදනං
- අනන්ත ගුණ ගන්ධිනා
සුගන්ධිනා හං ගන්ධේන
- පූජයාමි තථාගතං

කාය වදනං සුගන්ධි - (මගේ) කය, වචනය සුවඳයි. සුගන්ධිනා + අහං - සුගන්ධිනාහං, අහං ගන්ධෙන පූජයාමි තථාගතං - මම සුගන්ධයෙන් තථාගතයන් වහන්සේ පුදමි. අනන්ත ගුණ ගන්ධිනා සුගන්ධි - අනන්ත ගුණ සුගන්ධයෙන් සුගන්ධවත් වූ.

මම මගේ කය, වචනය නමැති සුගන්ධයෙන්, අනන්ත ගුණ සුගන්ධයෙන් සුගන්ධවත් වූ තථාගතයන් වහන්සේ පුදමි. එහෙම නම් අපි මේ සුවඳ කූර උපමා කරගෙන අපේ කය, වචනය සුගන්ධ බව පෙන්වන්න ඕන.

නිහඬ, නිසසල, පිරිසිදු තැනකින් සංවරව වාඩිවෙලා දෙනෙත් පියාගෙන, දෑත උකුල මත තියාගෙන දල් වූ සුවඳ කූරක් අතැඟිලි අතර තියෙනව කියල සිතින් මවා ගන්න. මනසින් මේ මවා ගත් හඳුන් කූරත්, තමනුත් සංසන්දනය කරන්න. මනසින්ම ප්‍රශ්න අහන්න. මනසින්ම නිහඬව පිළිතුරු දෙන්න.

**හඳුන්කූරු ඍජුයි. මා ළඟ තියෙන ඍජු ගුණය මොකක්ද?** සතුන් මැරීම, සොරකම් කිරීම, වැරදි කාම සේවනය, සුරා සූදු දුරාචාර කියන්නෙ කයින් කරන අකුසල්. බොරු, කේලම්, පරුස වචන, හිස් වචන කියන්නෙ වචනයෙන් සිදු කරන අකුසල්. ලෝක සම්මත විදියටත්, නීතියෙනුත් මේ බොහොමයක් අකුසල් වැරදි ක්‍රියා හැටියට සම්මතයි. මේවා කළොත් සමාජයෙනුත්, නීතියෙනුත් හැංගි හැංගි වංක වෙලා තමයි ජීවත් වෙන්න සිද්ධ වෙන්නෙ. ඒ වගේම මේ අකුසල් නිසා මතු දුක් විපාක විඳින්නත් සිද්ධ වෙනවා. මම මේ වැරදියි කියල සම්මත අකුසල්වලින් වෙන් වෙලයි ජීවත් වෙන්නෙ. එහෙනම් මම වංක නෑ, අවංකයි, ඍජුයි. මමත් මේ සුවඳ කූර වගේ ඍජු ගුණය ඇති කෙනෙක්.

**මේ සුවඳ හඳුන් කූරෙ මුදුන බබලනවා. මගේ මුදුන බබලන්නෙ කොහොමද?**

කලණ මිතුරු ඇසුරකින්, මනා සිහි නුවණ ඇතිව ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කරලයි හඳුන් කූරෙන් බුද්ධ පූජාවක් කරන්නෙ. බුදුන් වහන්සේලා කියන්නෙ



සාරාසංඛ්‍ය, අටාසංඛ්‍ය, සොලොසාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනින් දාන, සීල..... ආදී දස පාරමිතා, දස උප පාරමිතා, දස පරමත්ථ පාරමිතා පූර්ණ කරපු උත්තමයන් පිරිසක්. පාරමිතා පුරන කාලය තුළ අනන්ත අප්‍රමාණ දුක් විඳල තියෙනවා. සතර පද ගාථාවක් අහල නිවන් දකින්න පුළුවන්කම තියෙද්දි ඒ අවස්ථාව අත හැරල, ලෝක සත්වයා වෙනුවෙන් අපරිමිත මහා දයා කරුණා මුදු ගුණයෙන් පාරමිතා වැඩූ පිරිසක්. ගෞතම බුදු පියාණන් වහන්සේ පාරමිතා පුරන බෝසත් සමයේ විසි අවුරුද්දක් රජකම් කරන්න ලැබුණා. මේ විදියට රජකම් කරන්න ගිහින් සිදු වෙච්ච පාප කර්ම හේතුවෙන් අවුරුදු අසූ දහසක් අපා දුක් විඳින්න සිද්ධ වූ බවත් ධර්මයේ සඳහන් වෙනවා. (තේමිය ජාතකය) ඒ දුක් විඳින්න සිද්ධ වුණේ නිවන් දකින්න තිබුණු අවස්ථාවත් අත හැරල, ලෝක සත්වයා කෙරෙහි සෙත සැලසීමේ මහා කරුණාවෙන් බුදු බව පැතූ නිසා. බෝසතාණන් වහන්සේ කියන්නෙ සියලු රජ ඉසුරු හැර දමා, තාපස ප්‍රව්‍රජාවෙන් පැවිදි වෙලා, එකල ප්‍රසිද්ධ ආධ්‍යාත්මික ගුරුවරුන් ඇසුරේ හය අවුරුද්දක් මහා දුෂ්කර ක්‍රියා කරල, ඒ දුෂ්කර ක්‍රියාවලින් සත්‍යාවබෝධය නොලැබුණ නිසා, තමාම මධ්‍යම ප්‍රතිපදාවට පැමිණිලා, දස මාර සෙන් පරදා උතුම් සිවු අරිසස් අවබෝධ කළ මහා වීරයන් වහන්සේ. මේ විදියට බුදු ගුණ කියල නිම කරන්න බෑ. ඒ නිසා බුදුන් වහන්සේම බුදු ගුණ නවයකින් අනන්ත බුදු ගුණ කැටි කරල, ඉතිපි සෝ භගවා, අරහං... ආදී වශයෙන් දේශනා කළා. මේ එක එක ගුණයක් අනන්තයි.

ඒ වගේම තමයි ලෝකය ගොඩනැගිල, පැවතිලා, විනාශ වෙලා යළිත් හට ගන්නා තුරු ගතවන අති දීඝ කාලයට කියන්නෙ මහා කල්පයක් කියල. මේ මහා කල්පයෙන් 1/80 ක් හෙවත් අන්තඃ කල්පයක් කියන දීර්ඝ කාලය උපමාවකින් දේශනා කරල තියෙනවා. යොදුනක් උස, යොදුනක් දිග, යොදුනක් පළල භාජනයකට අබ පිරෙව්වොත්, ඒ අබ ඇට අවුරුදු සියයකට එක බැගින් ඉවත් කරන්න ගත වෙන කාලයටත් වඩා අන්තඃකල්පය කියන්නෙ දිගු කාලයක්. මෙබඳු කල්පයන්ගෙන් සැදුම්ලත් මහා කල්ප 91 කට එහා අතීතයේ තමයි සත් බුදුවරයන් වහන්සේලා අතරින් පළමු බුදුන් වූ විපස්සී බුදුන් වහන්සේ මේ ලෝකෙට පහළ වුණේ.

ඒ වගේම බුදු කෙනෙක් පහළ නොවන කල්ප තියෙනවා. මේ බුද්ධ ශාසනයක් පවතින කාලෙත් ඒ බණ නොපිළිපදින පිරිස තමයි වැඩියෙන් ඉන්නෙ. මේ අති දුර්ලභ ශ්‍රී සද්ධර්මය අහන්න නැති කාලවල ඉපදෙන පිරිස, තමන් කැමති පස්කම් සුව විඳින්න බාධා වන ඕනෑම දෙයක් හොඳින් බැරිනම් නරකින් හරි ජයගෙන, තමන්ගෙ මනාපය ඉෂ්ඨ කරගන්න අනෙක් සතුන් මරනවා, හිංසා කරනවා, නොයෙක් දුෂ්චරිතකම් කරනවා. ඊළඟට ඒවායේ විපාක හැටියට අනන්ත අප්‍රමාණ දුක් විඳිනවා, අපාගත වෙනවා. ඒව ඒ විදියට සිද්ධ වෙන ☞

බව කියා දෙන්න කෙනෙක් නෑ. මේ විදියට බුදු කෙනෙක් ලෝකෙට පහළ වෙලා හේතු ඵල දහම, අරි අටඟි මග දේශනා කරල අවුරුදු දහසක්, අවුරුදු පන්දහසක් වගේ ඒ ඒ කාලවල මිනිස් ආයුෂත්, බුද්ධ අධිෂ්ඨානයත් අනුව කෙටි කාලයක් තමයි ඒ ධර්මය විද්‍යමානව පවතින්නෙ. ඉතින් **ශාසනයක් පවතින කාලය, නොපවතින කාලයත් එක්ක බලද්දි ක්ෂණයක්. මේ වගේ කෙටි කාලයක් පවතින ඒ ධර්මය තේරුම් ගන්න පුළුවන් බුද්ධියක් ඇති මනුස්සයෙක් වෙලා, ඒ ධර්මය දේශනා කරන සිවුවනක් පිරිස අතරේ උපදින එක ඉතාම දුර්ලභ සම්පත්තියක්.** ඒ වගේ දුර්ලභ ධර්මයේ ගුණ අනන්තයි. මේ අනන්ත වූ දහම් ගුණ කැටි කරල ගුණ හයකින් දේශනා කරල තියෙනවා. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ... ආදී වශයෙන් කියවෙන මේ එක එක ගුණයක් අනන්තයි.

ඊළඟට මේ ශ්‍රී සද්ධර්මය දේශනා කරන, පවත්වාගෙන යන අෂ්ඨ ආර්ය පුද්ගල මහා සංඝ පරම්පරාවක්, ඒ උතුම් බුදුපියාණන් වහන්සේලා විසින් මේ ලෝකයේ පිහිටුවනවා. ඒ මහා සංඝ රත්නය තුළින් තමයි මේ දහම් අපට ලැබෙන්නෙ. ඒ ආර්ය මහා සංඝ රත්නය කෙරෙහි තමා තුළ නොසැළෙන මහා ගෞරවයක් තියෙනවා. අල්පේච්ඡ ජීවිතයක් ගත කරන උන් වහන්සේලා තම මිනිස් දිවියෙන් ගත යුතු ප්‍රයෝජනය නිසි සේ ලබාගෙන, අපටත් ඒ මග කියා දෙනවා. ඒ වගේම උන් වහන්සේලා තුළ ලෝකයට බැඳෙන ගති නැති නිසා, පැහැදුන සිතින් අපි යමක් පූජා කළොත් මහා පින් කුසල් පිරෙනවා. ඒ නිසා ඒ මහා සංඝ රත්නයට අනුත්තර පුණ්‍ය ක්ෂේත්‍රයක් කියල කියනවා. මේ විදියට සංඝ රත්නයේ ගුණ අනන්තයි. ඒ ගුණ කැටි කරල ගුණ නවයක් දේශනා කරල තියෙනවා. සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ.... ආදී වශයෙන් කියවෙන මේ එක එක ගුණයක් අනන්තයි.

සුචරිතය සුවඳයි. දුසිරිත දුගඳයි. මේ ධර්මය අවබෝධ කරගත් මම කයින්, වචනයෙන් කරන දුසිරිත් වැඩ අත් හරිනවා. කලණ මිතුරන් ඇසුර, දන් දීම, පින් දීම, පින් අනුමෝදන් කිරීම වගේ සුචරිත වැඩ කරනවා. දැල්වෙන මුවින් අවබෝධ කරගත් දහම අන් අයටත් කියා දෙනවා. මම නිතර සජ්ජායනා කරන්නෙ තෙරුවන් ගුණ. මේ විදියට කලණ මිතුරන් ඇසුරු කරමින් දහම තුළ ජීවත් වෙන මගේ ජීවිතය සැහැල්ලුයි. මනස ප්‍රබෝධමත්. හඳුන්කූරෙ මුදුන බබලනව වගේ, මගේ මුදුන් මල් කඩක් වූ සුචරිත ගුණය බබලනවා.

**හඳුන් කූර වටේ සුවඳ දුමක් පැතිරෙනවා. මගේ වට කෙරෙන සුවඳ දුම මොකක් ද?**

ගැවුන තැන අන්ධ වෙනව නම් ඒ ගති ලක්ෂණයට ගන්ධ කියනවා. පස්කම් සුව ගැවුණොත් අන්ධයි. යථාර්ථය පේන්නෙ නෑ. හොඳ නරක වැටහෙන්නෙ නෑ. ගැවුන තැන අන්ධ වීම සුන් කරන්නේ සුගන්ධය. හඳුන් කූරෙ සුවඳ, හරි හොඳ මිහිරි සුවඳක් කියල ගත්තොත් ඒක ගන්ධයි. හඳුන් කූරෙ ඍජු ගුණය වගේ, කය වචනය වංක වැඩවලින් වෙන් වෙලා, ලෝකය අනිච්ච, දුක්ඛ, අනත්ත බව වටහා ගත් මම, පස්කම් සුව කෙරෙහි රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් බැඳෙන්නෙ නෑ. මේ වැඩ පිළිවෙල ගැවුන තැන අන්ධ වන ගතිය සුන් කරනවා. මෙන්න මේ කය, වචනය සංවර කර ගත් සීල සුගන්ධය මා වටා පැතිරෙනවා.

**මේ හඳුන් කූර දැවෙන කොට අළු වෙවී වැටෙනවා. මා තුළ අළු වෙවී වැටෙන්නෙ මොනවද?**

මේ කය, වචනය සංවර කර ගන්න වැඩ පිළිවෙල කරගෙන යන මට දැන් වැටහෙනවා, ඉස්සර වෙහෙස වෙලා, පොර බදල මගේ කරගත්ත මම කැමති වස්තු, මට ආස්වාදයට වඩා දුන්නෙ දුක් කරදර, සිත් වේදනා, ලෙඩ දුක්, නඩු හබ වගේ කරදර ලෝකයක් කියල. ඒ ජීවිතයට වඩා මේ ධර්මය ඇසුරෙ ගත කරන ජීවිතය සැහැල්ලුයි. ඒ දහම් ඇසුර ගතේ සිතේ වේදනා සමනය කරනවා. ප්‍රබෝධ ජනකයි. ඒ නිසා මගේ ලෝභ ගති, තරහ ගති, මෝඩ හිස් වැඩ කරන ගති ටිකින් ටික අඩු වෙලා, පොරකාල වද විඳල අයිති කර ගත්ත දේවල් විපරිනාමයට පත් වෙවී වැනසිලා යන හැටි දකින මා තුළ අවිද්‍යාව දුරු වෙවී විද්‍යාව පහළ වෙනවා. තණ්හාව දුරු වෙවී, අත් හැරීමේ, නොඇල්මේ, මිදීමේ ශාන්තිය මට වැටහෙනවා. හඳුන්කූර අළු වෙවී වැටෙනවා වගේ, මා තුළ තිබූ අවිද්‍යාවත්, තණ්හාවත් අළු වෙවී යනවා.

**මේ හඳුන්කූර අළු වෙවී වැටෙන කොට කෙටි වෙනවා. මගේ කෙටි වෙන දහම මොකක් ද?**

අවිද්‍යාවත්, තණ්හාවත් අළු වෙවී වැටෙන කොට, මේ ලෝකෙ කාම වස්තුවලට තිබුන ඇලීම දුරු වෙලා, අනුන්ට නොවේවා, මටම වේවා කියන දැඩි ලෝභය දුරු වෙලා යනවා. මේ සසර ගමන ආස්වාදජනක වටිනා එකක් කියල ඉස්සර හිතුවෙ හේතු ඵල දහම නොදැක්ක නිසා. දැන් ඒ ආස්වාද මායාවට රැවටෙන්නෙ නෑ. සසර ගමන කියන්නෙ භයානක දුක් උපදවන දෙයක් කියල වැටහෙනවා. මිත්‍යා දෘෂ්ටිය දැන් දුරු වෙලා. අනුන්ගෙ සැපතෙහි ඊර්ෂ්‍යාව, ගුණමකු බව, මානය, උඩඟු බව ආදී මින් පෙර අකුසල් හැටියට නොපෙනුන, නමුත් මහා භයානක දුකට පත් කරන අකුසල ව්‍යාපාදයන්ගෙන් මම දැන් මිදිල. මේ සසර ගමන හොඳයි කියල මෙතෙක් කල් කරගෙන ගිය වැඩපිළිවෙල අත හැරුන නම්, ඒ සසර ගමන කෙටි වෙන බව මට දැන් අත් දැකීමෙන්ම වැටහෙනවා. හඳුන්කූර කෙටි වෙනව වගේ මගේ සසර ගමන කෙටි වෙනවා.

**මේ විදියට හඳුන්කූර දැවිල අවසාන වුණාම අන්තිම ගිනි පුළිඟුවත් නිවිල යනවා. ඉතුරු වෙන්නෙ අළු ගොඩක් විතරයි. මගේ නිවෙන අන්තිම ගිනි පුළිඟුව මොකක් ද? අළු ගොඩ මොනව ද?**

රාග ගිනි, ද්වේශ ගිනි, මෝහ ගිනි තමයි ටික ටික නිවි නිවී ආවෙ. මේ ගිනි සහමුලටම නිවිල ගිය දාට, අන්තිම ගිනි පුළිඟුවත් නිවුන කියන්න පුළුවන්. ''මම'' කිව්ව ''මගෙ'' කිව්ව සියලු තැන්හි හා වීමක්, බැඳීමක් තිබුණ නම් මේ ගින්න සහමුලට නිවෙන කොට, ඒ තණ්හා සියල්ල බිඳී යන බව මම දැන් අත් දැකීමෙන්ම දන්නවා. රාග, ද්වේශ, මෝහ සංඥා මාත්‍රයක්වත් නැති තැන අභිසංඛාර, විඤ්ඤාණ ගොඩ නැගෙන්නෙ නෑ. මේ භව ගමනින් මම සදහටම මිදෙනව කියල මට වැටහෙනවා. මේ කය ගොඩ නැගුන යම් කර්ම ශක්තියක් තියෙනවා. ඒ ශක්තිය ගෙවී අවසන් වෙන තුරු මේ කය පවතීවි. හඳුන් කූර දැවිල වැටුන අළුවලින් යළි හඳුන් කූරක් ගොඩ නොනැගෙනව වගේ, අවිද්‍යා තණ්හා සහමුලින්ම බිඳිල ගියාම යළි කයක් ගොඩ නගන වැඩ පිළිවෙලක් ගොඩ නැගෙන්නෙ නෑ.

මනසින් මේ විදියට හඳුන්කූර සමග උපමා කරගෙන අපි තුළ ගොඩ නගා ගත් සිත, කය, වචනය සංවර කරගත් සුගන්ධය, අනන්ත ගුණ සුගන්ධයෙන් යුත් බුදු පියාණන් වහන්සේ පා මුල පූජා කරමි කියල, ගාථාවෙන් අර්ථවත් වෙන නිවන් දකින හඳුන්කූරු පූජාවක් කරන්න පුළුවන්. මේ තමයි අතීත බොදු පිරිස අතරෙ තිබුණ හඳුන්කූරු පූජා කළ නිවැරදි අර්ථවත් පිළිවෙත. වැඩි වියදමක් නැතිව ඥාන සම්ප්‍රයුක්තව හඳුන්කූරු පූජා කරලත් නිවන් දකින්න මේ ක්‍රමයට පුළුවන්.

***වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :***

**ඩබ්. ඒ. තිළිණවතී**
**(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී )**
**කඩවත**

# අටපිරිකර පූජාවක වටිනාකම...

අටපිරිකර පූජාව කියන්නෙ බොහොම මහත්ඵල මහානිසංස තියෙන, ඉතාමත් ගෞරවාන්විත විදියට අතීතයේ පටන් මේ දක්වාම කරගෙන එන උත්තම පූජාවක්. ඒ වගේම අට මහා කුසලයට උපනිශ්‍රය වන ඉතාම වටිනා පූජාවක්. මේ පූජාව පැහැදුණු සිතින් සිදුකිරීම නිසා මහත් පුණ්‍ය සම්පත් ලැබෙන බවත්, සසර කතරෙන් එතෙර වන මොහොතේ දී පවා ඒ ආනිසංස බලයෙන්, බුදුපියාණන් වහන්සේ නමක් හමුවේදී ඒහි භික්ෂු මහණ උපසම්පදාව හිමිවන බවත් ධර්මයේ සඳහන් වෙනවා. (මහණ මෙහි එව කියල, බුදුපියාණන් වහන්සේ ආමන්ත්‍රණය කරන කොට, 60 වස් පිරුණු මහ තෙර නමක් වගේ අටපිරිකරෙන් සම්පූර්ණ වෙලා, බුදුපියාණන් වහන්සේ ළඟට ඒම තමයි ඒහි භික්ෂු මහණ උපසම්පදාව කියන්නෙ. ඒ අවස්ථාවේදී ඒ පුද්ගලයා මොන ඇඳුමින් හිටියත්, සසර කරපු පෙර පින ඇදිල ඇවිත් ඒ පුණ්‍ය මහිමයත්, බුදුන් වහන්සේගේ අධිෂ්ඨාන බලයත් නිසා මේ තත්ත්වය ලැබෙනවා.)

ඒ වගේම රට පුරා පැවැත්වෙන ඕනෑම ධර්ම දේශනාවක් අවසානයේදීත්, ඓතිහාසික පූජනීය ස්ථාන වන්දනා කිරීමේදීත් අටපිරිකර පූජා කිරීම මෙරට බෞද්ධ ජනතාවගේ උසස් චාරිත්‍රයක් බවට පත් වෙලා තියෙනවා. මෙරට බෞද්ධ ජනතාවගේ බුදුන්, දහම්, සඟුන් කෙරෙහි පැහැදුණු බව ඉස්මතු වෙන මහඟු අවස්ථාවක් ලෙස මේ අවස්ථාව පෙන්වා දෙන්න පුළුවන්.

**අටපිරිකර කියන වචනයේ නියම අර්ථය වෙන්නෙ, අංග අටකින් පූර්ණ වන්නා වූ කටයුතු කියන එක.** මෙතනදී භික්ෂූන් වහන්සේ නමක් ළඟ තිබිය යුතු පරමාර්ථ අටපිරිකරක් තියෙනවා. ඒ කියන්නෙ උන් වහන්සේලා විසින් සිදු කරන කටයුතු අංග අටකින් සමන්විත විය යුතුයි. ඒ තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය. නමුත් පොත්පත්වල නම් මේ කාරණය හරිහැටි පෙන්වල නෑ. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන අංග අටකින් පූර්ණ වූ අයෙක් බවට පත් වුණා නම් ඒ තමයි ශාසනයේ නියම අටපිරිකර. ඒකට අභ්‍යන්තර අටපිරිකර කියල කියන්නත් පුළුවන්. මීට අමතරව මේ පූජාවට ලක්වන අටපිරිකර තුළ අන්තර්ගත වන අයිතම අටක් තියෙනවා. තනිපට සිවුර, දෙපට සිවුර, අඳනය, පාත්‍රය, දැලිපිහිය, ඉඳිකටුව - නූල්, බඳ පටිය සහ පෙරහන ඊට ඇතුළත් වෙනවා. තනිපට සිවුර, දෙපට සිවුර, අඳනය යන අංග තුනට පොදුවේ තුන් සිවුරු කියලත් කියනවා. මේ සියලු අංගවලට බාහිර අටපිරිකර කියල කියනවා.



ඒ වගේම මෙතනදී මේ අටෙන් කියවෙන නිරුක්තියක් තියෙනවා. **සිවුර කියන්නෙ සුවයි සුවයි කියල ගන්න කාම සුවය වරණවා, ඉවත් කරනවා කියන එක. ඒ වගේම සිවු + උර හෙවත් චතුරාර්ය සත්‍යයට උර දෙන අදහසිනුත් සිවුර කියල කියනවා.** චතුරාර්ය සත්‍යයට උර දීමෙන් කරන්නෙත් ඒ කටයුත්තම තමයි. නිරුක්තිය මොන විදියට කිව්වත් අදහස එකයි, ගැලපිලා තියෙනවා. ඒ වගේම චීවර කියන වචනයෙන් පෙන්වන්නෙත් ඒ වගේම අදහසක්. අපි ''චී'' කියල කියන්නෙ යම්කිසි ඉවත් කළ යුතු අපද්‍රව්‍යවලට. ඒ වගේ දෙයක් දක්කම චීයිය කියලත් කියනවා. **ඒ චී කියන දේවල් වර කරනවා, ඉවත් කරනවා කියන එක තමයි චීවර කියන්නෙ.** ඉතින් මෙතනදී පංච කාම සුවය කියන්නෙත් ඉවත් කළ යුතු දෙයක්. මොකද ඒකට ඇලුනම නිවනක් නෑ. ඒ නිසා චී කියන එකට ඒකත් අයිති වෙනවා. පට කියන්නෙ බැඳීම. තනිපට කියන්නෙ මමත්වයට බැඳීම. තනිපට සිවුරෙන් හෙවත් තනිපට චීවරයෙන් පෙන්වන්නෙ, තමන් පුද්ගලිකව ඇස, කන, දිව, නාසය, ශරීරය කියන මේවාට ඡන්දරාගයෙන් හෙවත් මමත්වයෙන් බැඳී සිටීම වර කරල, ඉවත් කරල දානවා කියන එක. දෙපට වෙනකොට මගෙ කියල බාහිර දේවල් සමගත් බැඳෙනවා. ඒ සඳහා දෙවැන්නෙක් එකතු කර ගන්නවා, දෙවැන්නෙක් එක්ක බැඳෙනවා කියන එක. දෙපට සිවුරෙන් හෙවත් දෙපට චීවරයෙන් පෙන්වන්නෙ, මම සහ මගෙ කියන දෙකටම තියෙන බැඳීම හෙවත් ඡන්දරාගය ඉවත් කිරීම. ඒ දෙකම ඉවත් කරන නිසා දෙපට සිවුර කියල කියනවා. ඒ දෙකම චී කියල ඉවත් කරනවා.

ඊළඟට **අඳනය කියල කියන්නෙ අඳ බවට පත් වෙන න්‍යාය නසනවා, එහෙම නැත්නම් ඒ න්‍යායෙන් නිදහස් වෙනවා කියන එක.** ඒ කියන්නෙ කාමයන්ගෙන් අන්ධ වෙලා යන ලක්ෂණය නසන්න, ඉවත් කරන්න ඕන.

**පහ + අත්තර - පාත්තර - අත්බැව තර කරගන්න ලක්ෂණ පහ කරනවා.** ඒ කියන්නෙ පැවැත්ම තවදුරටත් ගෙනියන්නෙ නැතිව පහ කර දමනවා. ලොකුවට උස් මහත් වෙලා වැඩෙන්න, පෝෂණය කරන්න ගන්න ඒවා පහ කරනවා. මොකද පාත්‍රයට ගන්නෙ, බඩගිනි ක්ලාන්ත කැරකිලි ආදිය දුරු කර ගෙන, කය පවත්ව ගන්න පුළුවන් ප්‍රමාණයට අවශ්‍ය කරන ආහාර ටිකක් පමණයි. අසීමිතව කය හැඩ වැඩ වෙන්න, බඩ පුරවගන්න ආහාර ගන්න සිරිතක් පාත්‍රය පරිහරණය කරන භික්ෂූන් වහන්සේලාට නෑ. ඒ අදහස තමයි මේකෙන් කියවෙන්නෙ. නමුත් සාමාන්‍ය මිනිස්සු පරිහරණය කරන පිඟාන එහෙම නෙවෙයි. **පි + අංග + ආන කියන්නෙ, පානය කිරීමේ අංග හෙවත් පිනවන දේවල් ගන්නවා කියන එක.** ඒ කියන්නෙ කාම පානය සඳහා අවශ්‍ය කරන අංගයන් එකතු කර ගන්නවා. ඒ නිසා මේ වචන දෙකෙන් කියවෙන අර්ථවල වෙනසක් තියෙනවා. ඒ තමයි පරමාර්ථ වශයෙන් තියෙන වෙනස.

☞

ඒ වගේම වළඳනවා කියන වචනය ගත්තොත්, කැළෑ අකුල් වගේ දේවල්වලට වළ කියල කියනවා. අඳ කියන්නෙ ඒවායින් අන්ධ වෙනවා කියන එක. න යන්නෙන් පෙන්වන්නෙ නසනවා කියන එක. **වළ + අඳ + න - වළ අඳ නසනවා හෙවත් හිතේ තියෙන කැළෑ ගති ස්වභාවය ඉවත් කරනවා.** ඒ තමයි භික්ෂූන් වහන්සේලාගේ ස්වභාවය. සාමාන්‍ය අය කරන්නෙ කන එක. ක - කාමය, කිළිටි, කහට ස්වභාවය පෙන්වනවා. ඒ කියන්නෙ ආස්වාදය හට ගන්න දේවල්. න - න්‍යාය. ඒ කියන්නෙ **කාම ආස්වාදය හට ගන්න න්‍යාය තමයි කනවා කියන එකෙන් පෙන්වන්නෙ.**

ඊළඟට දලි පිහිය කියල අපි අද කිව්වට ඒකෙ නියම සිංහල වචනය තමයි **කරකැත්ත** කියන්නෙ. විවිධාකාර කැපුම් කෙටුම් කටයුතු සඳහා ගන්න උපකරණය. ඒ කියන්නෙ ගහ මරා ගන්න, කපා කොටා ගන්න නෙවෙයි. හිස කෙස්, රැවුල් ආදිය වැවිල තිබුණොත් ඒකත් කෙලෙස් හටගන්න උපනිශ්‍රයක් වෙන නිසා, දහම් මාර්ගය වැඩීමට කායික අපහසුතාවයන් ඇති වන නිසා, හිස කෙස් රැවුල් ආදිය බාගෙන ඉවත් කරන එක තමයි මේකෙන් කරන්නෙ. ඒ කියන්නෙ කෙලෙස් බිඳහැරීමේ ගමනට පහසුවක් වෙන්න තමයි මේක පාවිච්චි කරන්නෙ. පරමාර්ථ වශයෙන් ඒ සඳහා **විවිධාකාර කටයුතු කපා හරිනවා** කියන එක තමයි අර්ථවත් වෙන්නෙ.

ඊළඟට ඉඳිකටුව සහ නූල් කියන්නෙ එක අංගයක්. **ඉඳිකටුවෙන් පෙන්වන්නෙ සූක්ෂම වන්නා වූ ස්ථාන දකින්න පුළුවන් නුවණ. නූල කියන්නෙ එකින් එක අමුණ ගන්නවා කියන එක.** ඒ කියන්නෙ යථාර්ථවත්ව, එකින් එක නුවණින් නුවණට යනවා කියන අර්ථය. ඒ නිසා මේ දෙකම එකට ගැනෙන්නෙ.

ඊළඟට බඳ පටිය ගත්තොත් ඒකට පට්ටිකා කියල තමයි ඉස්සර කිව්වෙ. පටි කියන්නෙ ලෝකයට බැඳෙන දස සංයෝජන ධර්ම. **පට්ටිකා** කියන වචනයෙන් පෙන්වන්නෙ ඒ **බැඳීම කා දමනවා, විනාස කර දමනවා** කියන අර්ථය.

**පෙරහන කියන්නෙ, යම්කිසි විනාසය කරා ගෙනියන විස පෙරල ඉවත් කරල හරය විතරක් ගන්නවා කියන එක.** ඒ කියන්නෙ දුක් කරදර දෙන ඒව පෙරල ඉවත් කරනවා.

මේ විදියට මේ බාහිර අට පිරිකරෙන් පෙන්වන අංග අටෙන් සංකේතවත් කරන්නෙ ඡන්දරාගයෙන් අල්ල ගන්න දෙයක් නෙවෙයි, අත් හැරීමක්. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් සිද්ධ වෙන්නෙත් ඡන්දරාගය අත් හැරීම. ඒ අත් හැරීමේ ප්‍රතිඵලය තමයි නිවන.

නමුත් මේ බාහිර අට පිරිකරට වඩා වැදගත් වෙන්නෙ ඉහතින් සඳහන් කරපු අභ්‍යන්තර අටපිරිකර. අභ්‍යන්තර අටපිරිකර වඩපු, පළමු මාර්ග ඵලය වන සෝවාන් ඵලය ලබපු කෙනෙක් කිසිම දිනක අපාගත වෙන්නෙ නෑ. සෝවාන් පුද්ගලයට පරමාර්ථ අටපිරිකරක් තියෙනවා. ඒ කියන්නෙ සිවුරු, අඳන... ආදිය නෙවෙයි. ඉහත පෙන්වපු මාර්ග අංග අට තුළින් ලබන්නා වූ, ඒ මාර්ග අංග අටට එක චිත්තයක එතුණු මොහොතක පහළ වුණු සෝවාන් ඵලය. ඒ විදියට පහළ වෙච්ච අටපිරිකර කාටවත් නැති කරන්න බෑ. ඒ ඵලය ලබපු කෙනා, ආර්ය මාර්ගයේ ගමන් කරන එක නවත්වන්න කිසිවෙකුටත් බෑ. ඒ වගේම ඒ පුද්ගලයා කිසිම අත්භවයක යළි සතර අපාගත තත්වයට පත් නොවන බව සහ ප්‍රමාද වෙලා හෝ අරිහත්වය දක්වාම ක්‍රමයෙන් වැඩෙන බව බුදුන් වහන්සේ පෙන්වා තියෙනවා. මේක කාගෙන්වත් ලබා ගන්න අටපිරිකරක් නෙවෙයි. බණ දහම් අහල, බුදුන් දහම් සඟුන් කෙරෙහි පැහැදිලා, ධර්මය අවබෝධ කරගැනීම තුළින් ලබන අටපිරිකරක්. මේ තරම් වටිනා අටපිරිකරක් වෙන තියෙන්න විදියක් නෑ.

ලෝක සම්මතයේ භික්ෂූන් වහන්සේලාට උපසම්පදා සීලයත් එක්ක ලැබෙන භෞතික වූ බාහිර අටපිරිකරක් තියෙනවා. නමුත් ඒක දැන ගත්තට උන්වහන්සේලා චරිතයෙන් දූෂ්‍ය වුනොත් අපාගත වීමට පවා ඉඩ ප්‍රස්ථාව තියෙනවා. හරියටම රැක ගෙන හිටියොත් දෙව්ලොවට ඉනිමගක් වගේ කියල කියනවා. ඒක වෙනම කාරණයක්. අංග අටකින් පූර්ණ වෙන කටයුතු විදියට තියෙන, අභ්‍යන්තර අටපිරිකර කියන දේ වෙනම කාරණයක්. දහම් දැකීමේ දර්ශන ඥානය තුළින් සෝවාන් ඵලයත් සමගම අටපිරිකරක් යමෙකුට ලැබෙනවා. ඒක සම්පූර්ණයෙන්ම පූර්ණ භාවයට පත් වෙන්නෙ අරිහත් ඵලයේදී. **අටපිරිකරක් (බාහිර අටපිරිකරක්) පූජා කරල අපි බලාපොරොත්තු වෙන්න ඕන, අරි අටඟි මග යන උතුමන්ට අවශ්‍ය කරන්නා වූ බාහිර පහසුකම් සලසල දීල, අපිටත් අරි අටඟි මග පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හේතු වාසනා පහළ කර ගැනීම තමයි.** මෙහෙම පූජා කරන අටපිරිකර පූජාව මහත්ඵලයි මහානිසංසයි. මහත්ඵල කිව්වෙ චෛත්‍ය, වෙහෙර විහාර සෑදීම, බණ පොත් ලිවීම, බුදු පිළිම නෙළීම ...... ආදී වශයෙන් ආචාර්යවාදයක් ලෙස සම්මත කරල තියෙන අට මහා කුසල් නෙවෙයි. ලෝකෙ මහත්ඵල හතරයි තියෙන්නෙ. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අරිහත් කියන්නෙ ඒ මහත්ඵල හතර.

ඒ වගේම තමයි **ආනිසංස කියන වචනය හැදිල තියෙන්නෙ ආනිස + අංස යන වචන සන්ධි වෙලා. ආනිස කියන්නෙ ඇසුරු කරන්නෙ නැති බව. ආනිසංස කියන්නෙ ආනිස වූ අංසයට හෙවත් ඇසුරු නොකළ යුතු අංසයට පත්වීම.** ඇසුරු නොකළ යුතු අංසය තමයි පාප අංසය. නමුත් සිවු පසය ඇසුරු කළ යුතුයි. එතකොට එක අංසයක් වැහිල. **වහ + අංස තමයි වහන්ස කිව්වෙ.** ඒ කයේ අංසය නෙවෙයි. කයේ අංසයකුත් සිවුරෙන් වැහිල තමයි තියෙන්නෙ. ඒක සංකේතය. නමුත් මෙතනදි **පරමාර්ථ වශයෙන් ඇසුරු නොකළ යුතු පාප අංසය තමයි වහගන්න ඕන.** ඒක වහගන්නෙ නැතිව සිවුරෙන් විතරක් වහ ගත්තට හරි යන්නෙ නෑ. **පාප අංසය වැහුවම තමයි නියම වහන්සේ කෙනෙක් වෙන්නෙ.** ඒක ලෝකයාට දැන ගන්න තමයි අර සංකේතය තියෙන්නෙ.

මෙතනදී සිවුරෙන් වහන්නෙ වම් පැත්ත. දකුණු පැත්ත ඇරල තියනවා. ව + අම - වම - ලෝකය අමෘතයක් කියල ගත් සුබෝපභෝගී දේවල් වහනවයි කියන එක තමයි සිවුරෙන් වම් පස වැහීමෙන් අදහස් කරන්නෙ. ද + කුණු - දකුණු - කුණු හෙවත් ක්ලේෂයන් ඉවත් කරල දාන අදහස සංකේතවත් කරන්න තමයි දකුණු පැත්ත විවෘත කරල තියෙන්නෙ. පාප ඇසුරෙන් ඉවත් වෙලා, හොඳ අයත් එක්ක ජීවත් වෙන්න ලැබෙන එක ආනිසංසයක්. සාපේක්ෂව දුක් කරදරවලින් අඩු ජීවිතයක් ගත කරන්න ලැබීම ආනිසංසයක්. ලෝකයත් එක්ක තිබිච්ච යම් බැඳීමක්, යම් ආකාරයකට අත්හැරී ගියා නම්, නැවත හට ගැනීමක් වෙන්නෙ නෑ. ඒක මහානිසංසයක් බවට පත්වෙනවා. මාර්ග ඵලලාභී උත්තමයන්ගෙන් ලෝකය පිළිබඳ යම් අත් හැරීමක්, මිදීමක්, නොඇල්මක් වුණා නම්, ඒ සම්බන්ධයෙන් යම්කිසි ඡන්ද රාගයක් නැවත හට ගන්නෙ නෑ, ඒ කියන්නෙ ඒ ඇසුරෙන් තොර වුණා කියන එක. ඒක මහානිසංසයක්. එහෙනම් යම් කිසි පිනකින් නිවන් දැකීමට හේතු කාරක වන්නා වූ මාර්ගය වැඩිල, නිවන් ලබන්න යම් හේතු වාසනා ලැබෙනව නම්, ඒක මහත්ඵලයි මහානිසංසයි.

දැන් කෙනෙකුට මෙහෙම දෙයක් හිතෙන්න පුළුවන්. "මම පූජා කරපු අටපිරිකර පූජාව ඒ ස්වාමීන් වහන්සේ පරිභෝජනයට ගන්නෙ නැත්නම්, ☞

එහෙම නැත්නම් ඒ අටපිරිකර පූජාව ඒ ස්වාමීන් වහන්සේ විසින් තවත් ස්වාමීන් වහන්සේ නමකට හෝ පන්සලකට හෝ පූජා කළා නම්, ඒ පූජා කරපු පිරිකරෙන් මට පිං ලැබිල නැහැනෙ, මම පූජා කරපු ඒ අටපිරිකර, ඒ ස්වාමීන් වහන්සේට පරිභෝජනය කරන්න බැරි ඇයි?" මෙහෙම හිතේ යම් ආන්දෝලනයක් ඇති වෙන්න පුළුවන්.

තමන් විසින් පූජා කරන ලද අටපිරිකරක් පිළිබඳව මෙහෙම හිත හිතා කල් ගෙවනව නම්, ඒ පූජා කරපු අටපිරිකර පූජාව හරියට සිද්ධ වෙලාද කියල තමන් තමන්ගෙන්ම අහන්න ඕන. එහෙම හිතනව නම්, ඒ පූජාව සිද්ධ වෙලා තියෙන්නෙ බාගෙට. මොකද **පූජා කරපු දෙයක් නම් ඒ පිළිබඳව යළි හිතක් තියෙන්න බෑ. එහෙනම් ඒක හරියට පූජා වෙලා නෑ.** තමන් විසින් පැහැදුණු පහන් සිතින් යමක් පූජා කළා නම්, ඒක ඒ අවස්ථාවේදීම පූජා වෙලා ඉවරයි. ඒක උන් වහන්සේ පරිභෝජනය කරන්නෙ නැත්තෙ ඇයි කියල සොයා බැලීම අදාළ දෙයක් නෙවෙයි. පූජාවෙන් පසු පරිභෝජනය කළා හෝ වෙන ස්වාමීන් වහන්සේ නමකට පූජා කළා හෝ ඉන් තමන්ට කිසිදු ආකාරයකට පිං අඩු වීමක් සිද්ධ වෙන්නෙ නෑ. ඒ නිසා අටපිරිකර හෝ වෙන කිසියම් පූජාවක් සිදු කරන විටකදී පැහැදුණු මනසින් බුදුන්, දහම්, සඟුන් කෙරෙහි පූජා කරමි, පූජාම වේවා... කියල පතල ඒ කටයුතු සිද්ධ කරන්න වග බලා ගන්න ඕන. යමක් පූජා කළාට පස්සෙ යම් හිමිකමක් ලැබුණද, ශාසනය උදෙසා නම් ඒක ශාසනික වස්තුවක් වෙනවා. ඉන්පසු ඒක පරිහරණය කිරීම හෝ නොකිරීම ශාසනය සතු කාර්යයක්.

යම් කිසි අටපිරිකර පූජාවක් හෝ වෙන යම් පූජාවක් හෝ සිදු කරන කොට පංච ඉන්ද්‍රිය සහිත මනසට ගෝචර වන, දැනෙන, පෙනෙන දේට පමණක් සීමා වෙලා, ඒ අනුව කටයුතු කරන්න සමහර උදවිය පුරුදු වෙලා ඉන්නවා. නමුත් අපිට නොපෙනෙන, නොදැනෙන වෙනම ලෝකයක් තියෙනවා. මේ ලෝකය තුළ අන්තරා පරිනිබ්බායී, උපහච්ච පරිනිබ්බායී වශයෙන් තියෙන, අනාගාමී තත්වයට පත්වෙලා අරිහත්වයට පත් නොවුණු, කාම රාග - රූප රාග - අරූප රාග යන සංයෝජන ධර්මත් ගෙවල, මාන උද්දච්ච අවිද්‍යා ශේෂ මාත්‍රයන් ගෙවල නැති, අතීතයේ පටන් හිටපු ස්වාමීන් වහන්සේලා ඒ ඒ ස්ථානවලින් අපවත් වුණාට පස්සෙ අන්තරාභව කියන අවස්ථාව තුළත්, ගන්ධබ්බ කායික අවස්ථාව තුළත් ඉන්නවා. ඇත්තටම උන් වහන්සේලාට ආහාර, වස්ත්‍ර (දාන) ලැබෙන්නෙ කොහොමද? **යම් දානයක් දෙන කොට බුදු, පසේ බුදු, මහ රහත් ආදී මහා සංඝ රත්නයට පූජා කරමි කියල කියන කොටම, ඒ ගන්ධබ්බ පිරිස් එතනට ඇවිත් මනෝමය වශයෙන් තම තමන්ගෙ පාත්‍රවලට පිරිල තියෙන ඒ දානය රැගෙන යනවා. මේ විදියට අති විශාල පිරිස් පැමිණෙන අවස්ථා තියෙනවා.** ඒක මස් ලේ ඇහැට පේන්නෙ නෑ. අටපිරිකරක් හෝ සෙසු පිරිකරක් පූජා කරන කොට, ඒ ගන්ධබ්බ තත්වයේ සිටින උන් වහන්සේලාටත් අඩු පාඩුවක් තිබුණොත්



ඒකත් පූර්ණ වෙලා පූජා වෙනවා. ඒ පූජාවත් සමග නිර්මිත අටපිරිකර අප්‍රමාණව විහිදිලා යනවා. මේ තමයි ගන්ධබ්බ ලෝක ස්වභාවය. නමුත් මේක ලෝකයා දන්නෙත් නෑ, දකින්නෙත් නෑ. මස් ලේ ඇහැට එක අටපිරිකරක් පෙනුනට, මේකට අත ගහන අයට කෝටි ගණනක් අටපිරිකර ඔවුන්ගෙ ලෝකවලට ගැලපෙන ආකාරයට නිර්මාණය වෙලා විහිදිලා, ඒ ඒ සුදුසු තැන්වලට යනවා. සූක්ෂම කායිකව අන්තරා පරිනිබ්බායී, උපහච්ච පරිනිබ්බායී වශයෙන් අන්තරාබවිකව සිටින උන්වහන්සේලා-ගෙන් සමහරෙක් අදත් ඒ තත්වයේ ඉන්නවා. නමුත් ඒක මස් ලේ ඇහැට පේන්නෙ නෑ. මේ කරන පිනෙන් දහස් ගණක් විහිදිලා, අඩු පාඩුවක් තිබුණොත් ඒකත් උන්වහන්සේලාට පූර්ණ වෙනවා. ඉතින් මෙහෙම දෙයක් ලෝකයේ තියෙන බව අපි නොදන්නවා වුනාට, මෙහෙම ක්‍රමවේදයක් තියෙන බව වටහා ගන්න ඕන.

ඊළඟට ගන්ධබ්බ ලෝකවල වැරහැලි, වස්ත්‍ර නැති අමනුස්සයොත් ඉන්නවා. අපි යම් අටපිරිකර පූජාවක් කරන කොට ඒකට අත ගහල, මේ පිරිකර පූජාව බුදුන් කෙරෙහි පූජා වේවා...! අනේ සාදු සාදු සාදු...! කියල පහන් සිතක් ඇති වෙලා පූජා කළොත්, ඒ පූජා කිරීමේදී අර අමනුස්සයොත් ඊට සම්බන්ධ වෙලා අනුමෝදන් වුණොත් **වැරහැලි, වස්ත්‍රවත් නැතුව හිටපු අයට දිව සළු මෙන් වස්ත්‍ර නිර්මාණය වෙලා ලැබෙනවා. සමහර අයට දිව්‍ය අංගෝපාංග සකස් වෙනවා.** මේ විදියට අත ගහල සාදුකාර දුන්න ගන්ධබ්බ ලෝකවල සිටින අනන්ත අමනුස්සයින්ට මේ වාසනාව ලැබෙනවා. ඒ නිසා **අටපිරිකරක් පූජා කිරීමේදී තමන්ට ඒකට වත්කමක් නැතත්, පැහැදුණු සිතින් ඒ චිත්තප්‍රසාදය ඇති කරගෙන, කවුරුහරි පූජ කරන ඒ අටපිරිකරට අත ගැහුවත් ආනිසංස ලැබෙනවා.**

අටුවා පොත්වල පෙන්වා තියෙන විදියට, අට මහ කුසල්වලින් අටපිරිකර පූජාව දෙවැනි වෙන්නෙ කඨින චීවර පූජාවට විතරයි. මීට අමතරව ආවාස ගෙයක් තනවා සඟ සතු කර පූජා කිරීම, බුද්ධ ශ්‍රාවක මහා සංඝ රත්නයට දන් දීම, බණ පොත් ලිවීම - ලියවීම - මුද්‍රණය කර බෙදා හැරීම, සඟ සතු කර කෙත් වතු පූජා කිරීම, බුදු පිළිම - චෛත්‍ය විහාර ගෙවල් ආදිය සෑදවීම, වැසිකිළි තනවා සඟ සතු කර පූජා කිරීම ආදියත් මේ අට මහා කුසලයන්ට අයිති වෙන බව පෙන්වා තියෙනවා. නමුත් මේක බුදු රජාණන් වහන්සේ දේශනා කරපු දෙයක් නෙවෙයි, පසුව විවිධ ආචාර්යවරුන් විසින් ඉදිරිපත් කළ දෙයක්. බුදුන් වහන්සේ වැඩ වසන කාලයේදී බුදු පිළිම නෙලුවෙත් නෑ, බණ පොත් ලිව්වෙත් නෑ. ඒ නිසා මේක බුදුන් වහන්සේ දේශනා නොකළ දෙයක් බව පැහැදිලි වෙනවා. නිවැරදි අට මහා කුසලය වෙන්න ඕන මේ දේවල් නෙවෙයි, ආර්ය අෂ්ටාංගික මාර්ගය. නමුත් දැනට මේ අටමහා කුසල් විදියට සම්මත වෙලා තියෙන දේවල් පිං අතේ වැඩ. ඒවා කළ යුතුයි. නමුත් කුසල් නෙවෙයි. මහ කුසල් කිව්වම හරිම බලවත්. පිං කටයුතුවලට පිං කියනවා මිසක් කුසල්

කියන්න බෑ. ඒ වගේම තමයි කුසල්වලට පිං කියන්නත් බෑ. (පිං හා කුසල් ගැන දැනගැනීමට, හෙළ බොදු පියුම 15 වැනි කලාපයේ 'කුසල් අකුසල් හඳුනා ගනිමු' යන ලිපියත්, 16 වැනි කලාපයේ 'පින් කිරීම නිවන් මගට බාධාවක්ද' යන ලිපියත් උපකාර කරගන්න පුළුවන්.)

ආර්ය අෂ්ටාංගික මාර්ගය නමැති මේ ලෝකෝත්තර ශ්‍රී සද්ධර්ම රත්නය මුල් කරගෙන, ඒ චිත්තප්‍රසාදයෙන් බුදු රජාණන් වහන්සේගේ ගුණයට උපහාර පූජාවක් විදියට යම් අටපිරිකරක් පූජා කරන කොට, ආර්ය අෂ්ටාංගික මාර්ගය නමැති අට මහා කුසලය ලෝකයට පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේට ගුණ උපහාර පූජාවක් වශයෙන් පූජා වෙනවා. **උපහාර පූජාව අසීමිතව පිං ලැබෙන පූජාවක්.** ආනන්ද බෝධිය පිහිටවපු අවස්ථාවේ, තමන් වහන්සේ උදෙසා පූජා කිරීමට යමක් ඇත්ද, එය මේ බෝධිය උදෙසා පූජා කළත් පිනෙහි අඩුවක් නොවන බව බුදුන් වහන්සේ පෙන්වා දීමෙන්, ගුණ උපහාර පූජාවකින් වුණත් ලැබෙන ආනිසංස අඩුවක් නැති බව පෙනී යනවා.

වහා අවබෝධ කරගන්නා වූ භික්ෂූන් වහන්සේලාගෙන් අග තනතුර ලැබූ බාහිය දාරුචීරිය හිමි, ඊට පෙර අත්භවයක අවුරුදු විසිදහසක් යහපත් ලෙස මහණ දම් සපුරා තිබුනත්, ඒ කාලය තුළ කිසිවෙකුට සිවුරක් හෝ අටපිරිකරක් හෝ පූජා කරල තිබුණෙ නැති නිසා, ගෞතම බුද්ධ ශාසනයේදී ඒහි භික්ෂු භාවයෙන් මහණ උපසම්පදාව ලබාගත නොහැකි වූ බව ධර්මයේ සඳහන් වෙනවා. බාහිර අටපිරිකරකින් හෙවත් චීවර, පාත්තර ආදියෙන් සමන්විත නොවුණත්, බාහිය දාරුචීරිය රහතන් වහන්සේ ලෝකෝත්තර ඵලයෙන් අටපිරිකර (අභ්‍යන්තර අටපිරිකර) සම්පූර්ණ කර ගත්තා. බාහිර අටපිරිකර නොලැබුනේ පිංවල අඩුවක් නිසා. ඒ අටපිරිකර නොලැබීම නිසා ඒහි භික්ෂු භාවය ලබන්න හැකියාවක් තිබුණෙ නෑ. ඒ නිසා තමයි, චීවර ආදිය සොයා ගෙන එන ලෙස බුදුන් වහන්සේ බාහිය දාරුචීරිය රහතන් වහන්සේට පැවසුවේ. මේ අනුව ඒහි භික්ෂු භාවය කියන ලෞකික ඵලය ලබන්න, ලෞකික වශයෙන් අටපිරිකරක් මීට ඉහතදී පූජා කර නොමැතිවීම අඩුපාඩුවක් විදියට මුහුණ පාන්න සිද්ධ වුණා. ඒක ලෞකික ලැබීමක්. ලෞකික පිනකින් ලෞකික ඵලයක් තමයි නිපදවෙන්නෙ. නමුත් ආර්ය මාර්ගයේ තියෙන අභ්‍යන්තර අටපිරිකර කියන දේ ලෝකෝත්තර ඵලයට හේතු වන්නක්. ඉතින් උන් වහන්සේට ලෝකෝත්තර ඵලයට අවශ්‍ය වන්නා වූ කුසල් පිරිල තිබුණ නිසා ලෝකෝත්තර ඵලයට බාධාවක් වුනේ නෑ.

අපේ ගිහි බෞද්ධ පිරිස් අටපිරිකර පූජාව බොහොම ශ්‍රද්ධාවෙන් කරන දෙයක්. නමුත් සමහර අවස්ථාවලදී, සමහර පූජනීය ස්ථානවල එක් අටපිරිකරක් කිහිප වතාවකදීම නැවත නැවතත් පූජා කිරීම නිසා කෙනෙකුට මෙහෙම හිතෙන්න පුළුවන්. ''මේ පූජා කරන්නෙ මීට කලින් පූජා කරපු අටපිරිකරක්මනේ! පූජා කරපු දෙයක් යළි යළි පූජා කිරීමෙන් ඵලක් තියේද? මෙහෙම කරල පිං ලැබෙනවද?" මේ විදියට හිතේ සැක සංකාවක් චකිතයක් ඇති වෙන්න පුළුවන්.

මෙතනදී වැදගත්ම කාරණය තමයි, මේ ද්‍රව්‍ය පදාර්ථ පූජා කළාට පින හට ගන්නෙ චිත්තප්‍රසාදයෙන්. එහෙම නැතිව ද්‍රව්‍ය පදාර්ථ ඇතුලෙ පිං පවු සම්බන්ධයක් නෑ. චේතනාව තුළ තමයි ඒක තියෙන්නෙ. හැබැයි ද්‍රව්‍ය පදාර්ථ උපනිශ්‍රය කර ගන්නවා. නමුත් චේතනාව තමයි මුල් වෙන්නෙ. උදාහරණයක් විදියට යම් කෙනෙක් අටපිරිකරක් අරගෙන පළමු වතාවට පූජ කළොත්, ඒ පුද්ගලයට එහෙම පූජ කරන කොට හටගත් චිත්තප්‍රසාදයේ ප්‍රමාණයට අනුව පිනක් සිද්ධ වෙනවා. දූන් එහෙම පූජ කරල තවත් දවසකින් දෙකකින් ඒ අටපිරිකරම තවත් කෙනෙක් පූජ කළොත්, එතනදී පිනට බලපාන්නෙ ඒක කලින් පූජා කරපු අට පිරිකරක්ද නැද්ද යන කාරණය නෙවෙයි. අට පිරිකර කියන ඒ ද්‍රව්‍ය පදාර්ථය උපනිශ්‍රය කරගෙන, ශාසනය කෙරෙහි හට ගන්නා චිත්තප්‍රසාදය තමයි මෙතනදී බලපාන්නෙ. ඒ විදියට **එකම අටපිරිකරක් සිය වතාවක් පූජ කළත් චිත්තප්‍රසාදය තියෙනව නම් පිනේ අඩුවක් නෑ.**

හැබැයි මෙතනදී පූජා කරපු අට පිරිකරක් නැවත පූජා කරන්නෙ වෙනත් ශාසනික වස්තුවකට හුවමාරු කිරීමෙන්. මොකද **යම් පිරිකර භාණ්ඩයක් පූජා කරල තිබුණත්, එහි වටිනාකමට තවත් එවැනිම වූ ශාසනික වස්තුවක් හුවමාරු කිරීමට අයිතියක් භික්ෂූන් වහන්සේ සතු වෙන බව ධර්ම විනයේ (විනය පිටකයේ) සඳහන් වෙනවා.** එතකොට ඒ පිරිකර වෙනත් පිරිකරකට හුවමාරු කරල, කැප ඇරල නිදහස් කරන්න පුළුවන්. එහෙම වෙළෙන්දෙකුට නිදහස් කළොත්, ඒක ඒ වෙළෙන්දාට අයිතියි. හැබැයි ඒ විදියට හුවමාරු කරන භාණ්ඩය ශාසනයට සම්බන්ධ වීමත් විශේෂයි. ඒ වගේම ලෝක සම්මත වටිනාකමට ආසන්න වශයෙන් සමාන වෙන්නත් ඕන. උදාහරණ විදියට කෙනෙක් භික්ෂූන් වහන්සේ නමකට අටපිරිකරක් පූජා කරල තියෙන අවස්ථාවක් ගත්තොත්, උන් වහන්සේට අටපිරිකරවලින් අඩුපාඩුවක් නැත්නම්, දායකයෙක් සම්බන්ධ කරගෙන ඒ අටපිරිකර ඒ සම්බන්ධ වෙළෙන්දෙකුට ලබා දීල, ඒ වටිනාකමට සමානව ආවාස ගෙයි වහලයේ ඇති අඩුපාඩුවක් සකස් කර ගන්න අවශ්‍ය භාණ්ඩ ගැනීමේ හැකියාව තියෙනවා. ඒ කියන්නෙ ශාසනය උදෙසාම වූ තවත් එවැනිම කටයුත්තකට යොදා ගන්න හැකියාව තියෙනවා. නමුත් අටපිරිකර විකුණල, ඒ මුදලින් ශාසනික නොවන තමන්ගෙ ගිහි ආකල්පික පෞද්ගලික ඕනෑ එපාකම් සපුර ගන්නව නම් ඒක පහත් ක්‍රියාවක්. ඒක දහමට ගැලපෙන්නෙ නෑ. ඒ නිසා එවැනි අවස්ථාවලදී විහාරස්ථාන තුළින් එබඳු කටයුතු සඳහා වටිනාකමට හුවමාරු කරගෙන ලබා දෙන අටපිරිකරක් අරගෙන පූජා කරල, ඒ ලැබෙන මුදල් ධර්ම ශාලා ප්‍රතිසංස්කරණ, පහන් ටැඹ නිර්මාණ ආදී ශාසනික කටයුතුවලට යොදා ගැනීම වරදක් නැති බව මේ අනුව වටහා ගන්න ඕන.

ඒ වගේම **කෙනෙක් පූජා කරන අටපිරිකරක් දකල, ඒ සම්බන්ධව ඇති කරගන්නා චිත්තප්‍රසාදයත් මහා ලැබීමකට** මුල පුරන බව දහම් කතාවලින් පැහැදිලි වෙනවා. මුගලන් මහ රහතන් වහන්සේ තව්තිසා දෙව් ලොවට වැඩම කළ අවස්ථාවක, ජේතවනාරාමය වගේම විමාන දෙකක් දකින්න ලැබුණා. ඒ නිසා ඒ පිළිබඳව දේවතාවන්ගෙන් විමසන කොට මේ කතා පුවත සැල කළා. අනේපිඬු සිටුතුමා ජේතවනාරාමය කරවා බුදුන්ට පූජා කරන අවස්ථාවේ ඒ සඳහා කිසිදු මුදලක් වියදම් නොකරපු මනුස්සයෙක්, අනේ සාදු... මෙය බුදුරජාණන් වහන්සේට පූජාම වේවා.... කියල පැහැදුණු සිතින් චිත්තප්‍රසාදය ඇති කරගෙන අනුමෝදන් වුණා. ජේතවනාරාමය අනේපිඬු සිටුතුමා හදල පූජා කළාට, අර මනුස්සයට පැහැදුණු සිතින් නැඟුනු චිත්තප්‍රසාදය හේතු කොට ගෙන දෙව් ලොව රත්රන් විමානයක් පහළ වුණා. නමුත් අනේපිඬු සිටුතුමා කෝටි ගාණක් වියදම් කරල කර ගත් පුණ්‍ය ක්‍රියාවෙන්, දෙව් ලොව අර රන් විමානයට ටිකක් පහළින් රිදී විමානයක් තමයි පහළ වුණේ. ඒක සිද්ධ වුණේ චිත්තප්‍රසාදය නැගිච්ච ආකාරයට. ඒ කියන්නෙ යමක් පූජා කරන කොට, ඒක සිද්ධ කරන්න ඕන පැහැදුණු අලෝභ සිතකින්. ඒ පූජාව තුළින් තමන්ගෙ සිතට දැනුණු පිනා යාම මතු ලැබීමට බෙහෙවින් බලපානවා. යම් දෙයක් තමන් විසින් පූජා කරන කොට, ඒ පූජා කිරීම තුළින් තමන්ගෙ සිතට දැනෙන පිනා යාමට සුදුසු වන පුණ්‍යස්කන්ධයක් ඇති වුණා නම් ඒක තමයි පින කියන්නෙ. පූජා කිරීමේදී අවශ්‍ය වන්නෙ බුදුන්, දහම්, සඟුන් කෙරෙහි ☞

පැහැදී චිත්තප්‍රසාදය ඇති කරගෙන පූජා කිරීම පමණක් බව මේ කාරණයෙන් තේරුම් ගන්න ඕන.

සිදුහත් බෝධිසත්වයින් වහන්සේ ගිහි ගෙය අත හැරල පැවිදි වෙන කොට, උන් වහන්සේට සිවුරු පිරිකර ලැබුණෙ කොහොමද කියල ඇතමුන් ප්‍රශ්න කරනවා. මේ සඳහා විවිධ මත තියෙනවා. නමුත් සිද්ධ වුණේ මේකයි. සහම්පති කියන මහා බ්‍රහ්මයා විසින් බුද්ධත්වයට පත් වීමට නියමිත ඒ උත්තමයන් වහන්සේ පැවිදි වෙන අවස්ථාවේ අටපිරිකරක් ගෙනත් පූජා කළා. ඒක හැම බුදුවරයන් වහන්සේ නමකටම සිද්ධ වෙන ධර්මතාවයක්. ලෝකයක් වැනසිලා නැවත ලෝකයක් හට ගන්න කොටත් අකනිටා බඹ ලොව බ්‍රහ්මයින් ජීවත් වෙනවා. ඒ වගේම බුද්ධ ශූන්‍ය කල්ප තියෙනවා. ඒ කියන්නෙ එක බුදුවරයන් වහන්සේ නමක්වත් නැති කල්ප. ඒ නිසා බුදු රජාණන් වහන්සේ නමක් පහළ වීම කියන දේ අති දුර්ලභ දෙයක්.

පසුගිය මහා කල්ප 91 ටම පහළ වෙලා තියෙන්නෙ බුදුවරයන් වහන්සේලා හත් නමයි. ඒ හත් නමෙන් දැනටමත් හතර නමක් මේ මහා භද්‍ර කල්පය තුළත්, ඉතිරි තුන් නම මීට ඉහත කල්ප තුලත් පහළ වෙලා අවසානයි. මහා භද්‍ර කිව්වෙ අති උසස් ගුණයන්ගෙන් පූර්ණ වෙලා තියෙන නිසා. මහා භද්‍ර කල්පයක් ලෝකයේ පහළ වීමත් අති දුර්ලභව සිදුවන දෙයක්. මහා භද්‍ර කල්පයක බුදුවරයන් වහන්සේලා පහළ වෙන්නෙ උපරිම වශයෙන් පස් නමයි. ඒ පස් නමෙන් දැනට හතර නමක්ම පහළ වෙලා අවසන්. ඒ හැර අනෙක් කල්පවල බුදුවරයන් වහන්සේලා පහළ වෙන්නෙ එක් නමක්, දෙනමක්, තුන් නමක් වගේ තමයි. ඒ කල්පවලිනුත් බොහොමයක් බුද්ධ ශූන්‍ය කල්ප. මහා කල්පයක් විනාශ වෙලා මහා කල්පයක් ආරම්භ වෙන කොට අකනිටා බඹ ලොව වැඩ වාසය කරන, මීට මහා කල්ප 91 කට පෙර පහළ වුණු බ්‍රහ්මයින් අතරින්, බුදුන් වහන්සේලාගෙන් බණ අහල අරිහත්වයට පත්නොවූ සමහර පිරිස්, බුදුවරයන් වහන්සේ නමක් පහළ වෙලා උන් වහන්සේගෙන් බණ පදයක් අහන්න, බුදු වරයන් වහන්සේ නමක් දකින්න බොහොම චිත්තප්‍රසාදයෙන් සැදී පැහැදී ඉන්නවා. ඒ වගේම රහත් ඵලයට පත් වෙච්ච බ්‍රහ්මයින් හිටියොත්, ඒ අයත් බුදුන් වහන්සේලාගේ ගුණ කියන කොට ඊට ගරු කරනවා.

එතකොට **මහා කල්ප 91 කට පෙර පහළ වුණු විපස්සී නම් බුදු පියාණන් වහන්සේ වැඩ නමස්කාර කර අනාගාමී ඵලයට පත් බ්‍රහ්මයින් අදත් අකනිටා බඹ ලොව වැඩ වාසය කරනවා.** "විපස්සිස්ස නමත්ථු චක්ඛුමන්තස්ස සිරීමතෝ...." ආදී වශයෙන් කියන සත් බුදු වන්දනාව සජ්ජායනා කරන අවස්ථාවලදී මේ මඟුල් සක්වල ඇතුළු බුද්ධ සංඥාව ලබන්න පුළුවන් සීමාවේ තියෙන, මේ දස දහසක් සක්වලටම මේක ඇහිල, ඒවායේ පිහිටල තියෙන තිස් එක් තලවලින් අකනිටා බඹ ලොව වසන බ්‍රහ්මයින්ටත් ඇහෙනවා. එතකොට ඔවුන්, තමන්ට මේ ධර්මය පහදා දුන් විපස්සි බුදු රජාණන් වහන්සේට කවුරුහරි නමස්කාර කරනවා කියල දැනිල, ඒ ගැන පැහැදිලා ඔවුනුත් නමස්කාර කරල ඒ සජ්ජායනා කරන පිරිසට දීර්ඝායුෂ වේවා, යහපත සැලසේවා කියල ආශිර්වාද කරනවා. ඒ වගේම විපස්සි




බුදුන් වහන්සේගෙන් පසුව පහළ වෙච්ච බුදුන් වහන්සේලාගෙන් බණ අහල මගඵල ලබල මේ බඹ ලොව ඉපදිච්ච බ්‍රහ්මයිනුත්, ඒ ඒ බුදුවරයන් වහන්සේලාගේ නම් කියවෙනකොට අර විදිහටම සාදුකාර දීල ආශිර්වාද කරනවා. **සත් බුදු නමස්කාරය කරන කොට මේ විදියෙ ආශිර්වාදයක් ඒ බ්‍රහ්මයින්ගෙන් ලැබෙනවා.** නමුත් මෙහෙම දේවල් වෙන බව අපේ මස් ලේ ඇහැට පේන්නෙ නෑ. අපේ අතේ නෙළුම් මලක් භෞතිකව නැති වුණත්, නෙළුම් මලක් තියෙනව කියල හිතෙන් මවා ගත්තොත්, අපේ චිත්තජ කිරණවලින් නෙළුම් මලක් මැවෙන ක්‍රමවේදයක් ලෝකයේ තියෙනවා. නවීන විද්‍යාවෙන් සොයා ගත් කිරිලියානු කැමරා ක්‍රමයෙන්, ඒ විදියට නෙළුම් මලක් සිතින් මවාගෙන සිටින අවස්ථාවක් ඡායාරූප ගත කළොත්, ඒ හිතේ මවා ගත්ත නෙළුම් මල ඒ කැමරාවෙ සටහන් වෙනවා.

මෙන්න මේ වගේ, ලෝකයක් ආරම්භ වෙනකොට චිත්තජ කිරණවලින් හැදිච්ච නෙළුම් ඇට, බ්‍රහ්මයින්ගෙ පුණ්‍ය සෘද්ධියට ඔවුන්ට පහළ වෙනවා. **මධ්‍ය දේශයේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පහළ වෙන ස්ථානය තමයි මනුස්ස ලෝකය ආරම්භ වීමේදී පළමුවෙන්ම ගොඩ නැගෙන ස්ථානය.** බ්‍රහ්මයින්ට මේ ස්ථානය ඔවුන්ගේ දිවැසට පේනවා. මේ කිරණ නෙළුම් ඇටයක් බඹ ලොවෙන් මේ මධ්‍ය දේශයේ බෝධීන් වහන්සේ පහළ වෙන ස්ථානයට එවනවා. මේක එවන්නෙ කිරණ ශක්තියෙන් නිසා, ඉතාම සුළු වෙලාවක් තුලදී පොළවට පතිත වෙනවා. මේ කිරණ ශක්තිය මුල් වෙලා ඒ නෙළුම් ඇටයෙන් අති විශාල නෙළුම් ගහක් නිර්මාණය වෙනවා. මේක භෞතිකව, වතුරේ හැදෙන නෙළුම් ගහක් නෙවෙයි. කිරණ ශක්තියෙන්මයි හැදෙන්නෙ. මේ සිද්ධියත් ඉතාම සුළු මොහොතක් තුළදී සිද්ධ වෙන ක්‍රියාවලියක්. මේක කොච්චර ලොකු වෙනවද කියනව නම්, අකනිටා බඹ ලොවට යන කල්ම ලොකු වෙනවා. ඊට පස්සෙ මේ කිරණ නෙළුම් ගහේ කිරණමය නෙළුම් මලක් හට ගන්නවා. ඒ වෙන කොට අදාල කල්පයට පහළ වීමට නියමිත බුදුවරයන් වහන්සේලා ප්‍රමාණයට සමාන සංඛ්‍යාවක් කිරණමය අටපිරිකර ඒ මල ඇතුලෙ පිහිටනවා. ඒ විදියට උපරිම පිහිටන්නෙ පහයි. ඒවා පිහිටන්නෙ බුදුවරයන් වහන්සේලාගේ පාරමිතා බලයෙන්.

සමහර අවස්ථාවලදී මේ මලේ හට ගන්නා අටපිරිකර ප්‍රමාණය බ්‍රහ්මයො දිවැසින් දැකල, අපට මේ කල්පය ඉවර වෙන්න කලින් මෙපමණ බුදුවරු දැක ගන්න පුළුවන් කියල සාදුකාර දීල චිත්තප්‍රසාදය ඇති කර ගන්නවා. ඒ මලේ එක පිරිකරක්වත් නැත්නම්, ඒක බුද්ධ ශූන්‍ය කල්පයක්. පුණ්‍ය සෘද්ධියෙන්, පාරමිතා බලයෙන් බුදුවරයන් වහන්සේලා පස් නමක් මේ මහා භද්‍ර කල්පයේ පහළ වීමට නියමිත නිසා, ඒ පාරමිතා බලයෙන් හැදෙන මූල නිර්මාණ පහ විදියට මේ කිරණමය අටපිරිකර පහ නිර්මාණය වෙලා පිහිටනවා.

මේ මහා භද්‍ර කල්පය ආරම්භයේදීත් මෙහෙම ගහක් පහළ වෙලා ඒකෙ හට ගත් මලේ පිරිකර පහක් ☞

තියෙනව දැක්ක බ්‍රහ්මයෝ, බොහොම සතුටු වෙලා චිත්තප්‍රසාදය ඇති කර ගෙන නමස්කාර කළා. ශාසනික දේ සඳහා සැදී පැහැදී සිටින අනාගාමී ඵලයේ ඉන්න බ්‍රහ්ම කොට්ඨාශවලින්, සහම්පති කියල බ්‍රහ්ම කොට්ඨාශයක් ඉන්නවා. සහනය මොකක්ද කියල හොය හොයා ගිය අය අතර අත් හැරීම, නොඇල්ම, මිදීම හැර වෙන සහනයක් නෑ කියල දැක්ක, නිවීමේ සහනය දැක්ක ප්‍රඥා අධිකයෙක් ඉන්නව නම්, ඒ පුද්ගලයා අකනිටා බඹ ලොව උපදිනවා. මෙහෙම සහනය උදෙසාම ධර්ම දේශනා කරන මේ බ්‍රහ්ම කොට්ඨාශය තමයි සහම්පති කිව්වෙ. මේ සහම්පති බ්‍රහ්මයින්ට තමයි අර කිරණමය අටපිරිකර ගැනීමේ හැකියාව තියෙන්නෙ. ඉතින් බෝධි සත්වයින් වහන්සේ නමක් ගිහි ගෙය අත හැරල පැවිදි වෙන කොට, මේ සහම්පතී නායක බ්‍රහ්මයා ඒ කිරණමය අටපිරිකර මේ ආකාරයට පූජා කරන බව ධර්මයේ සඳහන් වෙනවා. ඒ විදියට පූජා කළාට පස්සෙ ඒ කිරණමය අටපිරිකර මිනිස් ලෝකයට ගේන කොට, අනුකූලව පාවිච්චියට ගන්න පුළුවන්, ඒ කාලයට ගැලපෙන විදිහට භෞතික අටපිරිකරක් බවට පරිවර්තනය වෙනවා.

මේ වගේ සිද්ධියක් දිවැස් සමාධි වඩපු ස්වාමීන් වහන්සේ නමකට, මේ විදියට පෙනිල තියෙනවා. බඹ ලොව ස්වර්ණමය පත්තිරිප්පුවක් වගේ හැදිල තියෙන යම් ස්ථානයක, මේ සහම්පති බ්‍රහ්මයින් විසින් මේ කිරණමය අටපිරිකර පහ තැන්පත් කරනවා. **මධ්‍ය දේශයේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යම් තැනකද, එතැන් පටන් අකනිටා බඹ ලොවට යන කල් ඒ අවකාශය තුළ කිරණ මණ්ඩලයක් හැර වෙන කිසිම දෙයක් පිහිටන්නෙ නෑ.** ඒ මාධ්‍ය තුළින් ඉහළටම ගිහින් බැලුවම මේ කිරණමය අටපිරිකර සහිත ස්වර්ණමය බ්‍රහ්ම විමානය පැත්තකින් පේන්න තියෙනවා. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ඉහළට ඒ වටා හැදිච්ච කිරණ වළල්ලක් (කිරණ මණ්ඩලයක්) පිහිටල තියෙනවා. බුද්ධ ශ්‍රාවකයෝ පහළ වෙනකොට, බෞද්ධයෝ පහළ වෙනකොට, බුදුන් දහම් සඟුන් මුල් කරගෙන සිදුවන පුණ්‍ය කටයුතුවලින් ඇතිවන බෞද්ධ ගුණ ධර්ම ආදී විශේෂ දේවල්, අර කිරණ වළල්ල සමග සම්බන්ධ වෙනවා. **සෑම බෞද්ධයෙක්ගෙම ගුණ ධර්ම ජය ශ්‍රී මහා බෝ සමිඳු සමග සම්බන්ධ වෙනවා.** මේ සම්බන්ධය අකනිටා බඹ ලොවට යනකල් ගිහින්, පැත්තකින් තියෙන කිරණමය අටපිරිකර පහකින් යුත් ස්වර්ණමය බ්‍රහ්ම විමානයට සම්බන්ධ වෙනවා. ඒ විමානයේ පටන් කිරණ රැහැනක් බ්‍රහ්මයින් වැඩ වසන නායක බ්‍රහ්මයාගේ විමානය කරා සම්බන්ධ වෙනවා. එහි වැඩ සිටින සහම්පතී නායක බ්‍රහ්මයා ඇතුළු බ්‍රහ්මයින් කොපමණ සමාධියෙන් කල් ගත කළත්, සිදුවන සෑම බෞද්ධ විශේෂ සිදුවීමක්ම, හරියට වයර් නැති සීනුවක් ඇත ඉඳන් නාද දෙනව වගේ මිහිරි කම්පනයකින් ඒ බ්‍රහ්මයින්ට දැනෙනවා.

ලොවුතුරා බුද්ධත්වයට පත් වෙන බෝධිසත්වයාණන් වහන්සේ නමක් පහළ වෙනකොටත්, මේ ආකාරයට මහා මිහිරි කම්පනයකින් සහම්පති බ්‍රහ්මයින්ට දැනෙනවා. එහෙම දැනුනට පස්සෙ සමාධියෙන් ඉවත් වෙලා, ඒ පහළ වෙච්ච බෝධි සත්වයින් වහන්සේට කළ යුතු යම් උපකාරයක්, කටයුත්තක් තියෙනව නම් හොයල බලල කටයුතු කරනවා. ඒ බෝධි සත්වයින් වහන්සේ කුමන අවස්ථාවන්ටද යොමු වෙන්නෙ, ඒ ඒ අවස්ථාවලදී තම තමන්ගේ ඇප උපස්ථානය කොයි ආකාරයටද සිද්ධ විය යුත්තේ..... ආදී කරුණු කාරණා පිලිබඳව සොයා බලනවා. මේ විදියට මේ අටපිරිකර පහෙන් හතරක්ම අද වෙනකොට භාවිතා කරල අවසානයි. ඒ කකුසඳ, කෝණාගම, කාශ්‍යප හා ගෞතම කියන බුදුවරයන් වහන්සේලා හතර නම උදෙසා. දැන් ඉතුරු වෙලා තියෙන්නෙ තව එක් කිරණමය අටපිරිකරක් විතරයි. ඒක මතු බුදු වෙන මෛත්‍රී බෝසතාණන් වහන්සේට පූජා වීමට නියමිතයි. මේ වගේ කාරණා දකින්න නම් ඉහළ සමාධියකට සමවැදිය යුතුයි.

ඒ වගේම වස්ත්‍ර පූජාවේ විපාක විදියට ධර්මයේ මෙහෙම කතාවක් සඳහන් වෙනවා. ඒකදුස්ස දායක භික්ෂූන් වහන්සේ චිත්තප්‍රසාදය ඇති කරගෙන, පහන් සිතින් පියුමතුරා බුදුරජාණන් වහන්සේට එක් වස්ත්‍රයක් පූජා කිරීම හේතු කොට ගෙන, 36 වතාවක් සක්‍ර දේවේන්ද්‍ර පදවිය ලැබුණු බව සහ 33 වතාවක් රජකම් ලැබුණු බව සඳහන් වෙනවා. මනුස්ස අත්තභව තුළදීත් බොහෝ භෝග සම්පත් ඇති, වස්ත්‍ර ඇති, රූමත්, ගුණවන්ත, රන්වන් පාට සිරුරක් හෙබි, සතුරන්ට මැඩිය නොහැකි පුද්ගලයෙක් බවට පත් වෙන්න හේතු වාසනා පහළ වුණු බවත් සඳහන් වෙනවා. ඒ වගේම පිළින්දවච්ච අපදානයට අනුව, දූවිලි නොඇලෙන සමක් සහිත කාන්තිමත්, සිනිඳු සිරුරක් ලැබීමත් මේ වස්ත්‍ර පූජාවේ ආනිසංස විදියට පෙන්වා තියෙනවා.

පත්තදායක භික්ෂූන් වහන්සේ, සිද්ධාර්ථ බුදු රජාණන් වහන්සේට පාත්‍රයක් පූජා කිරීම හේතුවෙන් කල්ප 94 ක් දුගතියකට නොගිය බව සඳහන් වෙනවා (246 වන අපදානය). පිළින්දවච්ච හිමියන්, පෙර පාත්‍ර පූජා කරපු පිනෙන් වටිනා රන් රිදී ලැබෙන, අනතුරු උපද්‍රව නැති, අන්‍යයන්ගේ ගෞරවයට බඳුන් වන, ආහාර පාන වස්ත්‍ර සේනාසන පහසුවෙන් ලැබෙන, ස්ථිර සිත් ඇති, සෑම කල්හිම ධර්මයට කැමති, කෙලෙස් අඩු පුද්ගලයෙක් බවට පත්වෙන්න හේතු වාසනා පහළ වුණු බව ධර්මයේ සඳහන් වෙනවා.

වාසිදායක භික්ෂූන් වහන්සේ කල්ප 94 කට පෙර පිහියක් පූජා කරපු පිනෙන් කල්ප 94 ක්ම අපාගත වුණේ නැති බව අපදාන පාළි 240 වන අපදානයේ සඳහන් වෙනවා. දැලිපිහියා පිදීමේ විපාක වශයෙන් තැන්පත් සිත් ඇති, වීර්ය වන්ත, ධෛර්ය වන්ත, තීක්ෂණ නුවණ ඇති විශාරද පුද්ගලයෙක් වීමට හේතු වාසනා ලබන බවත් සඳහන් වෙනවා. සූචිදායක භික්ෂූන් වහන්සේ විපස්සී බුදු රජාණන් වහන්සේට ඉඳිකටු පූජා කරපු පිනෙන්, වරක් සක්විති රජ වුණු බව පිළින්දවච්ච අපදානයේ (94 වන අපදානය) සඳහන් වෙනවා. ඒ වගේම විශිෂ්ඨ රූප සම්පත් ලැබීම, තීක්ෂණ නුවණ ලැබීම, බොහෝ භෝග සම්පත් ලැබීම, ගැඹුරු සියුම් ධර්ම කරුණු අවබෝධ කර ගැනීමේ ශක්තියක් ලැබීම ආදී විපාකයන් ඇති බවත් පෙන්වා තියෙනවා.


ඒ වගේම බඳ පටි පිදීමේ විපාකයන් ලෙස සමාධීන්හි කම්පා නොවන, සමාධියේ හුරු පුරුදු ඇත්තෙකු වීම, ඇදහිය යුතු වචන ඇත්තෙකු වීම, එළඹ සිටි සිහිය ඇත්තෙකු වීම, නොබිඳෙන පිරිස් ඇත්තෙකු වීම, බිය තැති ගැනීම් ඇත්තෙකු නොවීම ආදිය පෙන්වා තියෙනවා. පෙරහන්කඩ පූජා කිරීමෙන් දීර්ඝායුෂ ලැබීම, අවි ආයුධවලින් පීඩා නොලැබීම, වස විසවලින් හිංසා නොවීම, සොර සතුරන්ට හිංසා කළ නොහැක්කෙකු වීම, අකල් මරණවලට පත් නොවීම ආදී විපාකයන් ලැබිය හැකි බව පිළින්දවච්ච අපදානයේ පෙන්වා තියෙනවා. මේ ආකාරයෙන් වූ විපාකයන් (ආනිසංසයන්) අටපිරිකර පූජාව හේතුවෙන් ලැබෙනවා. මේ නිසා අරි අටඟි මග යන උතුමන්ට අවශ්‍ය කරන්නා වූ බාහිර පහසුකම් සලසල දීල, තමන්ටත් අරි අටඟි මග පූර්ණ කර ගන්න අවශ්‍ය වෙන හේතු වාසනා පහළ කර ගැනීම උදෙසා, නිවැරදි ලෙස අටපිරිකර පූජාව සිදු කරල නිවන් මගට පසුතලය සකස් කර ගන්න කටයුතු කරගන්න.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ප්‍රසාද් ද සිල්වා**
**පරිපාලන නිලධාරි**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

**අභයරතනාලංකාරය - 22**

# ආධ්‍යාත්මික ශක්තියෙන් ගුප්ත රෝග සුවපත් කළ හැටි...



- වහරක අභයරතනාලංකාර හිමි

*(පසුගිය කලාපයෙන් - මනුස්සයින්ට ලෙඩ රෝග හදන ගුප්ත ක්‍රම සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීම් කිහිපයක් ...)*

රූපයට කරන කටු ගැසීම් ආදියෙන් ලෙඩ රෝග කරදර ඇති වන හැටි මේ දහම් සඟරාවේ මින් පෙර කලාපයකින් විග්‍රහ කළා. ඒ වගේම එවැනි අවස්ථාවකදී ඒ ආකාරයට කටු ගහල කරපු හිර කිරීමක් නැවත කපල දොස් අරින්න, ඒ රූපය ඇඳල නිල ලකුණු කරල, නැවතත් කටු ගහන්න ගිහින් දොස් වැඩි වෙලා, ඒ කටු ගහල හිරවෙච්ච පුද්ගලයා තවත් හිර වෙන බවත් විස්තර කළා. සමහර කට්ටඩි වැඩ කරන උදවිය මේ කාරණය දන්නෙ නැතිව, ඒ ශාස්ත්‍රයට ගැලපෙන්නෙ නැති මේ වගේ වැඩ කරන්න ගිහින් අමාරුවෙ වැටිච්ච අවස්ථාත් ඕන තරම් තියෙනවා. දැන් මේ විස්තර කරන්නෙ මම මහණ වුණාට පස්සෙ මුහුණ දෙන්න සිද්ධ වෙච්ච ඒ වගේ සිද්ධියක්.

මම දන්න කියන එක්තරා භික්ෂූන් වහන්සේ නමකට මේ වගේ කටු ගැහිල්ලක් කරල හිර කරල තිබුණා. උන් වහන්සේ ඒකෙන් අසනීප වෙලා සෑහෙන දුක් කරදර වින්දා. ඒත් එක්කම නිතර නිතර හැදෙන දරුණු අසනීපයකුත් තිබුණා. මට උන් වහන්සේ ගැන බොහොම අනුකම්පාවක් ඇති වෙච්ච නිසා, සෑහෙන මහන්සි වෙලා, ඒ කාලෙ මට තිබ්ච්ච ශක්තියකින් ඒ අමනුස්ස බන්ධනය කපල අයින් කළා. ඒකෙන් උන් වහන්සේට හැදිච්ච අර දරුණු අසනීපය දින 14 කින් සනීප වුණා. ඊට පස්සෙ මම ඒ ගැන පැහැදිලි කරල, තමන්ගෙ බණ භාවනා කටයුතු පාඩුවේ කරගෙන ඉන්න කියල උන් වහන්සේට උපදෙස් දුන්නා. නමුත් තමන්ගෙ තිබ්ච්ච පණ්ඩිතකමට එක තැනක ඉන්න බැරිව, බෝතලේ කියන ගම් පළාතක හිටපු එක්තරා කට්ටඩියෙක් හමුවෙන්න මේ භික්ෂූන් වහන්සේ ගියා. ඒ කට්ටඩිය අඳුනක් වගේ දේකින් බලල කිව්වලු, මේ අමනුස්සයො යන්න යනවනෙ, එහෙම යවල බෑනෙ, අපි ඕක කපලම යවමු කියල. ඉතින් මමත් ඒක කපල තමයි යැව්වෙ. නමුත් ඒ කට්ටඩියගෙ අර ක්‍රමයට එහෙම කපල යැව්ව බවක් අහුවුණේ නෑ, ඒක ඔහුට වැහුණා. මේ නිසා ඔහු මොකද කළේ, මම මේක සම්පූර්ණයෙන් සුද්ධ කරල දෙන්නම් කියල හොඬල අලෙන් ඒ භික්ෂූන් වහන්සේගෙ රූපෙ කපල ඒකට නිල අල්ලල ඇණ ගහල, අර කපල යවපු අමනුස්සයො ටික නැවතත් ඇදල ගත්තා. එහෙම ඇදල අරගෙන මේක ගිහින් පුච්චන්න කියල අර භික්ෂූන් වහන්සේට දුන්නා. නමුත් මෙතනදී ඒ කට්ටඩියවත් භික්ෂූන් වහන්සේවත් දැනගෙන හිටියෙ නෑ, ඒක පිච්චුවොත් නැවතත් උන් වහන්සේටම වදින බව. එහෙම නොකර ඒක කපල යවන ක්‍රමයක් තිබුණත් ඒක මේ අය දැනගෙන හිටියෙ නෑ. මේ නිසා නොදන්න කමට, කපල අයින් කරල යවපු එක නැවතත් ඇදල අරගෙන තවත් දෝසයක් හදාගත්තා.

දැන් ඉතින් මේක මමත් දැනගත්තට පස්සෙ, ඒ අවස්ථාවෙ මටත් කරන්න කිසිම දෙයක් තිබුණෙ නෑ. මම දැනගෙන හිටිය, දැන් මේ අය මේ වැඩේ කළොත් අර භික්ෂූන් වහන්සේටම ඒක වැදිල පිච්චිලා උන් වහන්සේ විනාස වෙනව කියල. ඉතින් මම කොච්චර කිව්වත් ඕක ගණන් ගත්තෙ නෑ. මේ නිසා ඕක පන්සලේ ගෙනත් දාගෙන මහ ලොකුවට කයිවාරු ගගහ පෝරණුවක් වගේ එකක් හදල, පොල් කටු අඟුරු දාල අළු වෙන කල් පිච්චුවා. දැන් ඉතින් මට කරන්න දෙයක් නැතිකමට, මේ භික්ෂූන් වහන්සේත් කොහොම හරි බේර ගන්න ඕන නිසා මම මොකද කළේ, ඒක පුච්චනකල් කුටියට වෙලා උන් වහන්සේගෙ නමට මෙත් වඩන්න පටන් ගත්තා. ඒකෙන් උන් වහන්සේව බේරගන්න මට පුදුම වදයක් විඳින්න වුණා. මොකද මේක හරියට දැලි පිහියෙන් කිරි පැණි කනව වගේ භයානක වැඩක්. කොහොම හරි මම මෙත් වඩන කොට ඒ භික්ෂූන් වහන්සේට ඒ දෝසය වදින්නෙ නැතිව, ඒක ආපහු කැරකිලා අර කට්ටඩිය (ඇදුරා) ළඟටම ගියා. අන්තිමට ඒ කට්ටඩිය ඒකෙන් මළා. මොකද ඒ හිර කරපු අමනුස්සයට යන්න තැනක් නැති වෙන කොට ඒක කරපු කෙනාටම ආපහු වදිනවා.

ඉතින් මම ඕක දන්න නිසා වෙලපහින්ම කිව්ව, මේක කරන්න එපා කියල. නමුත් ඒක ඇහුවෙ නෑ. මේ නිසා ඒ මනුස්සය නොදන්නකමට කරන්න ගියපු වැඩෙන් ජීවිතයත් නැති කර ගත්තා. මම අර විදියට මෙත් නොවැඩුව නම්, අර භික්ෂූන් වහන්සේ තමයි ඒකෙන් විනාස වෙන්නෙ. මාර පාක්ෂික බලවේග ඇවිත් වහනව කියන්නෙ මේවට තමයි. ඉතින් මේක තේරුම් ගන්න බැරිව කොච්චර කිව්වත් සමහරු පිළිගන්නෙ නෑ. දැන් මේ වගේම සිද්ධියක් පසුගිය හෙළ බොදු පියුම දහම් සඟරාවෙ ''පිල්ලි යැවීමෙන් ලෙඩ රෝග කරදර ඇති වන හැටි'' ලිපියෙන් ඉදිරිපත් කළා. එතනදී අපේ බෝසතාණන් වහන්සේ පෙරුම් පුරන කාලයක වෙළඳ නායකයෙක් වෙලා හිටපු අවස්ථාවක, දෙව්දත් ඇතුළු ඇදුරෝ පිරිසක් උන් වහන්සේට යවපු පිල්ලියකට, උන් වහන්සේ ඇතුළු පිරිස මෙත් වැඩීම නිසා ආපසු කැරකිලා ගිහින්, ඒ කරපු අයටම වැදිල මළා. මෙතනදී සිද්ධ වුණෙත් ඒ වගේ දෙයක් තමයි.

ඒ වගේම කෙනෙකුට වස් කරනව වගේ තමයි සෙත් කරන ඒවත් ගිහින් වදින්නෙ. කෙනෙක්ගෙ නමක් අරගෙන ඒ නමට අදාල ලිපිනයත් එක්ක සිහි කරන කොට, ඒ පුද්ගලයගෙ ගති ස්වභාවය සමාධියට දැනෙන්න, පෙනෙන්න පටන් ගන්නවා. ඒ වගේ සිද්ධියක් තමයි මේ විස්තර කරන්නෙ. මම වේයන්ගොඩ ප්‍රදේශයේ නොයෙක් සෙත් ශාන්ති කටයුතු කරමින් හිටපු කාලයක තමයි මේක සිද්ධ වුණේ. ඒ පැත්තෙ හිටපු එක්තරා කාන්තාවක් දින 6 ක් තිස්සෙ දැඩි

සත්කාර ඒකකයේ සිහි නැතිව හිටියා. අන්තිමට වෛද්‍යවරුන්ගෙ නිගමනය වුණේ මොළේ මැරිල කියල. ඒකට ප්‍රතිකර්මයක් කරන්න පුළුවන් කෙනෙක් හිටියෙ නෑ. කොහොම හරි මම ගැන දන්න ඒ කාන්තාවගෙ ඥාතියෙක්, ඒ ගැන අහන්න මාව හමුවෙන්න ආවා. ඉතින් විස්තරයක් දැනගන්න, මම ඒ කාන්තාවගෙ නම හා ලිපිනය ඉල්ලගෙන යොමු කරල බලන කොට මට පෙනුනා, ඒ කාන්තාව සිහි නැතිව දිගා වෙලා රෝහලක ඇඳක ඉන්න බව. බලන කොට මහා බලවත් ගන්ධබ්බ අමනුස්සයො හය දෙනෙක් ඇගේ ශරීරයට අරක් ගෙන හිටියා. දැන් ඒ අමනුස්සයො මට කියනවා, අපි කැවුම් දුන්නොත් තමයි යන්නෙ කියල. සමාධියට ඒක හොඳට ඇහෙනවා. ඊට පස්සෙ මම අධිෂ්ඨාන කරල, මනෝමය වශයෙන් කැවුම් මවල ඒ අයට ඇති පදමට ගන්න කියල කැවුම් පෙට්ටි පිටින් යැව්වා. උන් ඒව අරගෙන, එහෙනම් අපි යනව කියල යන්න ගියා. දැන් මේ සිද්ධියට වෙන කිසිම පුද්ගලයෙක්, කිසිම දෙයක් සම්බන්ධ කර ගත්තෙ නෑ. දෙහි ගෙඩියක් කපන්න තරම් දෙයක්වත්, අඩු ගානෙ වතුර වීදුරුවක් තරම් දෙයක්වත් අවශ්‍ය වුණේ නෑ.

ඊට පස්සෙ මම අර ඥාතියට කිව්ව, ලෙඩාව හිර කරගෙන හිටපු අමනුස්සයො ටික යන්න ගියා, ඒ නිසා ලෙඩා අද හවස සිහිය ඇවිත් නැගිටල කතා කරයි කියල. ඒ විදියට මම වෙච්ච සිද්ධියත් එක්කම කිව්වා. දැන් ඒ ඥාතියගෙ නෝනගෙ නංගි කෙනෙක් තමයි මේ විදිහට රෝහලේ අසනීප වෙලා හිටියෙ. මේ නිසා ඒ අය මොකද කළේ, අපිට ලොකු දෙයක් මේකෙ සත්‍ය අසත්‍යතාවය බලා ගන්න ලැබුණොත් කියල දැන්මම බලන්න යන්න කිව්වා. ගිහින් හවස බලන කොට, ඒ කාන්තාව ඇස් ඇරල කෙඳිරි ගාල හිනාවෙලා එක පාරටම කතා කළාලු. ඊට පස්සෙ ඉඳ ගත්තලු. මොකවත් අමාරුවක් නෑ. ඊළඟ දවසෙ රෝහලෙන් ටිකට් කපල ගෙදරත් ගිහින් තිබුණා. දැන් ඉතින් අර මාව හමුවෙන්න ආපු ඒ අයගෙ ඥාතියට මේ සිද්ධිය ගැන බොහොම විශ්වාසයක් ඇති වුණා. නමුත් ඒක කිව්වට ඒ ලෙඩාගෙ අනෙක් ඥාතියො පිළිගන්න සූදානම් වුණේ නෑ. ඒ අය කිව්වෙ නවීන විද්‍යාවෙ හාස්කමකින් ලෙඩාව බේරුණා කියල. මෙච්චර කල් සිහි නැතුව හිටපු ලෙඩා නවීන විද්‍යාවෙ හාස්කමකින්, දැඩි සත්කාර ඒකකයේ හිටපු නිසා තමයි එහෙම නැගිට්ටෙ කියල ඒ අය කිව්වෙ. නමුත් ඒක ඒ වෛද්‍යවරුන්ගෙ නිගමනයක් නෙවෙයි, අර ඥාතීන්ගෙ නිගමනයක්. මොකද වෛද්‍යවරුත් ඇගේ මොළේ මැරිල කියල අත්හැරල දාල තිබුණෙ. කොහොම හරි ඒ අය පිළිගත්තෙ නෑ, මම මෙහෙම සිද්ධියක් කරපු නිසා ඒ ලෙඩා නැගිට්ට කියල. ඉතින් මට ඊට වඩා එහාට පෙන්නන්න, පැහැදිලි කරන්න ඕන කමක් තිබුණෙත් නෑ. මොකද මේ වගේ දේවල්වලින් ලාභ, කීර්ති, ප්‍රශංසා ලබන්න එදත් මගේ කිසිම බලාපොරොත්තුවක් නොතිබුණු නිසා.

ඊළඟට නුවර එළිය ප්‍රදේශයේ අවුරුදු 6 ක විතර ගැහැණු දරුවෙක් ඔය වගේම සිහි නැතුව ඉඳල, පස්සෙ ඒ අයගෙ ඥාතීන් මාව හමුවෙන්න ඇවිත් ඒ ළමයට සෙත් පතන කොටම, අර තිබ්බ්ච්ච දිෂ්ඨිය අහක් වෙලා සුද්ධ වෙලා ගිහින් සිහිය ආවා. එතනදිත් සෙත් කරල මම ඒ අයට



කිව්ව, දරුව අද නැගිටියි කියල. ඒ කිව්ව විදියටම ඒ දරුව නැගිට්ටා. හැබැයි එතනදි අර වගේ යමක් මවන්න අවශ්‍යතාවයක් තිබුණෙ නෑ. කළු විස කිරණක් ඒ ළමයගෙ ඇඟට හිර වෙලා තිබුණා. ඒකෙන් තමයි සිහි නැති වෙලා හිටියෙ. ඉතින් මම ඒක කපාගෙන යන්න ඊට ප්‍රතිවිරුද්ධව සුදු කිරණ ධාරාවකින් සෙත් කරල ඒකට ශක්තියක් යැව්වම, අර කළු කිරණ අහක් වෙලා ඒ ළමය ප්‍රබෝධ වෙනවත් එක්කම සිහිය ආවා. ඒ කියන්නෙ අර කළු කිරණ ශක්තිය කැපෙන්න ඊට වඩා වැඩි ශක්තියක් යැව්වා. අධ්‍යාත්මය දියුණු කරගත්තම, සිත දියුණු කරගත්තම ඒ වගේ දේවල් කරන්න පුළුවන්.

මේ වගේ සිද්ධිවලදි කොච්චර දුරක හිටියත් ඒ අදාල පුද්ගලයගෙ නමට සහ ලිපිනයට සම්බන්ධ වෙනවා. ඒකට දුර බලපාන්නෙ නෑ. ඒ වගේම මේ වගේ අවස්ථාවකදී අමනුස්සයෙකුට විඤ්ඤාණ ශක්තිය ප්‍රධාන වෙනවා. අපිට මස් ලේ කයින් ඉන්න කොට ලංකාව වගේ රටක් විශාල ප්‍රදේශයක් වගේ පෙනුනට, අමනුස්සයෙකුට ඒක හරියට අපේ අල්ලක් වගෙයි. ගන්ධබ්බ කයට ආවම, හරියට නිකං අල්ල උඩ ඉන්නව වගෙයි. ඉතින් අනුමෝදන් කරන කොට කොහේ හිටියත් ක්ෂණයකින් එතැනට ඇදිල එනවා. ඒක කර්ම විපාකජ ඍද්ධියක්. ඒ තමයි සූක්ෂම කයක් පිහිටන මාධ්‍යයේ හැටි. ඒක සාමාන්‍ය උදවියට අමුතු දෙයක් වුණාට, මානසිකත්වය වඩපු කෙනෙකුට අමුතු දෙයක් නෙවෙයි.

**තමන්ගෙ ඥාති මිත්‍රාදීන් මළාම කොච්චර ඈත හිටියත්, තමන්ගෙ ගෙදරට ඒ සියුම් කයින් ආපසු එන හැටි, එහෙම ඇවිත් දර මැහිවල - අගුපිල්වල ඉන්න හැටි, බිත්ති පර්වත අතරින් යන හැටි, තමන්ගෙ ඥාති මිත්‍රාදීන් දිහා බලාගෙන ඉන්න හැටි තිරෝකුඩ්ඩ සූත්‍රයේ විස්තර කරල තියෙනවා.** එහෙම ඉන්න කොට කොච්චර හිටියත් ඒ අයට ගාණක් නෑ. මේ තිරෝකුඩ්ඩ කියන එකෙන් පෙන්වන්නෙත් තිරස් අතට, හරස් අතට යන්න පුළුවන් කියල. ඒකට ඝන ද්‍රව්‍ය බාධාවක් නෑ. මොහොතකින් ඕනම තැනකට යන්න එන්න පුළුවන්. ඒකට අපිට වගේ යාන වාහන ඕන නෑ. ඒ ගන්ධබ්බ කය හරියට ගුවන් විදුලි තරංග වගේ පදාර්ථයකින් හැදිල තියෙන නිසා එහෙම යන්න එන්න පුළුවන්. ඒ කර්ම විපාකජ ඍද්ධියේ හැටි.

ඉතින් මේ වගේ සිද්ධි අනන්තවත්, සමාධි වඩපු අයට දැක බලා ගන්න පුළුවන්. **මේ වගේ කාරණා, මේ සංසාරයේ තියෙන භයානකත්වය තවත් හොඳින් තේරුම් ගන්න බොහොම වැදගත්. මොකද සාමාන්‍ය අයගෙ පංචේන්ද්‍රියන්ට ගෝචර නොවන, නමුත් මේ හැමෝටමත් කවද හරි මළාට පස්සෙ මේ වගේ සිද්ධිවලට මුහුණ දෙන්න සිද්ධ වෙන නිසා.** මේ නිසා මේ වගේ අවස්ථාවල ස්වභාවය, දහමට අනුකූලව නුවණින් අද අදම දැනගෙන, මේවායින් මිදෙන්න කටයුතු සලසා ගැනීම තම තමන්ට යහපත්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

**11 වන කොටස**

අපේ මස් ලේ ඇහැට නොපෙනෙන ලෝකයන්ගෙන් තවත් වැදගත් කොටසක් තමයි මේ විග්‍රහ කරන්නෙ. ඒ තමයි දිව්‍ය ලෝකය. මේ දිව්‍ය ලෝකයත් චාතුර් මහා රාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මානරතිය, පරනිම්මිත වසවර්තිය කියල ලෝක 6 කින් සමන්විතයි. මේ දිව්‍ය ලෝක 6 ගැන විශේෂ විග්‍රහයක් 14 වන කලාපයේ පළ වූ ''නිවනට පියගැට පෙළක් වන් වූ දේවතානුස්සතිය'' ලිපිය යටතේ ඉදිරිපත් කළා. ඒ නිසා මේ ලිපියෙන් එදා නොකියවෙච්ච වෙනත් පැතිකඩක් තමයි විග්‍රහ කෙරෙන්නෙ.

දැන් මේ දිව්‍ය ලෝක 6, අපි පෘථිවියේ ඉන්න කොට උඩින් පිහිටල තියෙනව කියල බොහෝ අය හිතාගෙන හිටියට ඒක නිවැරදි විග්‍රහයක් නෙවෙයි. වඩාත් නිවැරදිව කියනව නම්, මහාමේරු පර්වතය කේන්ද්‍ර කරගෙන චාතුර් මහා රාජිකය වටේටත්, මුදුන කේන්ද්‍ර කරගෙන තාවතිංසය ඇතුළු ඉන් ඉහළට ඉතිරි ලෝකත් පිහිටා තියෙනවා. මේ එක් සක්වලක පිහිටපු ලෝක 31 ම එක පොදියට කරකැවෙනවා. හැබැයි ඉහළට යන්න යන්න දුරස් වෙලා කරකැවෙන වේගය අඩු වෙනවා. ඒ හේතුවෙන් ඒ ලෝකවල ආයු කාලය වැඩියි. මේ දිව්‍ය බ්‍රහ්ම ලෝකවල එක දවසක් කියන්නෙ මේ මනුස්ස ලෝකයේ අවුරුදු ගාණක්. ඒ වගේම තාවතිංසයෙන් ඉහළ දේව ලෝකවලට රෑ දවල් කියල භේදයක් නෑ. හැම වෙලේම දවල් වගෙයි. විශේෂයෙන් හුඟක් ඉහළ ලෝකවල ඉන්න දෙවියන්ගෙ ස්වයං ප්‍රභා ආලෝකයෙන් ඒ ලෝක ආලෝකමත් වෙනවා. මේ නිසා ඒ ලෝකවලට සූර්යාලෝකයක් අවශ්‍ය නෑ. නමුත් තාවතිංසය ඇතුළු ඉන් පහළ දේව ලෝක ආලෝකමත් වෙන්න සූර්යාලෝකය අවශ්‍ය වෙනවා.

කොහොම හරි මේ දේව ලෝකවල තියෙන දිව්‍ය සැප සම්පත් විතරයි අද බොහෝ කොට කියවෙන්නෙ. ඒවායේ තියෙන දුකක් ගැන අහන්න ලැබෙන්නෙ නෑ. සමහර භික්ෂූන් වහන්සේලාත් පුණ්‍යානුමෝදනාවක් අවසානයේදී, දිව්‍ය සැප සම්පත් කෙළවර කර... ආදී වශයෙන් විග්‍රහ කරනවා. මේ දිව්‍ය ලෝකවල තියෙන දුක ගැන කියවෙන කතා ත්‍රිපිටක ආදී පොත්පත්වල තිබුණත් ඒ ගැන වැඩිපුර කතාවෙන්නෙ නෑ. මේ නිසා මේ ලිපියෙන් ප්‍රධාන කොටම හෙළිදරව් කරන්නෙ, මෙච්චර කලක් අහන්න නොලැබිච්ච, දේව ලෝකයේ තියෙන දුක ගැන.

## දෙව් ලොව දෙවියන් විඳින දුක

දැන් මේ දේව ලෝකවලින් පහළම දේව ලෝකය තමයි චාතුර් මහා රාජිකය. ඒකත් විවිධ දේව පිරිස්වලින් හැදිච්ච හත් කට්ටුවකින් (දෙව් දේවතා කොටස් හතකින්) සමන්විතයි. මහේශාක්‍ය දේව කොට්ඨාශවල ඉඳන් ආවතේව කරන පහත් දේව කොට්ඨාශ ඉන්නවා. අපි බහිරවයො කියල කියන්නෙත් මේ චාතුර් මහා රාජිකයෙන් පාලනය වෙන පහත් දේව කොට්ඨාශයක්. ඒ අයට බහිරව දේවතාවො කියලත් කියනවා. ඒ අය සතර අපාගත නෙවෙයි. නිදන්වලට අරක් ගෙන ඒවා ආරක්ෂා කරගෙන ඉන්නවා. බොහෝ විට ගල්ලෙන් ආශ්‍රිතව නිදන් තැන්පත් කරල තියෙන තැන්වල තමයි ඉන්නෙ. බ - බිහි වෙනවා, හිර - හිරවීම. බිහි කරගත් දේට, රැස් කරගත්තු දේට, එහෙම නැත්නම් සම්පත්වලට හිරවීම තමයි බහිරව කියන්නෙ. සතර අපාගත නොවුණත් ඒ අය ඒ නිදන් ආරක්ෂා කරගන්න දුකක් විඳිනවා. ඒ වගේම භූමාටු දේව කියල කියන්නෙත් ගස් වැල්, ලෙන් ආශ්‍රිතව ඉන්න පහත් දේව කොට්ඨාශයක්.

මේ දේව ලෝකවල තියෙන කාම දුක ගැන කතා කරන කොට, බුදුන් දවස එක්තරා කුෂ්ඨ රෝගයකින් පෙළිච්ච කාන්තාවක් හිටියා. මේ රෝගී තත්ත්වය නිසා මිනිස්සු ඇයව අප්‍රිය කළා. කොහොම හරි ඇය අන්තිමට බුදුන් වහන්සේගෙන් බණ අහල සෝවාන් වෙලා, ඊළඟ අත්බවයේ චාතුර් මහා රාජිකයෙ හතර වරම් දෙවියන්ගෙ විමාන හතර මැද්දෙ ලස්සන දෙවඟනක් වෙලා උපන්නා. දැන් මේ දෙවියන් හතර දෙනාම මේ දෙවඟන දැකල තමන්ට අයිති කරගන්න දුවගෙන ආවා. මොකද හතර දෙනාගෙම විමාන මායිම්වලට මැදිවෙලා තමයි උපන්නෙ. දැන් හතර දෙනාම තමන්ට අයිති බව කියනවා. නමුත් මායිම් මැද්දෙ නිසා එක්කෙනෙකුටවත් තනියෙන් අයිති කරගන්න විදියක් නෑ. හතර දෙනාටම අයිතියි. දැන් මේක බේරගන්න බැරිව එක් එක්කෙනා තමන්ගෙ තත්ත්වය, හිමිකම කියන්න පටන් ගත්තා. ''මේ දෙවඟන මට නැති වුණොත් මගෙ ජීවිතය විනාස වෙනවා, මාව මැරෙයි, ඒ නිසා මට ලබා දෙන්න.'' එක් කෙනෙක් මෙහෙම කියන කොට අනික් තුන් දෙනත් ඒකම කියනවා. දැන් මේ ප්‍රශ්නය විසඳගන්න බැරුව සක්‍ර දෙවියන් ළඟට ගෙනිච්චා. සක්‍ර දෙවියොත් බලල කියනවා, මේ තැනැත්තිය මට නැතිවුණොත් මගෙ ජීවිතයත් නැති වෙයි කියල. මේ නිසා අර සතර වරම් දෙවියො මොකද කළේ, ඔබ වහන්සේ අපේ රජ්ජුරුවො, ඔබ වහන්සේ නැති වුණොත් අපි ඔක්කොටම පාඩුයි, ඒ නිසා ඔබ වහන්සේම බාර ගන්න කියල ඒ දෙවඟන සක්‍ර දෙවියන්ටම බාර කළා.

දැන් මෙතනින් වැදගත් කාරණයක් හෙළි වෙනවා. **පංච කාමයෙන් මත් වෙලා ඉන්න දෙවියන්ට කාම වස්තුවක් ලැබුණම, ඒක හිමිකර ගන්න බැරි වුණොත් ජීවිතයත් නැති කර ගන්න හිතෙනවා.** මේ මනුස්ස ලෝකයේ වගේම තමයි එහෙ තියෙන කාම දුක. ඒ දුක දාහය දරන්න බැරි නිසා, සතර වරම් දෙවියොත් ඒ කාම වස්තුව තමන්ට නොලැබුණොත් ජීවිතයත් නැති වෙයි කියනවා. අන්තිමට සතර වරම් දෙවියන්ගෙ නායකයා, එහෙම නැත්නම් චාතුර් මහා රාජිකය හා තාවතිංසය යන දේව ලෝක දෙකටම අධිපති සක්‍ර දෙවියොත් ඒ කතාවම කියනවා. එතකොට කාම දාහය කොච්චර නම් තියෙන්න

ඕනද? ඒක උපරිමයෙන්ම තියෙනවා. දෙව්ලොව තියෙන මහ දුකින් එකක් තමයි මේ.

මේ ඉහළ දිව්‍ය තලවල ඉන්න දෙවියන්ට ඒ සුන්දර ලෝකයෙන් මත් වුණාම වෙනත් කෙනෙක් ගැන හිතන්න තියෙන වෙලාව බොහොම අඩුයි. උපමාවකින් කියනව නම්, අපේ පිරිස් සංගීත සංදර්ශනයක් බලන්න කොහේ හරි ගියාම, ඒ වෙලාවට තමන්ගෙ අනික් පිරිස් කොහෙද කියල බලන්නවත් නිච්චියක් නෑ, අමතකයි. මොකද ඒ සංගීතයෙන් මත් වෙලා. ඒක ඉවර වුණාට පස්සෙ තමයි මල්ලි කෝ? අයිය කෝ?.... ආදී වශයෙන් තමන්ගෙ පිරිස ගැන හොයන්නෙ. සමහර විට ඒ වෙලාවෙ මොනව වුණාද, කොහේ හිටියද කියලවත් දන්නෙ නෑ. මේ වගේ අවස්ථාවක් තමයි ඉහළ කාම සම්පත් විඳගෙන ඉන්න දෙවියන්ටත් තියෙන්නෙ. පංච කාමයන්ගෙන් මත් වෙලා ඉන්න කොට තමන්ගෙ ඇසුරෙ ඉන්න අය මතක නෑ. ඒ වගේම මේ ඉහළ දෙවියන්ට සමාජ සම්මතයක් විදියට හදාගත්තු එකක් මිසක්, අයිය මල්ලි... ආදී වශයෙන් මවු කුසකින් උපන් හිමිකමක් නෑ. තමන්ගෙ ස්ථානයේ උපන් හැටියට තමයි සම්බන්ධය තීරණය වෙන්නෙ. යහනෙ උපන්නොත් භාර්යාවක්, දෙවඟනක්. උකුලෙ උපන්නොත් දරුවෙක්. දොරකඩ උපන්නොත් දොරටු පාලකයෙක්. ආවතේව කරන සේවකයන් අතර උපන්නොත් සේවකයෙක්. පුණ්‍ය මහිමයේ අඩු වැඩි බව අනුව ඒ ස්ථානය තීරණය වෙනවා.

ඊළඟ කාරණය බඩගින්න. ඉහළ දෙව්වරුන්ගෙ ආහාරය තමයි අමෘතය. (ඒ කියන්නෙ චාතුර් මහා රාජිකයේ ඉහළ කට්ටුවේ ඉන්න මහේශාක්‍ය දෙව්වරුන්ගෙ සිට පරනිම්මිත වසවර්තියට යනකල්ම) සමහර දෙවියන්ට කාම සම්පත්තිය විඳගෙන ඉන්න කොට ආහාර ගන්න අමතක වෙනවා. **මිනිස්සුන්ට වගේ බඩගින්න ඉවසගෙන ඉන්න වෙලාවක්, හැකියාවක් දෙවියන්ට නෑ. බඩගින්න දැනෙන කොටම ආයු කාලය ඉවර වෙලා චුත වෙනවා.** මනුස්සයින්ට බඩගින්න ඔරොත්තු දුන්නට දෙවියන්ගෙ අවසානය තමයි බඩගින්න කියන්නෙ. මේ නිසා බඩගිනි වෙන්න කලින් අමෘතය අරගෙන ඉන්න ඕන. එක සැරයක් අරගත්තම හත් දවසකට විතර ප්‍රමාණවත්. සමහර විට කාම සම්පත්වලට ගිජු වෙලා ඉන්න කොට දින 7 දන්නෙම නැතිව ගෙවෙනවා. එතකොට චුත වෙනවා. බඩගින්න හැදුනට පස්සෙ නැවතත් ගිහින්, මට කෑම කාල එන්න ඕන කියල වෙලාවක් නෑ. ඒ සියුම් ශරීරවලට බඩගින්න මිනිස්සුන්ට වගේ දරාගෙන ඉන්න බෑ. අමෘතය ක්‍රියාත්මක වුණාට දින 7 කටයි තැන්පත් වෙන්නෙ. කාම සම්පත්තියේ ඇලිල ඉන්න කොට සමහර දෙවියන්ට ඒ කාල සීමාව මතක නැති වෙලා ඉක්මවා යනවා. මනුස්ස ලෝකයේ වගේ අතර මග ටික ටික බඩගින්න එන්නෙ නෑ. ක්ෂණිකව බඩගින්න එනවා, වටපිට බලන කොට කාලය ඉවරයි. මේ නිසා දෙවියන්ට අමෘතය ගත්තම අහවල් දවස වෙන්න පෙර නැවතත් අමෘතය ගන්න ඕන කියල, හරි සෝදිසියෙන් ඉන්න වෙනවා. බඩගිනි වෙන්න කල් තියා අමෘතය ගන්න වෙනවා. නැත්නම් බඩගින්න එනකල්ම දන්නෙ නෑ. මේ තමයි දෙවියන්ගෙ සූක්ෂම කයේ හැටි.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, දෙවියන්ගෙ ආහාරය අමෘතය නම්, දේව පූජා තියන කොට පළතුරු, කැවිලි ආදියේ සුවඳ ආග්‍රහණය කරල ජීවත් වෙන දේව කොටසක් ගැන කියවෙන්නෙ ඇයි කියල. මොකද මල් සුවඳට, මුල් සුවඳට, ගෙඩි සුවඳට, පොතු සුවඳට



අරක්ගත් ගන්ධබ්බ දෙව් දේවතාවන් ඒ ගන්ධය ආග්‍රහණය කරල ජීවත් වෙනවයි කියල දහමෙත් සඳහන් වෙනවා. නමුත් මේ කාරණය අදාල වෙන්නෙ සේවක දේව කොටස්වලට මිසක් ඉහළ මහේශාක්‍ය දෙවියන්ට නෙවෙයි. ගන්ධයේ එල්බ ගෙන ඉන්න ගන්ධබ්බ දේවතාවො කියන්නෙ මහේශාක්‍ය දෙව්වරුන්ගෙ සේවක පිරිස්. ආකාස දේවතාවො, භූමාටු දේවතාවො, රුක්ෂ දේවතාවො ආදී නම්වලින් හඳුන්වන්නෙ ඒ සතර වරම් දෙව්වරුන්ගෙ සේවක පිරිස්. ඒ අයට දෙවියන් නොකියා දේවතාවො කියල කියන්නෙත් ආවතේව කරන නිසා. ඒ අයගෙ ආහාරය තමයි අර සුවඳ. ඒ සේවක දේව කොටස් ඉහළ දෙවියන් තරම් කාමයට ගිජු නෑ. ඒ වගේම ඒ අයට ඉල්ල ගෙන කන්න ටික වෙලාවක් හරි තියෙනවා. ඒ අය අමෘතයෙන් නෙවෙයි ජීවත් වෙන්නෙ, මිනිස්සු පූජ කරන දේවල් හෝ මේ ලෝකයේ තියෙන සුවඳ ආග්‍රහණය කරල. ඒ කියන්නෙ මල්, මුල්, පළතුරු ආදී සුවඳ. විෂ්ණු, කතරගම... ආදී ප්‍රධාන දෙව්වරුන්ගේ ආහාරය අමෘතය නිසා, ඒ අයට මිනිස්සු පූජ කරන පූජා වට්ටිවල තියෙන ආහාර ඒ අය නොගත්තට තමන්ගෙ සේවක දේවතාවන්ට බෙදල දෙනවා.


ඒ වගේම ඒ පහළ දේව කොටස්වලට දරුවො ඉන්නවා. ඒ කියන්නෙ චාතුර් මහා රාජිකයෙ සේවකයො. අපේ ඥාති හිත මිත්‍රාදීන් මැරුණම ඥාති ප්‍රේත කියල කියන අයත් ඒ සේවක පිරිසට අයිති වෙනවා. ඒ වගේම මිය ගිය අය ගන්ධබ්බ අවස්ථාවල ඉඳන් මිනිස්සුන්ට ආවේස වෙලා තමයි, ඔය දේවාල හදාගෙන සාස්තර කියනව කියන්නෙ. මොකද ඒ අයට වරම් තියෙනවා. ඒ කියන්නෙ දෙවියන්ගෙ සේවකයො, දෙවියන්ගෙ පාලනය යටතේ ඉන්න අය. කෙනෙක් මළාට පස්සෙ මනුස්ස ගන්ධබ්බ වුණොත් සතර වරම් දෙවියන්ගෙ පාලනයට වැටෙනවා. නමුත් යහපත් ගන්ධබ්බයො ඒ වගේ හුඟ කලක් ඉන්නෙ නෑ. චුත වෙලා සුගතියක උප්පත්තියට යනවා. අනෙක් අය ඒ මට්ටම්වලට අනුව සතර වරම් දෙවියන්ගෙ පාලනය යටතේ කාලයක් ඉන්නවා. එහෙම ඉන්න කොට දේව කොටස් යටතේ තමයි පාලනය වෙන්නෙ. මනුස්ස මට්ටමේ සංඛාරයන් තිබුණට මනුස්ස කය නෑ. ඉතින් කාගෙ හරි යටතෙ පාලනය වෙන එකත් දුකක්. මොකද ඒ අය කියන විදියට ඉන්න ඕන.

උදාහරණ විදියට ජනවසභ කියන්නෙ බිම්බිසාර රජතුමා චුත වෙලා ගිහින් ඉපදිච්ච ගන්ධබ්බ දේවතාවා. ඔහු වෛශ්‍රවණ දෙවියන්ගෙ සේවකයෙක්. ඒ අයගෙ ආහාරය අමෘතය නෙවෙයි. අවශ්‍ය නම් ඒ අයට ඉහළ දෙවියන්ගෙ මාධ්‍යයෙන් ඉල්ලගෙන කන්නත් පුළුවන්. සමහර වෙලාවට ඒ අයට ඉහළ දෙව් කොටස් හරහා යන්න බෑ. මොකද තේජස් වැඩියි. මේ නිසා පහළ ඉන්න දේවතාවන්, මිනිස්සු දෙන දේවල් කාල බීල ඉන්නවා. එතනත් දුකක්. ඒ වගේම ඒ අයට දරු මුණුබුරන් ඉන්නවා. ඒ දරු මුණුබුරන්ට හරි හම්බ කරල දෙන්න ඕන. හැබැයි මෙහෙ වගේ ගොවිතැන් කරල නෙවෙයි. ඒ ලෝකෙට ගැලපෙන විදියට. ඒ කියන්නෙ පුණ්‍ය සෘද්ධි තියෙන මහේශාක්‍ය දෙව්වරුන්ට

ගැති වෙලා, පුණ්‍ය සෘද්ධි නැති අල්ප ශාක්‍ය දෙව් දේවතාවො අවශ්‍ය දේවල් ඉල්ල ගන්නවා. ඒ වගේම තමන්ගෙ ඥාති හිතමිත්‍රාදීන් විසින් මෙලොවදී දෙන දේවල් අනුව ඒ අවශ්‍ය දේවල් නිර්මාණය වෙලා එනවා. ඒ වගේම ගැබට ඇවිත් තමයි ඒ ගන්ධබ්බ දරුවො ගන්ධබ්බ ස්ත්‍රීන්ට උපදින්නෙ. ඒ අය විවාහ වෙලා ඒ ගන්ධබ්බ ලෝකයේ පවුල් පිටින් ජීවත් වෙනවා. ඒ පවුල් කොහේ හරි ගල් ගෙයක, ගස්වල විමාන වගේ තැන්වල තමයි ජීවත් වෙන්නෙ. ගන්ධබ්බෝවා (ප්‍රධාන පිරිමි), ගන්ධබ්බීවා (භාර්යාවො), ගන්ධබ්බ-පෝතකෝවා (දරුවො), ගන්ධබ්බ-පෝතිකාවා (දූරියො), ගන්ධබ්බමහා-මත්තෝවා (විශේෂ පිරිස්), ගන්ධබ්බ-පාරිසජ්ජෝවා (අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධය දරන සාමාන්‍ය පිරිස්), ගන්ධබ්බපචාරෝවා (ගන්ධබ්බ කොටසට අයිති වන්නාවූ සේවක පිරිස්) ආදී වශයෙන් ආටානාටිය සූත්‍ර දේශනාවේ මේ ගන්ධබ්බ කියන කොට්ඨාශය ගැන සඳහන් වෙනවා.

මේ නිසා ගන්ධබ්බ දේවතාවො කියන්නෙ එක පැත්තකින් මිනිස්සු වගේ කොටසක්. සමහර භූමාටු දේවතාවො ගල් ගෙවල්වල ඉන්නවා. ඒ වගේම ආකාස දේවතාවො ඉන්නවා. තවත් සමහර කොටස් ගස්වැල් ආදිය ඇසුරේ වෘක්ෂ දේවතාවන් විදියට විමානවල ඉන්නවා. මේ නිසා තමයි ඒ කාලෙ ගහක් කපන කොට ගන්ධබ්බ දරුවෙක්ගෙ අත කැපිල, බුදුරජාණන් වහන්සේ ළඟට ගෙනිච්චයි කියල දහම් කතාවක සඳහන් වෙන්නෙ. දරුව ඉන්න ගහ කපන්න එපා කියල දේවතාවිය විමානෙ ඉඳගෙන කෑ ගැහුවත්, භික්ෂූන් වහන්සේ නමක් ඒක ගණන් ගත්තෙ නැතිව ගහ කැපුවා. එතකොට ඒ දේවතාවිය, මම ඉන්න ගහ කපන්න එපා කියල ළමය ළං කළාලු. එතකොට අර පොරෝ පාරට ළමයගෙ අත කැපුණාලු. මොකද භෞතික පොරෝ පාරත් එක්කම කිරණමය පොරෝ පාරකුත් යනවා. ඒක ගන්ධබ්බ ළමයගෙ අතේ වැදුණා. ඒ වෙලාවෙදි අර දේවතාවිය සාප කළා නම් ඒ භික්ෂූන් වහන්සේ අපවත් වෙන්නත් ඉඩ තිබුණා. ඒ තරම් විශාල ශක්තියක්. නමුත් එහෙම කළා නම් පාපය එනවට බයේ, මේ දේවතාවිය කාරණය බුදුන් වහන්සේ ළඟට ගිහින් කිව්වා. නමුත් අත කැපිච්ච එකට කරන්න දෙයක් නෑ. ඒක කර්ම විපාකයක්. මේ නිසා උන් වහන්සේ දේවතා විමන් නැති වෙනත් ගහක් අධිෂ්ඨාන කරල ඒක අර දේවතාවියට පෙන්නුවා. ඊට පස්සෙ ඒ දේවතාවිය ළමයත් අරගෙන ඒ වෘක්ෂයට යන්න ගියා. දැන් මේ කාරණාවලින් පේනව විවිධාකාර අසහනයන්ගෙන්, දාහයන්-ගෙන් පෙළෙන විවිධ දේවතා කොටස් ඉන්න බව.

ඒ වගේම **දෙවියන්ට දුක දරාගන්න බැරිවුණාම අඬනවා.** මේ වගේ සිද්ධියක් 20 වන කලාපයේ පළවූ ''එදා සිටි පැරැන්නන් දේව රැකවරණය ලැබූ හැටි'' ලිපියෙන් ඉදිරිපත් කළා. මාළුවා වැලක ඇටයක් බිම වැටිල, තමන්ගෙ විමානය විනාස වෙන්න මුල පටන් ගත්තයි කියල අඬපු හැටි එහිදී විග්‍රහ කළා. දෙව් දේවතාවන්ට ඒ වගේ දේවල් දැක බලාගන්න ඉන්ද්‍රියන් එක්තරා මට්ටමක තියෙනවා. එතැනදීත් දිවැස්, දිවකන් වැඩි අයට ඈත පේනවා, සියුම් ශබ්ද ඇහෙනවා වැඩියි. අවශ්‍ය දේට යොමු කරන්න පුළුවන්



දිවැස්, පරසිත් දැකීම බලවත්. ඒ ඒ මට්ටම්වල පුණ්‍ය සෘද්ධිවල හැටියට අඩු වැඩි කොටස් ඉන්නවා. ඒ වගේම සමහර ගෙවල් ආශ්‍රිතව ඉන්න ගන්ධබ්බ කොටස්වලට දිවැස්, දිව කන් නෑ. ඒ අයට දිවැස්, දිව කන් නැති නිසා ඔත්තු බලනවා. හරියට මිනිස්සු අවට ගෙවල්වල සිද්ධ වෙන දේවල් දැනගන්න දුවල ගිහින් කණ්ඩියකට, බිත්තියකට හේත්තු වෙලා, හැංගිලා ඉඳල ඔත්තු බලාගෙන කියනව වගේ තමයි. ඉස්සෙල්ලම වෘක්ෂ දේවතා මට්ටමේ දේවතාවන් ළඟට ගිහින් ඒ අය හිතවත් කරගෙන, ඒ අයට සේවය කරල යම් යම් තොරතුරු අහගන්නවා. ඒ වෘක්ෂ දේවතාවොත් දන්නෙ නැති දේවල්, ඒ අය ලවාම සතර වරම් දෙවියන්ගෙන් අහගන්නවා. මොකද සතර වරම් දෙවියන්ට ඊට වඩා දිවැස්, දිව කන් තියෙනවා. ඒ අයගෙ දිවැසිනුත් දකින්න බැරි මට්ටමේ දේවල් සක්‍ර දෙවියන්ගෙන් අහනවා. මේ විදියට එකින් එක උඩට යනවා. ඔහොම ගිහින් මහා බ්‍රහ්මයා ළඟටත් යනවා. ඒ අයට එහෙම හැකියාවක්, සම්පත්තියක් තියෙනවා. එතකොට ඒ හැකියාව, සම්පත්තිය නැති දෙවියන්ට, තමන්ට නැහැ කියල එතනදිත් සෝකයක්, සංවේගයක් හට ගන්නවා. තියෙන අය උද්දාම වෙනවා, නැති අය සංවේගයට පත්වෙනවා. ඒ අය ලොකුවට පෙන්වනව, මගේ තත්ත්වය බලාපියව් කියල. ''මගෙ සම්පත්තිය බලාපල්ල.... උඹල කොහෙද යන්නෙ?.... කාට ආවතේව කරන්නද...?'' මේ ආදී වශයෙන් අහනවා. මොකද ඒ අයත් කැමතියි තමන්ට ආවතේව කරගන්න.

දැන් ඉතින් මේ විදියට අහනකොට සමහර දෙව් දේවතාවන් අඬනවා. හේතුව මේකයි. හොඳට සැපට හදපු පුංචි ළමයෙකුට මෙහෙ වරෙන්, උඹ..... ආදී වශයෙන් කතා කළොත් ඒ ළමයට හිත් රිදිල අඬනවා. මොකද ''මගෙ සුදු පුතා...... රත්තරං පුතා.... බේබි...'' ආදී වශයෙන් බොහොම ආදරෙන් තමයි ගෙදරදි දෙමාපියන් කතා කරන්නෙ. එහෙම හැදිච්ච ළමයෙකුට අර විදියට කතා කළොත්, අනේ මට බැන්න කියල අඬනවා. නමුත් සාමාන්‍යයෙන් අග හිඟකම් මැද්දෙ හැදිච්ච ළමයින්ට එහෙම කතා කළාට අඬන්නෙ නෑ. ඒ ළමයින් ඇට්ටර වෙලා ඒව පුරුදුයි, රිදෙන්නෙ නෑ. නමුත් අර සුඛෝපභෝගීව හැදිච්ච ළමයින්ට අර වගේ පුංචි වචනයත් රිදෙනවා. මේ වගේ දෙව් දේවතාවන්ටත් බැන්නොත් හරියට රිදෙනවා. මිනිස්සු වුණත් මෙහෙ ඉඳන් බනින කොට ඒ අයට හරියට රිදෙනවා. **ඒ වගේම තමයි මිනිස්සුන්ට කරදරයක් වෙන කොටත් බොහෝ දෙව් දේවතාවො අඬනවා.** මිනිස්සු මොනව හරි බලවත් වැරැද්දක් කළොත්, අනේ මනුස්ස ලෝකෙට වෙච්ච දේ කියල දෙවියන්ට ඒක දරාගන්න බෑ. ඒ සංඥාව අකනිටා බඹ ලොවටත් යනවා. ඒ තරම්ම දෙවියන් අතර සෝක සංවේගය වැඩියි.

ඒ කාලෙ හිටපු එක් භික්ෂූන් වහන්සේ නමක් කාම මෛථූන පාරාජිකාවට මුල පිරුවා. ඒ භික්ෂූන් වහන්සේ, තමන්ට පෙර හිටපු භාර්යාවට ළමයෙක් ලබා දෙන්න ඇය සමග සංවාසයේ යෙදුණා. බුද්ධ ශාසනය කිළිටි වුණා කියල, ඒ කාරණය මුල් කරගෙන දෙව් දේවතාවන් අඬන්න පටන් ගත්තා. ඒ විලාප හඬ අකනිටා බඹ ලොවට යන කල්ම ඇහුණාලු. **අදත් ඒ වගේ සිද්ධි දැකල දෙව් දේවතාවො කම්පා වෙලා අඬනවා.** භික්ෂූන් වහන්සේලා, මිනිස්සු දුෂ්චරිත කරනව දැක්කම, අනේ මෙච්චර වටින ☞

බුද්ධ ශාසනයට ගිය කල.... මිනිස්සු විනාස වෙනවා...., ආදී වශයෙන් නොයෙක් විදියට සෝක වෙනවා. මේ වගේ දේවල් මනුස්සයින්ට නොපෙනෙන නිසා දුක නැති වුණාට, දෙවියන්ට ඒව පේන නිසා දුකයි. මිනිස්සුන්ට දුක ඇති වෙන්නෙ යමක් දැක්කොත් තමයි. එහෙම දකින්නෙත් ඇස් දෙකට පේන සුළු මට්ටමක් විතරයි. නමුත් දෙවියන්ට විශාල ප්‍රදේශයක් එකවර පේනවා. උදාහරණයක් විදියට ලංකාව වගේ රටක් එක පාරටම බලන්න පුළුවන්. ලංකාව තුළ සිද්ධ වෙන දුක් සිද්ධි ඔක්කොම එක සැරේ දකින කොට දෙවියන්ට උහුලන්න බෑ. මේ ලෝකෙ දිහා බලන කොට නිතරම අඬා ගත්ත ගමන්මයි ඉන්නෙ. අපිට මස් ලේ ඇහැට, කනට එකක් දෙකක් පෙනුනට ඇහුනට, දිවැසින් යොමු කරල බැලුවම හැම තැනම ගහ මරාගන්න හැටි, කපා කොටා ගන්න හැටි, දූෂ්‍යකම් කරන හැටි පේනවා. ඒව දැකල විශාල සංවේගයක්, කලකිරීමක් ඇති වෙනවා. **දෙවි දේවතාවො වෙලා ඉපදුනාට පස්සෙ, අනේ අපිට මේ වගේ දේවල් අහන්න දකින්න සිද්ධ වුණානෙ කියල ඒ අයත් දුක් වෙනවා.**

ඒ වගේම තමයි බුදුන් වහන්සේ අනිච්ච, දුක්ඛ, අනත්ථ කියන මේ තිලකුණ විග්‍රහ කරන කොටත්, ''අනේ අපිටත් අද්ධුවයිලු, අපේ ශරීරත් පවතින්නෙ නැතිලු, ඉතින් අපිටත් මැරෙන්න වෙනවලු, මේක අහගන්නද අපි මෙච්චර කල් උන්වහන්සේ බුදු වෙන කල් බලාගෙන හිටියෙ....'' මේ ආදී වශයෙන් කියල අඬන්න පටන් ගත්තලු. ''අපි සාර්ථක ජීවිතයක් නෙවෙයිලු ගත කරන්නෙ, දැන් තමයි අපිට ඒක තේරෙන්නෙ, අපි මෙච්චර කල් හිතාගෙන හිටියෙ අපිට හොඳ අමරණීය ජීවිත තියෙනව කියල, නමුත් අපිට දැන් එහෙම එකක් නැනෙ! අපේ සම්පත් විනාස වෙනවනෙ! අපිට අහිමි වෙනවනෙ! අපි කැමති විදියට පවත්වන්න බැනෙ! අසාරත්වයක් මිසක් සාරත්වයක් තියාගන්න බැනෙ!'' මෙහෙම කියල දුක් වෙවී අඬන්න පටන් ගත්තලු. **ඉතින් බණ ඇහුණත් ශෝකයක්.** එහෙම දුක් වෙලා තමයි අන්තිමට ධර්මාවබෝධය ලබන දෙවි දේවතා කොටස් වුණත්, වැඩක් නැනෙ මේකෙ ඉඳල කියල අත් හරින්නෙ.

ඒ වගේම මිනිස්සුන්ට උපක්‍රමශීලීත්වය කියන එක තිබුණට, දෙවියන්ට පුණ්‍ය සෘද්ධියෙන් ලබන විපාක ක්‍රමවේදයක් විතරයි තියෙන්නෙ. ජම්බුද්වීපයේ (එනම් උතුරුකුරු දිවයින, අපරගෝයානය හා පූර්ව විදේහය යන මනුස්ස ලෝකයන් හැර අපි මේ ජීවත් වන මනුස්ස ලෝකයේ) මිනිස්සුන්ට වඩා දෙවියන් ඥානයෙන් අඩුයි. මේ නිසා සමහර මිනිස්සු ගන්න, සමහර වැරදි තීරණවලට සමහර දෙවි දේවතාවොත් දෘෂ්ටි ගත වෙලා සම්බන්ධ වෙලා විනාශයට පත් වෙන්නත් පුළුවන්.

ඊළඟ කාරණය තමයි දිව්‍ය විමන්වල දෙවියන්ටත් ඉඳ ගන්න ආසනයක් තියෙන්නෙ හිටගෙන ඉන්න අමාරු නිසා. **ඉරියව් පැවැත්වීමේදී ඒකාකාරී ඉරියව්වෙන් ඉන්න දෙවියන්ටත් බෑ. සැනසිල්ලක් ගන්න නම් ඉරියව් වෙනස් කරන්න ඕන.** එක ඉරියව්වකින් ඉඳ ගැනීම අමාරු නිසා තමයි ඉඳගන්න ස්ථාන, ආසන වෙනම තියෙන්නෙ. අපිට වගේ දරුණුවට නැතත් දෙවියන්ටත් යම් මට්ටමක මහන්සියක් දැනෙනවා. නිදිමත කියල දෙයක් නැති වුණත් වෙහෙස මහන්සිය දැනෙනවා. ඒ කියන්නෙ කායික වෙහෙස. ඒ වෙහෙස නැති කරගන්න සුළු විවේකයක් ගන්න වෙනවා. ඒකට තමයි මේ ආසන සහ නිදන යහන් තියෙන්නෙ. ඉතින් ඒකත් දුකක්.



ඒ වගේම **දෙවියෙක් තවත් දෙවියෙක් දිහා රවල බැලුවොත් ඒ දෙවිය එවෙලෙම චුත වෙනවා.** අනුන්ගෙ සම්පත්තියට තියෙන ඊර්සියාවට හෝ අනුන් එක්ක තියෙන තරහට හෝ රැව්වොත්, එහෙම රවා ගත්ත දෙන්නම චුත වෙලා, දුගතිය වගේ වෙනත් අත්බැවක උපදිනවා. මේ නිසා දේව ලෝකය කියන්නෙ හරි අවදානම් තැනක්. ගොඩක් කල් ආයුස තියෙනව කියල කිව්වත් ඒ ආයුසත් ස්ථිර නෑ. එහෙම නැත්නම් වසවර්ති මාරයට වගේ මහ ප්‍රබල පුණ්‍ය විපාකයක් තියෙන්න ඕන. එතකොට තමයි රැවීම්, ගෙරවීම්වලටත් සැහෙන කාලයක් ඔරොත්තු දෙන්නෙ. එහෙම නැතිව අනෙක් බොහොමයක් දෙවියන්ට ආයුස තිබුණත්, හරියට නිකන් ඉදිකටුව උඩ තියෙන අබ ඇටයක් පොඩි හුළඟක් ආවත් අහකට වැටෙනව වගේ ජීවිත පැවැත්ම ඒ තරම්ම අවිනිශ්චිතයි. රැව්වෙ නැත්නම් කාලයක් ඉන්න පුළුවන්. නමුත් ඒකත් අවිනිශ්චිතයි. මොකද කොයි මොහොතක ඒ වගේ සිතිවිල්ලක් එයිද කියන්න බෑ. එහෙම ආවොත් විනාසයි. ඒක දන්න නිසාම තමන්ට තරහක් එයි කියල දෙවියො හරි බයෙන් තමයි ඉන්නෙ. මේ නිසා නියම ආයු කාලය ඉන්නෙ කලාතුරකින් දෙවියෙක් තමයි. හැබැයි පහළ ඉන්න භූමාටු දේවතාවො වගේ කොටස්වලට ඒ වගේ තත්ත්වයන් යම් මට්ටමකට ඔරොත්තු දෙනවා. මනුස්ස ලෝකෙ ඉන්න ඌරට අසූචිය ඔරොත්තු දෙනව වගේ, දේව ලෝකෙ වුණත් පහළ කොටස්වලට තරහ එක්තරා මට්ටමකට ඔරොත්තු දෙනවා. නමුත් ඉහළ මට්ටම්වලට යන්න තරහ කියන එක ඔරොත්තු දෙන්නෙ නෑ.

ඊළඟට දේව අසුර කියල තවත් කොටසක් ඉන්නවා. ඒකෙ නායකයා සක්‍ර දෙවියො වගේ කෙනෙක්. වේපචිත්ති කියන්නෙ ඒ අසුර නායකයට. ඒ වගේම සුජා කියන අසුර කන්‍යාව සක්‍ර දෙවියන්ට භාර්යාව වුණාලු. ඒ නිසා තමයි සක්‍ර දෙවියන්ට සුජම්පතී (සුජාගේ ස්වාමි පුරුෂයා) කියල කියන්නෙ. මේ අසුර කියන්නෙ දෙවියන් වගේම බල තියෙන, නමුත් බොහොම හිතුවක්කාර කොටසක්. සුර කියන දිව්‍ය කොටස තමන්ගෙ සූරත්වයෙන් ගුණවතුන්ට, දෙමාපියන්ට සැලකීම්, දන්දීම්, වෙහෙර විහාර තැනීම් ආදී දස පුණ්‍ය ක්‍රියා කරල ගුණ ධර්ම වැඩීමෙන් පුණ්‍ය සෘද්ධි ලබපු අය. අසුර කියන කොටස දෙමාපියන්ට, ගුණවතුන්ට සලකනවට වඩා, වෙහෙර විහාර ආදිය හදල දෙනවට වඩා, මිනිස්සුන්ට යහපතක් වෙන්න අහස් යානා, යන්ත්‍ර සූත්‍ර, වැව් පොකුණු, මං මාවත් වගේ දේවල් හදල දීපල්ල කියල දස පුණ්‍ය ක්‍රියා දෙවනි කරල, ඒවට වඩා අර ලෞකික යහපත් දේවල් හොඳයි කියල, ඒ වගේ දේවල් කරල එක්තරා කර්ම විපාකජ සෘද්ධියක් ලබපු අය. ඔය අද කාලෙ භෞතිකවාදීන් කියන්නෙත් මේ අසුර සංඛාර වඩන අය. කොහොම හරි මේ අයත් හැම වෙලේම දැවෙනවා. මොකද සුරයන් (දෙවියන්) තමන්ගෙ තැන ගත්ත කියල. ඒ කියන්නෙ තාවතිංසයේ ඒ අසුරයන්ට අයිති මහ මෙර මුදුනෙන්, ඒ අයව පන්නල ඒ ස්ථානය සුරයන් විසින් හිමි කරගත්ත කියල. ඉතින් හැම වෙලේම යුද්ධ. දේව - අසුර හෙවත් සුර - අසුර සංග්‍රාමය කියන්නෙ ඒකට. යුද්ධෙදි එක අවස්ථාවක දෙවිවරු පැරදිලා බය වෙලා පැනල දුවනවා. අනෙක් සැරේ දෙවිවරු දිනල අසුරයො පැනල දුවනවා.

දැන් මේ සුරයන් සහ අසුරයන් ගැන කතා කරන කොට මේ ☞

දෙගොල්ලො අතර නිතරම ගැටුම් ඇති වෙනවා. සූර්ය දිව්‍ය මණ්ඩලයේ සහ චන්ද්‍ර දිව්‍ය මණ්ඩලයේ ඉන්නෙ නවග්‍රහ දේවතා කොටස් (සුර). ඒ සූර්ය දිව්‍ය මණ්ඩලයේ අධිපති තමයි සූර්ය දිව්‍ය රාජයා කියන්නෙ. චන්ද්‍ර දිව්‍ය මණ්ඩලයේ අධිපති චන්ද්‍ර දිව්‍ය රාජයා. මේ චන්ද්‍ර සහ සූර්ය දිව්‍ය මණ්ඩල කළුවර වෙන අවස්ථා හිටි ගමන් එනවා. උදාහරණයක් විදියට සූර්යා, පෘථිවිය හා චන්ද්‍රයා ගෙන් පෘථිවිය මැදට එන විදිහට මේ තුන එක කෙළින් පිහිටියොත්, සූර්යාගේ ඡායාව පෘථිවියට වැටෙන කොට චන්ද්‍රයාගේ ඡායාව වැහෙනවා. ඒ අවස්ථාවේදී පොඩි වෙලාවක් චන්ද්‍ර මණ්ඩලය තනිකරම අඳුරු වෙනවා.

ඒ වගේම තමයි සූර්ය මණ්ඩලයත් අර වගේම ටික වෙලාවකට අඳුරු වෙන අවස්ථා එනවා. දැන් මේ විදියට චන්ද්‍ර මණ්ඩලයටයි, සූර්ය මණ්ඩලයටයි වැටෙන ආලෝකය, චන්ද්‍ර ග්‍රහණයක් හෝ සූර්ය ග්‍රහණයක් නිසා යම් විදියකින් නොලැබී ගියොත් ඒ ස්ථාන අඳුරු වෙනවා. හැබැයි මේ කියන්නෙ දස දහසක් සක්වලට ඉන්න මහ සූර්යා ගැන නෙවෙයි. එක් සක්වලක සූර්යෙක් ගැන මේ කියන්නෙ. සක්වලක සූර්යා හැදෙන්නෙ, දස දහසක් සක්වලටම පොදු මහ සූර්යාගෙන් එන ආලෝකය වැදිල පරාවර්තනය වීමෙන්. සමහර වෙලාවට ඒ එන ආලෝකයට අර වගේ ආවරණ වැටෙන අවස්ථා තියෙනවා. ඒ වෙලාවට තමයි ආලෝකය විනාඩි ගණනකට නැති වෙන්නෙ. එතකොට සූර්ය මණ්ඩලය වැහිල යනවා. එහෙම නැත්නම් චන්ද්‍ර මණ්ඩලය වැහිල යනවා. මේ වෙලාවට අර චන්ද්‍ර, සූර්ය දිව්‍ය මණ්ඩලවල ඉන්න දෙවි දේවතාවො මේ අඳුරට බය වෙනවා. එතකොට ඒ අයට කර කියා ගන්න දෙයක් නෑ. අඳුර නිසා ඒ අයගෙ වැඩ කටයුතු මොකුත් කරගන්න බැරිව යනවා. අනේ අපිට මොකද වුණේ කියල ඒ වෙලාවට බයේ තැති ගන්නවා. මේ වෙලාවට අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න බලාගෙන ඉන්න රාහු අසුරය ඇවිත් මේ චන්ද්‍ර සූර්ය දේවතාවො බය ගන්වනවා. හරියට අපි පුංචි ළමයි බය ගන්වනව වගේ. පුංචි ළමයි දවල්ට එහෙම ලේසියෙන් බය ගන්වන්න බෑ. නමුත් රෑට එහෙම එක පාරටම පැන්නොත් අඳුර නිසා බය වෙනවා. අඳුරෙ ඉන්න කොට, ඕං ගෝනි බිල්ලො එනව කිව්වම බය වෙනවා. මේ වගේ අඳුර වෙලාවට පුංචි ළමයි බය ගන්වන්න හරි ලේසියි. ඒ වගේම සමහර වැඩිහිටි අයත් රෑ අඳුරට බය වෙනවා. අඳුරට බයෙන් වට පිට බල බල යන කොට කවුරුහරි හැංගිලා ඉඳල කැලෑව හොල්ලල ඇඟට පැන්නොත් තවත් බය වෙනවා.

මේ වගේ තමයි රාහු අසුරය පිරිසත් සමග ඇවිත් අර චන්ද්‍ර සූර්ය දේවතාවො කළුවරේ ඉන්න පොඩි වෙලාවෙත් අවස්ථාවෙන් ප්‍රයෝජන අරන් බය ගන්වනවා. ඉස්සෙල්ලම ගිහින් ඒවායෙ ඉන්න නායක චන්ද්‍ර සූර්ය දේවතාවො විශාල කිරණමය අත්වලින් අල්ලගෙන හොල්ලල හිර කරනවා. එතකොට ඒ දේවතාවො උණ්ඩිවෙලා කර කියා ගන්න දෙයක් නැතිව බයවෙලා කෑ ගහනවා. රාහු අසුරයගෙ අනිත් ගෝලයොත් ගිහින් ඒ අයගෙ දේවතා පිරිස් බය ගන්වල අඩන්තේට්ටම් කරනවා. දැන් මේ විදියට බය ගන්වල, අර චන්ද්‍ර ග්‍රහණය හෝ සූර්ය ග්‍රහණය ඉවර වෙලා එළිය එන්න කලින් පැනල දුවනවා. ඒ වගේම නායකය බයේ පැනල ගියොත් අනිත් අයත් පැනල දුවනවා. ඒ විදියට මේකට එක්කෙනෙක් ප්‍රධානත්වය ගත්තට සාමූහිකව එකතු වෙලා කරන වැඩක්. හරියට මනුස්ස ලෝකය වගේම තමයි. රාහු ඉර හඳ අල්ලනව කියල කියන්නෙත් ඕකට තමයි.



මෙතනදි රාහු අසුරය කිව්වම, මහ අසුරය වෙනම කෙනෙක්. ඒ තමයි අසුර නායකයා. ඒ අය යටතේ ඉන්න තවත් පරපුරක් ඉන්නවා. මේ අයත් තිස් තුන් කෝටියක් කියල කියන විවිධ දේව කුලවලට අයිතියි. තිස් තුන් කෝටියක් දෙවි දේවතාවන් කියල කියන්නෙ සංඛ්‍යාත්මකව නෙවෙයි. දේව කුල තිස් තුන් කෝටියක් කියන එක. සූවිසි අසංඛ්‍ය සංඛ්‍යාවක් බුදුන් වහන්සේ ජීවමානව වැඩ ඉන්න කාලයේ නිවන් දැක්කයි කියන්නෙ, එතනින් මනුස්සයො හිටියෙ බොහොම ටිකයි. වැඩි හරියක් හිටියෙ දෙවි බඹුන්. එතකොට තිස් තුන් කෝටියක් කියන්නෙ පොඩි ගාණක්. ඒ වගේම දහ අට කෝටියක් දිව්‍ය බ්‍රහ්මයො ධම්ම චක්කප්පවත්තන සූත්‍ර දේශනාව අහල මගඵල ලැබුවයි කියල ධර්මයේ සඳහන් වෙනවා. එතකොට මේ කියන විදියට දෙවිවරු ඉන්නෙ කෝටි තිස් තුනයි කියල කිව්වොත් ඒක වැරදි ආකල්පයක්. මේ කෝටි තිස් තුනක් කියල කිව්වෙ දේව ලෝක හයේම තියෙන විවිධ දේව කුල. ඒ කුලවල ඉන්න දෙවි දේවතාවො අප්‍රමාණයි. ඒ කුලවලින් කතරගම, විෂ්ණු... ආදී වශයෙන් නම් කිව්වට එක්කෙනෙක් නෙවෙයි. මේ හැම කුලයකටම නායකයෙක් ඉන්නවා. ඒ නායකයගෙ නමින් තමයි ඔය විදියට කියන්නෙ. හරියට ඇමතිවරයෙක් යටතේ නිලධාරි පිරිස් ඉන්නව වගේ. ගමනක් යනකොට ප්‍රධානියා තමයි අනිත් අයත් එක්ක ගිහින් අර වගේ බය ගන්වන්නෙ. ප්‍රධානියා විරුද්ධ පක්ෂයේ නායකයා අල්ලන කොට, අනික් අයත් ගිහින් පොඩි පොඩි එවුන් අල්ලනවා. නායකයා පරාද වෙලා පැනල දිව්වොත් අනික් අයත් බයේ පැනල දුවනවා.

මෙතනදී මේ රාහු අසුරයත්, වේපචිත්ති කියන මේ සියලු අසුරයන්ගෙ මහ නායකයත්, චන්ද්‍ර සූර්ය දිව්‍ය රාජයන් ඇතුළු දේව කොටස් එක්ක තරහයි. මොකද ලෝකය බබලවන මේ අය, බුදු දම් සඟ ගුණ වගේම සක්‍ර දෙවියන් ඇතුළු අනෙක් දෙවියන්ගෙත් ගුණ කියනවා. නමුත් රාහු අසුරය ඇතුළු පිරිස ඒකට කැමති නෑ. දෙවියන්ගෙ ගුණ මාත්‍රයක්වත් තියෙන කෙනෙකුට අපි ඉන්න දෙන්නෙ නෑ කියල ඒ අයට තරහින් බනිනවා, පළි ගන්නව කියනවා. මොකද අසුරයන්ගෙ ගුණ කියන්නෙ නැති නිසා. ඒ තමයි ඒ අයගෙ හැටි.

නමුත් ආලෝකය තියෙන වෙලාවට, දෙවියන් (සුරයන්) ලඟට මේ අසුරයන්ට ළං වෙන්නවත් බෑ. ඒ වෙලාවට රාහු අසුරය හරි බයයි. මොකද නිශාචර කෙනෙක් වන රාහු අඳුරට තමයි කැමති, ආලෝකයට බයයි. මේ නිසාම රාහු අසුරයත් හැම වෙලේම කළුවර එන වෙලාවක් බලාගෙන ඉන්නවා. එහෙම වෙලාවක් ආපු ගමන් අවස්ථාවෙන් අර වගේ ප්‍රයෝජන ගන්නවා. දැන් රාහු ඉර හඳ අල්ලනව කිව්වම ඕක හුඟ දෙනෙක් අද වරද්දගෙන තියෙනවා. ඉතින් මේ කාරණය චන්ද්‍ර, සූර්ය කියන ග්‍රහලෝක සම්බන්ධයත් අරගෙන විද්‍යාවටත් අහුවෙලා තියෙනවා. නමුත් ඕක මේ රාහු කරන එකක් නෙවෙයි, මිනිස්සුන්ගෙ මෝඩ කතාවක් කියල හුගක් අය ඒක වැරදියට ගන්නවා. මේ ග්‍රහලෝක ප්‍රශ්නය ගත්තම බුදුන් වහන්සේ විතරක් නෙවෙයි, අතැඹුලක් වගේ ලෝකය

දකින ඍෂිවරුත් ඒ කාරණය දකිනවා. ඉර හඳ, ග්‍රහ තරු අතර තියෙන සම්බන්ධය දකින නිසා තමයි චන්ද්‍ර ග්‍රහණ, සූර්ය ග්‍රහණ හට ගන්න හැටි නවීන විද්‍යාවටත් පෙර නක්ෂත්‍ර විද්‍යාවෙන් පෙන්නල තියෙන්නෙ. නමුත් ඒ නක්ෂත්‍ර විද්‍යාවෙන් මෝඩ කතා කියල නෑ. රාහු ඉර හඳ අල්ලනව කියල පෙන්නුවෙත් මෝඩ කතාවක් නෙවෙයි. අර කළුවර මොහොතක රාහු අසුරයා ඇවිත් ඒ චන්ද්‍ර සූර්ය දේවතාවො බය ගන්වල අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න එකට තමයි එහෙම කිව්වෙ.

මිනිස්සු අතරත් සිරිතක් තියෙනවා, තමන්ගෙ විරුද්ධවාදියෙකුට ජයග්‍රහණයක් තියෙන වෙලාවට ඒ පැත්ත පලාතෙ යන්නෙ නෑ. තමන්ගෙ විරුද්ධවාදියගෙන් පළිගන්න, ඔහු වැටෙන කල් බලාගෙන ඉන්නවා. වැටුණට පස්සෙ ගිහින් කොටු කරල පළිගන්නවා. අසුර ගතියත් මෙන්න මේ වගේ. චන්ද්‍ර සූර්ය දේවතාවො වැටෙන කල් පළිගන්න බලාගෙන ඉන්නවා.

මේ විදියට රාහු අසුරයා ඇතුළු පිරිස ඇවිත්, චන්ද්‍ර සූර්ය දේවතාවො අල්ල ගන්න වෙලාවට තමයි බය වෙලා බුදු රජාණන් වහන්සේගෙ ගුණ සිහි කරල කෑ ගහන්නෙ. ''නමෝ තේ බුද්ධ වීරත්ථු, විප්පමුත්තෝසි සබ්බධී, සම්බාධපටිපන්නොස්මි, තස්ස මේ සරණං භවාති - බුද්ධ වීරයාණෙනි, ඔබ වහන්සේ සියලු කෙළෙසුන් කෙරෙන් විශේෂයෙන් මිදුණා. ඔබ වහන්සේට නමස්කාර වේවා. මම හිරිහැරයකට (සම්බාධයකට) පත්වුණා. එසේ වූ මට පිළිසරණ වුව මැනවි.'' මේ විදියට කියල බුදුන් වහන්සේගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වෙලාවෙදි උන් වහන්සේ ''තථාගතං අරහන්තං චන්දිමා / සූරියෝ සරණං ගතෝ රාහු චන්දං / සූරියං පමුඤ්චස්සු, බුද්ධාලෝකානු කම්පකාති.. '' ආදී වශයෙන් රාහු අසුරයාට දේශනා කරනවා. රාහු, මේ චන්ද්‍ර සූර්ය පුත්‍රයන් කියන්නෙ තථාගතයන් වහන්සේ හා අරිහතුන් වහන්සේලා සරණ ගිය උදවිය. බුදුවරු ලෝකයට අනුකම්පා කරනවා. ඒ නිසා ඒ අයට කරදර, තර්ජන නොකර ග්‍රහණයෙන් මුදා හරින්න කියල බුදුන් වහන්සේ රාහු අසුරයාට කියනවා. ඒ බුද්ධ වචන ඇහෙන කොටම රාහු අසුරයා බය වෙනවා. මොකද ඒ බුද්ධ වචනය ගණන් ගත්තෙ නැත්නම් බොහොම භයානක බවත් දන්නවා. මේ නිසා මොකද කරන්නෙ, චන්ද්‍ර සූර්ය දේවතාවො ග්‍රහණයෙන් අත හැරල දාල පැනල දුවනවා. හරියට අතරමං වෙච්ච පොඩි ළමයෙක් තාත්ත ළඟට පැනල දුවනව වගේ. ළමයෙකුට තවත් ළමයෙක් අල්ලගෙන ගහන කොට ඒ ගුටි කන ළමයා, තාත්තෙ කියල කෑ ගහනවා. කවුද ඔය අතහැරපන් කියල තාත්ත සද්ද කරන කොටම අර ගහන්න ආපු ළමයා පැනල දුවනවා. මෙන්න මේ වගේ තමයි බුදුන් වහන්සේගෙ මහ බලය ඉදිරියේ, උන් වහන්සේ මේ සිද්ධිය දැක්ක කියල දැන ගත්ත ගමන් රාහු ඒ අයව අත හැරල බය වෙලා, ලොමුඩැහැ ගැන්විලා දුවල ගිහින් වේපචිත්ති කියන තමන්ගෙ අසුර නායකයට කියනවා. නායකයත් ඉතින් කාරණය විමසනවා. මොකද මේ ලොමුඩැහැ ගැන්විලා බය වෙලා මෙහෙම ඉන්නෙ කියල අහනවා. දේවතාවො කොටු කරන්න ගිහින් මට මෙහෙම දෙයක් වුණා, බුදු රජාණන් වහන්සේ මෙහෙම ගාථාවක් කිව්වා. ඉතින් අත් හැරියෙ නැත්නම් මගේ හිස හත් කඩකට පැලෙනවා, ජීවත් වුණත් සැපයක් ලැබෙන්නෙ නෑ, ඒකයි මම මේ පැනල දිව්වෙ.... මේ ආදී වශයෙන් අඬ අඬා දුක් අඳෝනාව තමන්ගෙ නායකයට කියනවා.

දැන් එතකොට මේ වගේ සිද්ධිවලින් පේනවා, මේ දේව අසුර කුල දෙක අතරෙ තියෙන විරසක භාවය කොච්චරද, ඒ නිසා ඒ අය මානසිකව විඳින දුක් කන්දරාව කොච්චරද කියල. ඉතින් **හැම වෙලේම එක පිලක් දුර්වල වෙනකල් අසහනකාරීව අනික් පිල බලාගෙන ඉන්නවා. එක් පිලක ග්‍රහණයට අනෙක් පිල හසු වුණාම මහා බයට සංවේගයට පත් වෙලා අඬනවා.** මේ ලෝකෙ ඉන්න මිනිස්සුන්ට ඕක පේන්නෙ නැතිවට, මේ තමයි දේව ලෝකවල තියෙන යථා ස්වභාවය.

මේ මනුස්ස ලෝකයේ වගේ සිද්ධි එහෙත් නිතර වෙනවා. මෙහේ වගේ එහේ ගහමරා ගන්නෙ, කපා කොටා ගන්නෙ නැතිවට විවිධාකාරයේ අඩන්තේට්ටම් තියෙනවා. තලනවා, බැන ගන්නවා. චක්‍රායුධය වගේ දේකින් ගහන්නත් පුළුවන්. හැබැයි ඒවායින් ගැහුවට මෙහෙ වගේ කැපිල කෙටිල විනාස වෙන්නෙ නෑ. නැවත හිටිය වගේම කය නිර්මාණය වෙනවා. නමුත් භය, ත්‍රාසය තියෙනවා. වසවර්ති මාරයා ඒ වගේ චක්‍රායුධයකින් බෝසතාණන් වහන්සේටත් දමල ගහපු අවස්ථාවන් තියෙනවා. ඒක දැකල සක්‍ර දෙවියොත් බයේ පැනල දිව්වලු. දැන් මෙහෙම දුවන කොට සක්‍ර දෙවියන්ගෙ පිටේ එල්ලගෙන තියෙන ජය සංඛය තමන්ගෙම පිටේ ගැටීම නිසා හඬක් නැගෙන්න පටන් ගත්තලු. මේ නිසා පිටි පස්ස බලන්නත් බයේ තමයි පැනල දිව්වෙ. මොකද හිතල තියෙන්නෙ මාරයා තමන්ගෙ පිටිපස්සෙන් පන්නගෙන ඇවිත් තලනව කියල. නමුත් තවුතිසා භවනයට ගිහින් බලන කොට තමන්ගෙම ජය සංඛයලු මේ විදියට පිටේ වැදිල තියෙන්නෙ. මාරයා පළාතෙවත් ඇවිත් නෑ. එතකොට සක්‍ර දෙවියන්ටත් එච්චර බයක් තියෙනවා. නමුත් අපි හිතන් ඉන්නෙ සක්‍ර දෙවියො වුණාම කරන්න බැරි දෙයක් නෑ කියල. ඒ වුණත් යථාර්ථය ඕකයි. ඒ නිසා තමයි **සක්‍රයා බය වෙනව, භය තැති ගැනුම් ඇති කෙනෙක් කියල ධජග්ග සූත්‍රයේ විස්තර කරන්නෙ.** සක්බෝහි භික්ඛවේ.... භීරුච්ඡම්භි උත්‍රාසි පලායිති..... **බය වෙනවා, තැති ගන්නවා, පලා යනවා. මේ කාරණා තුන දෙවියන්ටත් තියෙනවා. ඒක මහ දුකක්. සැනසිල්ලෙ ඉන්න නෑ.**

ඒ වගේම සමහර වෙලාවට අපි කියනවා දේවතා එළි යනව කියල. එහෙම යන අවස්ථාත් තියෙනවා. දේවතාවො අධි වේගවත් ගමන් යන කොට තමයි ඒ වගේ එළිය පේන්නෙ. ඉතින් ඕක දැක්කම මිනිස්සුත් හිතනවා, අනේ අපිටත් කුරුල්ලො වගේ, දේවතාවො වගේ එළි විහිදගෙන යන්න ඇත්නම්..... අර බලන්නකො දේවතාවො එළි දාගෙන යන හැටි....! මේ ආදී වශයෙන්. නමුත් කාරණය හොයල බලන කොට මොකද වෙලා තියෙන්නෙ, වෙසමුණි කියන සතර වරම් දෙවියන්ගෙන් මේ පහළ තමන්ගෙ යටතෙ ඉන්න දේවතාවන්ට අණක් ඇවිත්, වහාම ගිහින් මෙන්න මේ පණිවිඩය අහවලාට දීල වරෙන් කියල. ඉතින් කියන සුනංගුව විතරයි. අර අණ ක්‍රියාත්මක කරන්න නිච්චි නැතිව බයේ යනවා. යන්නෙ අධි වේගයෙන්. මොකද හදිස්සිය නිසා. ඒ යන වේගෙට එළිය විහිදෙනවා. ඒ කියන්නෙ ශරීරයට සම්බන්ධ ඒ අයගෙ වාහනය හැදිල තියෙන්නෙ චිත්ත වේගයෙන් බල ගැන්වෙන්න. හැබැයි චිත්ත බලයෙන් හෙවත් පුණ්‍ය ඍද්ධියෙන් නිර්මාණය වෙන එකත් මේ සතර මහා භූතයන්ගෙ සූක්ෂම ධාතුවක්. ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන වගේ කොටස්වලින් තමයි ඒක හැදිල තියෙන්නෙ. වේගයෙන් ගමන් කරන කොට වාතයේ තියෙන ඉලෙක්ට්‍රෝනත් එක්ක ඝර්ෂණය වීම නිසා විශාල ආලෝකයක් උත්පාදනය වෙනවා. වෙනත් විදියකින් කියනව නම්, එහෙම වේගයෙන් යන කොට වායුගෝලයේ තියෙන කිරණමය අංශු ස්පර්ශ වෙනවා. කිරණවලට කිරණ ස්පර්ශ වුණාම එළිය හටගන්නවා. ඒක තමයි මේ පේන්නෙ. ඒ වගේ ක්‍රමයක් තමයි මෙතනදි සිද්ධ වෙන්නෙ. මේ වගේ හදිසි ගමනක් යන්නෙ සන්තෝසෙන් නෙවෙයි, දේව පාලක මණ්ඩලයේ අණ පනත් ගෙනියන්න. නමුත් අපි හිතන් ඉන්නෙ සන්තෝසෙන් යනව කියල. නමුත් ඒක නෙවෙයි මේ **හදිස්සියේ යන අධි වේගවත් ගමන නිසයි එළිය එන්නෙ.** ඒ නිසා තමයි ගිහින් ☞

නවතින තැන එළිය නැති වෙන්නෙ. එක පාරටම එළිය විහිදගෙන ඇවිත් නවතින කොටම එළියත් නැති වෙනවා.

දැන් ඒ වගේ හදිසි ගමනක් යන අවස්ථාවක තමයි ජනවසභ (පෙර බිම්බිසාර රජු) කියන දේවතාවා ඇවිත් බුදුන් වහන්සේට කිව්වෙ, මම මේ වෙසමුණි දෙවියන්ගෙ පණිවිඩයක් අරගෙන යන ගමන් ඔබ වහන්සේ දැකලයි මේ හදිසියෙ ආවෙ කියල. එතකොට බුදුන් වහන්සේ හමුවෙන්නම ආව නෙවෙයි. යන ගමන් හදිසියෙ තමයි ආවෙ. මොකද එහෙම නිකන් එන්නත් නිදහසක් නෑ. **චාතුර් මහා රාජිකයෙ පහළ ඉන්න උදවිය දේව කාරියට අහුවෙලා ඉන්නෙ. ඉහළින් එන අණ පනත් ක්‍රියාත්මක කරන්න ඒ අය බැඳිල ඉන්නවා, ඒව ඒ අයට පවරල තියෙනවා. ඒවට විරුද්ධ වෙන්නත් බෑ. විරුද්ධ වුණොත් දඬුවම් ලැබෙනවා.** ඒ නිසා අපි මේ හිතන් ඉන්න තත්ත්වයක් දිව්‍ය ලෝකවල නෑ. දෙව් ලොව වටිනවයි කියන එක ඇත්ත. එහෙම වටින පැත්තක් තිබුණට, විඳින්න ගියාම වැඩි හරියක් විඳින්න වෙන්නෙ මානසික දුක් කරදර. බැලු බැල්මට ලොකු සම්පත්තියක් විඳිනව කියල පේනවා. නමුත් දෙව් දේවතාවො වුණත් බොහොමයක් හිස ගිනිගත්ත ගමන් ඉන්නෙ. උඩට යන්න යන්න තමයි නිවිච්ච අය ඉන්නෙ.

මේ මනුස්ස ලෝකය වගේ පාලනයක් තියෙන තැනින් එහාට තියෙන යාමය වගේ තැන්වලට යන කොට ඒ තරම් අමාරු නෑ. හැබැයි අමාරු නැති වුණාට ඒ අයටත් හිතට දාහය දුක දනෙනවා. මොකද ඒ අය හුරු පුරුදු කරගත්තු ක්‍රමයක් තමයි, මනුස්සයන් වෙලා ඉඳෙද්දි අල්ලගෙන ජීවත් නොවීම. ඒ කියන්නෙ පංච කාමයට කැමතියි, වස්තු අල්ලන්න අකමැතියි. ඒ වුණාට මනුස්ස ලෝකෙදි අහුවෙච්ච දේකුත් තියෙනවා. ඉතින් එහෙ ගියාම අර හුරුපුරුදු කරගත් ක්‍රමය නිසා මොකුත් අහුවෙලා නෑ. ඉන්න තැනක්වත් අහුවෙන්නෙ නෑ. ඇඳක්, කොට්ටයක්, පුටුවක් තියේ නම් ඒවත් යනවා, ගමන් කරනවා. එහෙම ගමන් කරන ගමන්, මට ඉඳගන්න ඇත්නම් කියල හිතෙන කොටම පුණ්‍ය සෘද්ධියට කොහේ හරි යන පුටුවක් එනවා. නමුත් ඒකෙත් ඉඳගත්තට නැවතිලා නෑ, පුටුවත් එක්කම යනවා. ගමන යන එකමයි වැඩේ. ඒ නිසා තමයි යාමය කියන්නෙ. ඒ ලෝකෙ ඔක්කොම තියෙන්නෙ යන ගමන් කරන ඒවා. කොතනකවත් ඉඳීමක් නෑ. නිදාගන්න පුළුවන්. හැබැයි යන ගමන්. නිදාගත්ත, හාන්සි වෙච්ච ඇඳ පිටින්ම යනවා. හරියට බස් එකේ යනකොට මිනිස්සු නිදාගන්නව වගේ. ඔක්කොම යනවා. හැම වෙලේම ඔන්චිලි පදිනව වගේ. එක්තරා සුවයක් දැනුනත් අන්තිමට දුක දැනෙන කොටසක් එනවා. ''අනේ අපිට මෙහෙම වුණානෙ! අපිට අපේ කියල අල්ල ගන්න එකක් නැති වුණානෙ!'' මේ ආදී වශයෙන් දුක් වෙනවා. ඉතින් ඔහොම ඉඳල එතනිනුත් චුත වෙනවා. චුත වෙලා යන්නෙ තවත් පහළට. නමුත් ආර්ය ඵල ලබපු අය හිටියොත් චුත වෙලා එතැනින් ඉහළට යනව මිසක් ආපසු පහළට එන්නෙ නෑ, නැවතත් අර මමත්වය වැඩි වෙන්නෙ නෑ. තියෙන ටිකත් ගැලවි ගැලවි යනවා. මග ඵල ලාභීන්ට එහෙම වුණාට පෘතජ්ජන අය ගියොත් ආපහු පහළට එනවා. ඒ අයට මමත්වය නැවතත් ඕන වෙනවා. **අවසානයේ, අනේ එකක්වත් මගෙ කියල නෑනෙ කියන සිතිවිල්ල ඇවිත් දුක් වෙනවා.** මේ ලෝකෙ ඉන්න මනුස්සයින්ට වටින දෙයක් තියේ නම් ඒක තමන්ගෙ කරගන්න ඕන කියල හිතෙනවා. ඒක දූෂ්‍ය අදහසක්. නමුත් ඒ අදහසින් තාවකාලිකව මිදිල ගිහින් තමයි යාම ලෝකවල උපදින්නෙ. ඒත් ආයුස ගෙවෙන කොට නැවතත් අර තාවකාලිකව යටපත් වෙලා තිබිච්ච, ''මම, මගේ'' කරගන්න තියෙන පැරණි අදහස් එනවා. එතකොට නැවතත් මේ ලෝකෙට වැටෙනවා. ඉතින් අවසාන කාලයේ අසහනය, දුක වැඩි වෙනවා.

ඊළඟට දිව්‍ය ලෝකවල මරණාසන්න අවස්ථාව කොයි වෙලාවෙ හරි ආවම දෙවියන්ගෙ මල් මාලා පරවෙනවා. ඒ වෙලාවට දාඩිය දානවා, ශරීරය අප්‍රාණික වෙනවා. ආසනයක ඉන්න බැරිව යනවා. ඒ විදියට නොයෙක් ආකාරයෙ කරදර එනවා. **අන්තිමට මරණ බය එනවා.** මෙච්චර කලක් ආස්වාදයන්ට, කාමයන්ට ගිජු වෙලා හිටපු නිසා මරණාසන්න මොහොතෙදි වැඩි හරියක් තිරිසන් ලෝක වගේ අපායවල්මයි පේන්නෙ. ඒ වෙලාවෙදි මහා බයකින් තමයි චුත වෙන්නෙ. **ඒ චුත වීමත් එක්ක වැඩි හරියක් උපදින්නෙ තිරිසන් ලෝකවල.** මේ වගේ අවස්ථාවක් දහමේ සඳහන් වෙනවා.

එක අවස්ථාවක සක්‍ර දෙවියන්ට දෙවඟනන් 1000 ක් හිටියා. එයින් 500 ක් හිටි ගමන් අතුරුදන් වුණා. ඒ අතුරුදන් වෙච්ච 500 ගැන හොයල බලන කොට චුත වෙලා අපාගත වෙලා. ඊළඟට ඉතිරි 500 දෙනා ගැනත් බලන කොට, ඒ අයගෙත් ආයු කාලය ඉවර වෙලා තවත් දින ගණනයි ඒ අයටත් චුත වෙන්න තිබුණෙ. චුතියත් සක්‍ර දෙවියන්ටම පුණ්‍ය සෘද්ධියෙන් දකින්න පුළුවන්. ඒ වගේම ඉන්න තැනත් දකිනවා. එතකොට තවත් දරාගන්න බෑ. මොකද වේලාසනින්ම දකින නිසා. ඒ අයගෙ ආයුස බලනකොට ඒකත් ඉවර වෙන්න ඉතාම ළඟයි. දැන් ඒ අය චුත වෙලා කොහාටද උපදින්න යන්නෙ කියල බලන කොට, ඒත් අපායටමයි යන්න තිබුණෙ. ඒකත් සක්‍ර දෙවියන්ටම බලන්න පුළුවන්. එහෙම බලල සක්‍ර දෙවියො තමන්ගෙ ඒ සියලු දෙවඟනන්ට කිව්ව, හැම තැනම ගිහින් වන්දනා මාන කරල යහපත් සිතින් තමන්ටත් එක්ක පුණ්‍යානුමෝදනා කරන්න කියල. එහෙම උපදෙස් දීල, දැන් මමත් යනව කියල බුදුන් වහන්සේ හමුවෙන්න ගියා. ගිහින් බුදුන් වහන්සේ ළඟ බණ අහගෙන ඉන්න කොට මේ සක්‍ර දෙවියොත් චුත වුණා. නමුත් චිත්තප්‍රසාදයෙන් හිටපු නිසා නැවතත් සක්‍ර අත්තභවයෙම උපන්නා. ඒත් එක්කම සෝවාන් ඵලයත් ලැබුවා. නමුත් සක්‍ර දෙවියන්ට තමන් චුත වෙච්ච බව දැනුනෙ නෑ. දැනුනෙ තමන් ප්‍රබෝධමත් වුණා, කලින් තිබිච්ච අපහසුව නැතිවෙලා ගියා කියල විතරයි. එතකොට බුදුන් වහන්සේ දේශනා කරනවා, ඔබ දැන් මෙතනදිම චුත වෙලා නැවත ඒ භවයේම පටිසන්ධි ලබල ඉවරයි, ඔබට ඒ හිමිකම නැවතත් ලැබුණ කියල. මොකද චිත්තප්‍රසාදය ඒ තරම්ම බලවත් වුණා. එතකොට මේ කාරණයෙන් පෙන්නුම් කරනවා, මරණ බය දෙවියන්ටත් කොච්චර නම් තියෙනවද කියල. ඒ වගේ, ඉන්න තාක් කල් කාම දාහය කොච්චර නම් තියෙනවද? **කොච්චර සම්පත් තිබුණත් ඒ අයට සැනසෙන්න අමාරුයි, දාහය වැඩියි, තෘප්තියක් නෑ. මොකද කාමයෙන් දැවෙනවා. අනෙක් අයගෙ සම්පත් දැක්කමත් තමන්ට නෑනෙ කියල දැවෙනවා.**

දැන් ඉතින් මෙච්චර කලක් දිව්‍ය ලෝකෙ සැප සම්පත්තියක් කියල හිතන් හිටිය නම්, ඒ මේ කාරණා ගැන දන්නෙ නැතිව. මේ නිසා මිනිස්සු අනන්තවත් දිව්‍ය සැප සම්පත් ප්‍රාර්ථනා කරනවා. නමුත් එහේ ගියාට පස්සෙ තමයි වැටහෙන්නෙ, කොච්චර මුලාවකට ද රැවටුනේ කියල. ඉතින් ලෝකයේ සත්‍යය යථාර්ථය අවබෝධ කරගන්න තියෙන එකම මග, බුදු දහම වැහිල ගියාට පස්සෙ මිනිස්සු නන්නත්තාර වෙනවා, නොපෙනෙන දිව්‍ය සැප පතනවා, මුලාවට පත් වෙනවා. ඒ නිසා මේ දහම නැවතත් නැගී පවතින කාලයේ දුර්ලභව ලබපු මනුස්ස අත්තභවයෙන් ඵල ප්‍රයෝජන අරගෙන, මේ ලෝක ධාතු 31 න්ම මිදෙන ක්‍රමය දැනගෙන, නිදහස් නිවන් සුවය ලබාගන්න උත්සාහ කරන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# නිරුක්ති පටිසම්භිදා ඥානයෙන් හෙළිදරව් වන හෙළ බසේ සහ හෙළයින්ගේ මූලාරම්භය

*(පසුගිය කලාපයෙන් - ලෝකයේ භාෂාවන් හට ගත් මූලධර්මය සහ වෙනත් භාෂාවක වචනවලට හෙළ බසින් නිරුක්ති දිය හැකි ක්‍රමවේදය ....)*

හෙළ භාෂාවේ මූලාරම්භය සම්බන්ධයෙන් යම් පමණකට කරුණු හෙළි දරව් කිරීමක් පසුගිය කලාපයෙන් ඉදිරිපත් කළා. මේ ඒ පිළිබඳව කරන තවත් කරුණු පැහැදිලි කිරීමක්.

බුදු රජාණන් වහන්සේ ධර්ම දේශනා කළේ මාගධී භාෂාවෙන්. ඒ කියන්නෙ මාර්ගයේ ආදි භාෂාව. මෙතනදී මාර්ගය කියල කියන්නෙ මොකක්ද? අපි ජීවත් වෙන මේ මඟුල් සක්වල ඇතුළු හැම සක්වලක්ම කාලයකදී විනාශ වෙනවා. ලෝක විනාසය කියල ඒ විදියට මේ මඟුල් සක්වල කේන්ද්‍ර කරගෙන තියෙන දස දහසක් සක්වලම විනාශ වෙන කාලයක් එනවා. මෙන්න මේ ලෝක විනාසයේදී ඒ දස දහසක් සක්වලම විනාශ වෙලා ගියාම ඒවාට අයත් සතර අපාය, මනුස්ස ලෝකය, සියලුම දේව ලෝක හා ආභස්සර බඹ ලොවින් පහළට තියෙන බ්‍රහ්ම ලෝකත් විනාස වෙනවා. ඉතිරි වෙන්නෙ ලෝකාන්තරික නරකය සහ ද්විතීය ධ්‍යාන බඹ තල තුනෙන් ඉහළම බඹ තලය වන ආභස්සර ලෝකයේ පටන් ඉහළට තියෙන පරිත්ථසුභ, අප්පමාණ සුභ, සුභ කිණ්හක, වේහප්පල, අසඤ්ඤ සත්ත, අවිහය, අතප්ප, සුදස්සය, සුදස්සීය, අකනිටා කියන බඹ ලෝක විතරයි. ආභස්සර බඹ ලෝකයට පහළින් තියෙන බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම, පරිත්ථාභය හා අප්පමාණාභය කියන බඹ ලෝක විනාස වෙනවා.

මේ නිසා අර විනාස වෙච්ච ලෝකවල හිටපු සත්වයින්ට ඇසුරු කරන්න ලෝකයක් හෝ වස්තු සම්පත් නැති නිසා, ඒ සතුන් ක්‍රමයෙන් අහස අරමුණු කරන තත්ත්වයට පත් වෙන කාලයක් එනවා. ඒක අනුක්‍රමයෙන් අන්තඃකල්ප 20 ක් කියන කාලයකදී සිද්ධ වෙන දෙයක්. මේ කාලයේ ඇති වන්නා වූ මානසික ක්‍රම විකාශනය නිසා අහස ඇසුරු කරන්නා වූ ආභස්සර කියන බඹ තලයක අර විනාස වෙච්ච ලෝකවල හිටපු සියලු සත්වයින් උපදිනවා. (ආභ - යම්කිසි තැනක හිස් තැනක් බිහිවීම හෙවත් යමක් බිහි නොවිච්ච තැන. අස්සර - ඇසුරු කරනවා. එනම් හිස් තැන් ඇසුරු කිරීම තමයි ආභස්සර කියන්නෙ) මෙහෙම ආදී කාලයක පටන් නැවත ලෝකය ආරම්භ වෙන කාලයක් එනවා. අන්තඃකල්ප 20 ක් ගිහින් ලෝක ආරම්භය වෙලා, ඊළඟට සත්වයින්ට ජීවත්වීම සඳහා අන්තඃකල්ප 20 ක් දැන් මේ පවතිනව වගේ පවතින කාලයක් එනවා. මේ කාලයේදී, ඒ එන සසර ගමනේදී, ඒ සත්වයින්ට එක් එක් මස් ලේ කය ඇතිව දරන්න පුළුවන් තැනට එන්න, ඒ වගේම ඒ මස් ලේ කය ගෙවිල ගිහින් නැවත සැරයක් ආපහු ගොඩනගන්න... ආදී වශයෙන් මේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙන කොට, එබඳු මාධ්‍යයක ආදියේ හිටපු පුද්ගලයගෙ ආදි බ්‍රහ්ම කල්පික මනුස්සය තමයි ආභස්සර



බඹ ලොවින් ආපු මූලික බ්‍රහ්ම කල්පික මනුස්සයා කියන්නෙ. ඒ විදියට ඉපදිච්ච මේ සියලු සත්තු බ්‍රහ්ම කල්පික මනුස්සයො වශයෙන් ආභස්සර බඹ ලොවින් එන්න පටන් ගත්තා. (එහෙම ඇවිත් කාලයක් යන කොට තමයි දස අකුසල්වලින් බර වෙලා නැවතත් අපාගත සත්තු බවට පත් වෙන්නෙ.)

ඒ කාලෙ හිටපු ඒ බ්‍රහ්ම කල්පික මිනිස්සු කතා කළේ බ්‍රහ්ම භාෂාව. ඒක තමයි මාගධී කිව්වෙ. ඒ කියන්නෙ එදා **ලෝකයක් විනාස වෙලා, ඒ ලෝකවල හිටපු සත්තු ආභස්සර බඹ ලොව ඉපදිලා, නැවතත් ක්‍රමයෙන් මේ මනුස්ස ලෝකයට ආපු ඒ ආදී මාර්ගයේදී එන හැඟීම් භාෂාව තමයි සුද්ධ මාගධී කියල කියන්නෙ.** ඒක කවුරුවත් උගන්වපු එකක්වත්, හදපු එකක්වත් නෙවෙයි. මේ මිනිස්සුන්ගෙ ගති ගුණයට අනුකූලව එන හඬක් තියෙනවා. ඒකට ගති හඬ කියල කියනවා. ඒ ගති ගුණය මතු වෙන කොට ඒකට අනුරූප ගති හඬක් මතු වෙනවා. ඒ දෙක ඒකාබද්ධයි. ඒ හඬ ඇහෙන කොට ඒ ගතිය, අහගෙන ඉන්න අනෙක් කෙනාටත් එනවා. ඒකෙන් ඒ පුද්ගලය තෝර ගන්නවා, අහවලා මෙහෙම දෙයක් කිව්ව කියල. ඒක උගන්වන භාෂාවක් නෙවෙයි, හැඟීමට ගෝචර වෙන භාෂාවක්. සත්වයාගේ මූලික උරුම ස්වභාවය නිසා, ලෝක සත්වයාට චිත්ත පාරිශුද්ධියේදී මේ හැඟීම් ස්වභාවය මතු වෙලා එනවා. ඊට පස්සෙ ඒක තේරෙන්න පටන් ගන්නවා. **ඒ හැඟීම් භාෂාව මුළු ලෝකයටම පොදු භාෂාවක්.** දැන් ඉන්න සියලු සත්වයින්ගෙම භාෂාවල් කතා කරන්න ගත්තු මුල තමයි ඒ. මාගධී මූල භාෂාව කිව්වෙ ඒකයි. බුදුන් වහන්සේ ඒ මූල මාගධී භාෂාවෙන් ඒ අයට කතා කරන කොට හේතු වාසනා තියෙන අයට චිත්ත සමාධිය නැගිල ඒක වැටහෙන්න පටන් ගන්නවා. වෙන භාෂාවකින් දේශනා කළාට තේරෙන්නෙ නැති නිසයි හැමෝටම තේරුම් ගන්න පුළුවන් පොදු මූල මාගධී භාෂාවෙන් දහම් දේශනා කළේ. බුදු රජාණන් වහන්සේගෙ දේශනාවක තියෙන විශේෂත්වයක් තමයි, ඒ වගේ අවස්ථාවකදී හේතු වාසනා ඇති අය ඒකාන්තයෙන්ම උන් වහන්සේ ඉදිරියේ සමාධි ගතවීම. ඒක ක්ෂණික සමාධියක්.

ඒ නිසා දැන් අපි මොන ජාතියේ භාෂාවන් මේ භෞතිකව යම්කිසි උපක්‍රමශීලීව ගොඩ නගාගෙන තිබුණත්, උන් වහන්සේ ඉදිරියේදී ලැබෙන සමාධියට ඒ පොදු මාගධී භාෂාව වැටහෙනවා. **බුදුන් වහන්සේ නමක් පහළ වෙලා ඒක නැවත මතු කරල දෙනකල්, ඒ යටපත් වෙලා තිබුණ මූල භාෂාව මනුස්සයින්ට තේරෙන්නෙ නෑ.** ඒ නිසා ඒ භාෂාවෙන් උන් වහන්සේ කරන ධර්ම දේශනාව සත්වයින්ට පොදුවේ වැටහෙන්න පටන් ගන්නවා. මොකද හැඟීමේ අදහසින් තමයි ඒ දේශනාව කරන්නෙ. ඒක බුදුවරයන් ☞

වහන්සේලාට තියෙන විශේෂ හැකියාවක්. ඒ නිසා අපි වචන පැටලි පැටලි ගන්න අදහස්, ඒ වගේම වචන ලක්‍ෂ ගණන් එකතු කරල ගන්න අදහස්, ඉතාම සුළු මොහොතකින් මේ භාෂා ක්‍රමයෙන් දෙන්න පුළුවන්. ඒක ඉගෙන ගන්න භාෂාවක්වත්, ලියන භාෂාවක්වත්, වෙන කාටවත් හඳන්න පුළුවන් භාෂාවක්වත් නෙවෙයි. මනසට ගෝචර වන ස්වභාවයක්. ඒ ක්‍රමයට විශාල ප්‍රදේශයක අදහස් කැටි කරල ඒ මාගධී භාෂාවෙන් දෙන්න පුළුවන්. **ඒ භාෂාවෙ වචනවල අර්ථ වැටහෙන්න පටන් ගත්තොත්, ඒ මොහොතේ එක වචනයකින් විශාල අර්ථයක් වැටහෙනවා.** ඒක හැඟීම් භාෂා ක්‍රමයක්. අදහස වැටහෙනවා. නමුත් වචන වැල මොකක්ද කියල මතක නෑ. ඒ නිසා තමයි එදා බුදුන් වහන්සේ යස කුල සිටු පුත්‍රයාට වචනය අමතක වේවා, අදහස වැටහේවා කියල දහම් දෙසන කොට, කියපු එක වචනයක්වත් මතක නැති වුණත් දහම් අදහස වැටහිලා ඔහුට මගඵල ලැබුණෙ. එහෙම ක්‍රමයක් එදා තිබුණා. ඒකට කියනව සාමුක්කංසික දේශනා කියල. (ස්ව + මුඛ + උත්කර්ෂය - තමන්ගෙ මුඛය උත්කර්ෂවත් කරල කරන දේශනාව) ඒක ඉගෙන ගන්න, මතක තියාගන්න බෑ.

ඒ අවබෝධය ලබපු කෙනෙක්-ගෙන් ඇහුවොත්, බුදුන් වහන්සේ ධර්මයක් දේශනා කළාද, කොච්චර විග්‍රහ කළාද කියල, දේශනා කරපු බව කියනවා මිසක් ඒක වචනවලින් ඇහුවොත් ඒ විදියටම කියා ගන්න බෑ. ඒ තරම් දිග විස්තරයක් කළා කියල ඒක අහගෙන මතක තියාගන්න බෑ. හැබැයි අවබෝධ වෙනවා, අදහස වැටහෙනවා. වැටහිච්ච ටිකෙන් මෙන්න මේ ටික මට මතකයි කියල, ඒ වැටහිච්ච ප්‍රමාණය තමන් දන්න හැටියට, තමන් කතා කරන භාෂාවෙන් කියන්න පුළුවන්. හැබැයි වැටහිච්ච ප්‍රමාණය ඔක්කොම මුළු ජීවිත කාලයේම කියන්න ගියත්, ඒ කතා කරන භාෂාවෙන් කියන්න බෑ.

දැන් මේ කාරණය ඔප්පු වෙන පරීක්‍ෂණයක් නවීන විද්‍යාවෙන් කරල තියෙනවා. ඒක සිහිනයක් විග්‍රහ කිරීමක්. සිහිනය ක්‍රියාත්මක වෙන කොට යම්කිසි යන්ත්‍රයකට සම්බන්ධ කරල, මනසේ චලන රේඛා ගණින ක්‍රමයකින් තත්පර 8 ක චලනයක් මුල් කර ගෙන ඇති වෙච්ච විස්තරයක් තමයි ඒ. ඒ විස්තරය බලන කොට ඒ පුද්ගලයා දකල තියෙන්නෙ දවස් 2 - 3 ක වෙච්ච විශාල සිද්ධියක් වුණාට, ඒක දකින්න ගිහින් තියෙන්නෙ තත්පර 8 යි. දැන් ඒක දකල කියන්න ගියාම ඒ ඔක්කොම ටික කියාගන්න බෑ. ඒ හීනය පෙනිච්ච බවට ලකුණු කරල තියෙන්නෙ, නිදාගෙන ඉඳල ඇහැරෙන්න එන තත්පර 8 ක මොහොතකදි. ඉතින් තත්පර 8 ක සිහිනයේ තමයි මේ දවස් ගණනක සිද්ධියක් ගැබ් වෙලා තියෙන්නෙ. තත්පර 8 කින් දැක්කට ඔහුට ඒක භාෂාවකින් සම්පූර්ණ මතකයෙන් විග්‍රහ කරන්න ගියොත් මම මෙහෙම හීනයක් දැක්ක කියල, ඒකට සෑහෙන කාලයක් ගත වෙනවා. මොකද දවස් ගණනක සිද්ධියක්, නමුත් ඒක අරමුණු වුණේ තත්තපර 8 කට.

මේකට ගන්න පුළුවන් නවීන විද්‍යාවේ තියෙන තවත් උදාහරණයක් තමයි දැන් තියෙන Bluetooth (බ්ලූටූත්) තාක්‍ෂණය. ඉස්සර යම්කිසි කැසට් පටියක් වගේ තැටියක අඩංගු පැයක දෙකක දත්ත ප්‍රමාණයක්, ඒ වගේම තවත් තැටියකට පිටපත් කරන්න ඒ හා සමාන දිග කාලයක් ගතවුණා. නමුත් දැන් මේ තියෙන බ්ලූ ටූත් තාක්‍ෂණයෙන් ඒකට ගත වෙන්නෙ තත්පර ගණනක, විනාඩි ගණනක කාලයක්. ඒ විතරක් නෙවෙයි, ඒ කාලෙ තිබිච්ච තැටියක අඩංගු දත්ත ප්‍රමාණය වගේ සිය දහස් ගුණයක දත්ත ප්‍රමාණයක් මේ ක්‍රමයෙන් කෙටි කාලයකදී තවත් එකකට පිටපත් කරගන්නත් පුළුවන්.

ඒ වගේ තමයි මෙතනදිත් **සමාධි හිතකට මූලධර්මය දෙන කොට, තත්පර ගණනකදී මහ විසාල දෙයක් අවබෝධ කර ගන්න පුළුවන්.** වෙනත් කෙනෙකුට කරන්න බැරි, බුදු රජාණන් වහන්සේ නමකට පමණක් කරන්න පුළුවන් සාමුක්කංසික දේශනයක්, අනෙක් අයගෙ දේශනාවලින් වෙනස් වෙන්නෙ මේ හේතුව නිසා. මේ නිසා හේතු වාසනා තියෙන කෙනෙකුට මග ඵල අවබෝධ වෙන විදියට දේශනාවක් කරන්න, බුදුන් වහන්සේ නමකට මහ ලොකු වෙලාවක් යන්නෙ නෑ. ඒ වගේ හේතු වාසනා තියෙන අයට, එහෙම නැත්නම් දාන කතා, සීල කතා, සග්ග කතාවලින් පූර්ණ වෙච්ච අයට ආදීනව හා නෙක්ඛම්ම (නිවන ගැන) කතා තමයි මග ඵල ලබන්න හේතු වෙන්නෙ. ආදීනව කතාවෙන් අනිච්ච, දුක්ඛ, අනත්ත කියන ත්‍රිලක්‍ෂණ විග්‍රහයත්, නෙක්ඛම්ම කථාවෙන් චතුරාර්ය සත්‍යයෙන් නිරෝධයට යන හැටිත් විග්‍රහ කරන කොට නිවන දක්වාම වැඩෙනවා. ඒ ටික අවබෝධ වෙන්න තමයි සාමුක්කංසික දේශනාව කරන්නෙ. කිලිටි වෙලා හෝදපු රෙද්දක් පිරිසිදු කර රඳන් දැමීමට මෙන් සුදුසු කල මනස සුද්ධ වූ අවස්ථාවක තමයි සාමුක්කංසික දේශනාවක් කරන්නෙ. අද රදා කියන වචනය අරගෙන තියෙන්නෙත් මේ රඳන් කියන වචනයෙන්. රෙදි වර්ණ ගන්වන එක තමයි රඳන් කියන්නෙ. ඒ අර්ථයෙන් හැඳුන මිසක් අද වගේ නිගරු කළ යුතු අර්ථයෙන් නෙවෙයි මේ රදා කියන්නෙ.

එතකොට දැන් තියෙන පාලි භාෂාව කියන්නෙත්, හෙළ භාෂාව කියන්නෙත් ඒ මාගධී භාෂාව අනුව ගොඩනැගිච්ච, මේ සාමාන්‍ය භෞතික ලෝකයේ කතා කරන්න සකස් වෙච්ච භාෂාවන්. ඒ වගේම බුදුන් වහන්සේ එදා තිබිච්ච පාලි හා හෙළ භාෂාව කියන මේ දෙකම අදහස් දෙන්න යොදා ගත්තා. නමුත් අද තියෙන්නෙ බුදුන් වහන්සේ කතා කරපු හෙළ භාෂාව ඒ විදියටම නෙවෙයි. ඒකෙ මිශ්‍රණයක්. අද තියෙන පාලි භාෂාවත් එහෙමයි. එදා තිබිච්ච සුද්ධ හෙළ හා පාලි බස අද නෑ. ඒක යටපත් වෙලා අද තියෙන්නෙ මිශ්‍රණයක්. එදා තිබිච්ච සුද්ධ භාෂාව හොයාගන්න අද ලෝකයේ භෞතික සාධක නෑ. නමුත් **සිවුපිළිසිඹියාවෙන් මාත්‍රයක් හරි තියෙන ප්‍රඥා ගෝචර අයට එදා තිබිච්ච ඒ භාෂාවල හැඟීම ගන්න පුළුවන්.** හැබැයි අර මුල් සුද්ධ ගති ලක්‍ෂණයෙන් එන හැඟීම් භාෂාව එකක්. සාමාන්‍ය ලෝකයාගේ භාවිතයට ගන්න පුළුවන් විදියට හැදෙන භාෂාව වෙනම එකක්. ධ්‍යාන අභිඥාවලට ගෝචර වෙන භාෂාවක් තමයි සුද්ධ මාගධී කියන්නෙ. ඒ අදහස නීවරණ නැති මොහොතක හැර සාමාන්‍ය මනසක ස්වභාවයට දෙන්න බෑ. දූන්නට අවබෝධ කරගන්න බෑ.

එහෙනම් මේ ලෞකික ලෝකය තුළ ජීවත් වෙන, ඒ ලෞකික මානසිකත්වය තුළ ඉන්න පුද්ගලයින්ට කතා බහ කරගන්න, අදහස් හුවමාරු කර ගන්න ඊට ගැලපෙන භාෂාවක් ගොඩ නැගුණා. ඒ භාෂාව තමයි පසු කාලීනව ලෝකයාගේ භාවිතයට ආවෙ. මාගධී භාෂාවෙන් පටන් ගත්තු ගමන තුළ ඇස, කන, නාසය, දිව, කය කියන මේ ඉන්ද්‍රිය පහෙන් අයුතු අසාධාරණකම් නොකරපු මුල් කාලයේ, ඒ පහෙන් එළි කරගත්තු භාෂාවක් තිබුණා. ඒ පහ එළි වුණාට පස්සෙ එන භාෂාව තමයි පහ + එළි - පාලි භාෂාව කියන්නෙ. ඒ භාෂාව ඍෂිවරුන්ට, බ්‍රහ්මයින්ට තිබුණා.

ඊළඟට මනස කියල හය වෙනි ඉන්ද්‍රියකුත් තියෙනවා. ඒක ඒ අයට එළි කරගන්න බැරි වුණා. ඒකට බුදු කෙනෙක්ම පහළ වෙන්න ඕන. අවිද්‍යා, තණ්හා දෙකෙන් මනස සුද්ධ කරගත්තොත් මේ හයවෙනි ඉන්ද්‍රියත් එළි වෙනවා. එතකොට සියලු ආකාරයෙන් එළි වෙන නිසා ඒ හයම එළි කරගත්තු භාෂාව තමයි එළි බස - හෙළි බස - හෙළ බස කියල කියන්නෙ. එතකොට මේ හෙළ බසේ ආදි කතුවරයා කවුද කියල බැලුවොත්, අනෙක් භාෂාවල වගේ කොහෙන්වත් හොයාගන්න බෑ, කවුරුවත් දන්නෙත් නෑ. හෙළ භාෂාවෙ මුල කොතැනද, ආදි කතුවරයා කවුද කියල සෙල් ලිපියකවත් නෑ, දන්න කෙනෙකුත් නෑ. හැදුනෙ කොහොමද කියල දන්නෙත් නෑ. මොහෙන්ජදාරෝ - හරප්පා වගේ ආදි ශිෂ්ටාචාර තියෙන රටකට ගිහින් ආදීන්ගෙන් පටන් ගත්තු ඉතිහාස

කතා ඉගෙන ගත්තට, කිව්වට හෙළ භාෂාවන් තිබුණු ඒ කියන රටක්වත්, ඒ රටක සෙල් ලිපියක්වත්, සටහනක්වත් අද වෙනකල් හොයාගෙන නෑ. **ලෝකෙ කොහේවත් මේ හෙළ භාෂාව තිබුණු බවට කිසිම සලකුණක් හොයාගන්න නෑ. ඔක්කොම එන්නෙ හෙළ දිවෙන්. හෙළ දිව, හෙළ බස කියන්නෙ ඒ නිසා. හෙළ භාෂාව කතා කරපු දිව තමයි හෙළ දිව කියන්නෙ.**

මේ හෙළ භාවයේ ශ්‍රේෂ්ඨයාට සීහ හෙළ කියල කියනවා. ඒ කියන්නෙ බුදු රජාණන් වහන්සේ. **උන් වහන්සේ සීහ හෙළයද නැද්ද කියල ඇහුවම, නිරුක්තියෙන් පෙන්වන්න පුළුවන් සීහ හෙළය හෙවත් ශ්‍රේෂ්ඨ හෙළය කියල. එතනින් පස්සෙ තමයි උන් වහන්සේ දේශනා කරපු බණ අහල, රහතන් වහන්සේලා බිහි වෙලා හෙළයින් බිහි වුණේ.** ඒකෙ නායකයා තමයි සීහ හෙළයා. නායකයාගෙන් පටන් ගත්තු පරම්පරාව තමයි සිහල පරම්පරාව. **හැබැයි මේ කියන්නෙ ලේවලින්, එහෙම නැත්නම් උප්පැන්න සහතිකයෙන් එන සිහල පරම්පරාවක් ගැන නෙවෙයි.** සුද්ධ වූ හෙළ ධර්මය අහල, භය එළි කරගෙන ඒ තත්ත්වයට පත් වෙච්ච සිහල පරම්පරාව තමයි බුදුන් වහන්සේගෙ සිහල හෙවත් හෙළ පරම්පරාව. ඒ කියන්නෙ ආර්ය පරම්පරාව හෙවත් රහතන් වහන්සේලා ඇතුළු මගඵලලාභීන්. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා කියන නවීන සිවු පිරිසත් ඒ ඇසුරේ ඉඳගෙන ආපු ක්‍රම විකාශනයක්. ඒකට දෙමළ ද, මුස්ලිම් ද, ඉංග්‍රීසි ද, දැන් ඉන්න සිංහල ද කියල ප්‍රශ්නයක් නෑ. **ලෝක සම්මතයේ ඉන්න මොන ජාතිකයෙක් වුණත් මේ දහම තේරුම් ගත්ත නම්, අවබෝධ කරගත්ත නම් ඒ හෙළයෙක්.** එතකොට ඒකට හේතු වුණේ පෙළ දහම, ඒ හේතුවේ ඵලය තමයි හෙළයන් බිහිවීම.

එතකොට සාමාන්‍ය ලෝකයේ උන් වහන්සේලා ඒ භාෂාවෙන් කතා කරන්න ගත්තම, උන් වහන්සේලා ඇසුරු කරපු උපාසක උපාසිකාවන්ටත් ඒක හරි විශේෂයක් වුණා. මොකද ඒ භාෂාව හරිම මෘදුයි, කතා කරන්න කටට හරි පහසුයි. ඒ වගේම කනට මිහිරියි. මේ නිසා රහතන් වහන්සේලා ඇසුරු කරපු ඒ උපාසක උපාසිකාවොත් ඒ භාෂා ක්‍රමය ගත්තා. එහෙම අරගත්තට පස්සෙ ඒකෙන් කතා කරන්න පටන් ගත්තම, ශ්‍රේෂ්ඨ හෙළයාගේ භාෂාව හෙවත් සිහළ බස පැතිරෙන්න පටන් ගත්තා. එතකොට **බුදුන් වහන්සේ පහල වෙච්ච තැන තමයි මේ හෙළ භාෂාවේ මූලාරම්භය.** නමුත් මේක ඉතිහාසෙත් නෑ, කොතැනකවත් හොයාගන්නත් නෑ. වසර 2500 කට ඉස්සර හෙළ බසක් තිබිච්ච බවට ලෞකික චින්තනයේ කිසිම සාක්ෂියක් නෑ.

දැන් කෙනෙක් අහන්න පුළුවන්, එතකොට බුදුන් වහන්සේ පහළ වෙන්න පෙර මේ හෙළ භාෂාව තිබුණෙ නැද්ද, හෙළයො හිටියෙ නැද්ද කියල. නෑ තමයි. බුදුන් වහන්සේ පහළ වෙන කොට හෙළයෙක් තියා බෞද්ධයෙක්වත් හිටියෙ නෑ. උන් වහන්සේ බණ දේශනා කළේ බෞද්ධයින්ට නෙවෙයි, අබෞද්ධයින්ට. මොකද බුදු කෙනෙක් පහළ වෙන කොට බෞද්ධයින් නෑ. ඒ අබෞද්ධයින් අතරින් හේතු වාසනා තියෙන අය, ඒ බණ අහල බෞද්ධ වෙලා හෙළ පරම්පරාවක් බිහි වුණා මිසක්, දැන් මේ තියෙන ඉතිහාස කතාවලට අනුව හෙළයො බිහි වුණේ නෑ. මොකද **සිංහයෙක් කියන තිරිසනෙකුට දාව මනුස්සයින්ට දරුවන් බිහිවීම දැන් තියෙන නවීන විද්‍යාවට නෙවෙයි, මොනම ලෞකික දහමකටවත් ගලපන්න බෑ. ඒක මහ නීච කතාවක්.**



ඒ වගේම අපේ ගෞතම බුදුන් වහන්සේට පෙර වැඩ හිටපු කාශ්‍යප බුදුන් වහන්සේ තමයි ඒ බුද්ධාන්තරයේදී මේ හෙළ භාෂාව හඳුන්වා දීල හෙළ පරම්පරාව බිහි කළේ. නමුත් ඒ බුද්ධ ශාසනයත් කාලයක් තිබිල අතුරුදන් වෙලා අබුද්ධෝත්පාද කාලයක් ඇවිත් ඒ හෙළ බස, හෙළ පරම්පරාව වැනසිලා ගියා. නමුත් සමහර විට පෙර බුද්ධාන්තරයේදී තිබිච්ච සමහර හෙළ වචන ක්‍රමයෙන් විපරීත වෙලා, මිශ්‍ර වෙලා මිශ්‍ර සිංහල වචන විදියට ගෞතම බුදුන් වහන්සේ පහළ වෙන කොටත් තියෙන්න පුළුවන්. නමුත් ඒ සුද්ධ හෙළ භාෂාව නෙවෙයි. කලින් කලට වෙනස් වෙවී ආපු වචන. නැවතත් ඒ සුද්ධ හෙළ බස මතු කරල දුන්නෙ ගෞතම බුදුන් වහන්සේ. මේ වගේ තවත් ආපස්සට යන කොට කෝණාගම, කකුසඳ කියන බුදුන් වහන්සේලා පහළ වෙන කොටත් මේ ලෝකයේ මේ සුද්ධ හෙළ භාෂාව කතා කරන හෙළයො හිටියෙ නෑ. උන් වහන්සේලා පහළ වීමත් සමග තමයි ඉන්ද්‍රියන් භය එළිකර ගත්තු හෙළ භාෂාව බිහි වෙලා, රහතන් වහන්සේලා ඇතුලු මගඵල ලාභීන් හෙවත් හෙළ පරම්පරාව බිහි වුණේ. ඒ නිසා මේ **හෙළ භාෂාව කියන්නෙ මේ ලෝකයේ පහළ වෙන සෑම බුදුවරයන් වහන්සේ නමකම ඒ කාලෙට හඳුන්වා දෙන සුද්ධ භාෂාව.** යම් බුදුවරයන් වහන්සේ නමකගෙ ශාසනය පිරිහිලා ගිහින්, ශාසනය අතුරුදන් වෙලා නැවතත් බුදු කෙනෙක් පහළ වෙන කොට තමයි ඒ සුද්ධ භාෂාව නැවතත් ලෝකයට එන්නෙ. මේක ලෝකයේ සිද්ධ වෙන ධර්මතාවයක් මිසක් කවුරුවත් කරන දෙයක් නෙවෙයි.

හැබැයි මේ භාෂාව හැම දේකම හේතු ඵල න්‍යායට අනුකූලව ගෙතිච්ච භාෂාවක් නිසා, යම් ඵලයක් හඳුන්වන්න ගත්තු හේතුව, අදහස ඊට අනුකූල වචන මාලාවකින් ඒකෙ ගැබ්වෙලා තියෙනවා. ඒ ශබ්ද මාලාවේ අර එදා තිබිච්ච ඵලයට හේතු වෙච්ච අදහස අදත් තියෙනවා. යම් ඵලයක් ඇත්නම් ඒ ඵලයේ තියෙන නම, ඒකෙ හේතුව ගැබ් වෙලා තියෙනවා. ඒ ක්‍රමය දැනගත්තම සිවුපිළිසිඹියාවට අයත් නිරුක්ති පටිසම්භිදා ඥානය පහල වෙලා පද නිරුක්තියෙන් ඒ අදහස වරද්දන්නෙ නැතිව හොයාගන්න පුළුවන්. එහෙම එන අදහසත් නිසි ආකාරයෙන් ඒ පදයට එන නියම අදහසක්. ඒ අදහසින් ගත්තොත් දහම් අවබෝධයට හරි පහසුයි. නමුත් මේක තෝර ගන්න බැරිව තමයි අද සමහර උදවිය, මේ පදවලට නිරුක්ති කියල අමුතු ක්‍රමයක් දෙනව කියල කලබල වෙලා තියෙන්නෙ. මොකද පසු කාලීනව ලියපු කිසිම පොත පතකවත් නැති, කිසිම සාම්ප්‍රදායකට ගලපන්නත් බැරි දෙයක් නිසා.

උදාහරණ විදියට ගැරඬියා කියන්නෙ ගැරහීමයි, ඇඩියාවයි නිසා ඒ සංඛාර ගොඩනැගිල ඒක උපාදාන කර ගැනීමේ හේතුවෙන් ඇති වෙච්ච තිරිසන් උපතක් හෙවත් ඵලයක්. හැබැයි ඒක භාෂා රීතීන්ට එකඟ නැති නිසා පිළිගන්න කැමති නෑ. නමුත් පවු කරල තිරිසන් වෙනවයි කියල පිළිගන්නවා. මොකද එහෙම අහල තියෙන නිසා. නමුත් න්‍යාය ධර්මය තේරුම් ගන්න බැරි නිසා පද නිරුක්තිය පිළිගන්නෙ නෑ. හැබැයි හේතුවට අනුකූලයි ඵලය කියල බුදු දහමේ ☞

තියෙන බවත් අහල තියෙනවා. එතකොට පවු සමාන නම්, පාපයට අනුකූල හේතුවේ ඵලයත් සමාන නම්, පවු කරල උපදින ඔක්කොම තිරිසන්නුත් එක ජාතියේ වෙන්න ඕන. එතකොට හරක තිරිසනෙක් නම්, තිරිසන් හේතුව සමාන නම්, ඒ හේතුවේ ඵලය ලෙස හටගන්නා සියලුම ඵලයන් වන සත්තු ඔක්කොම හරක් වෙන්න ඕන. ඒ විදියට එක වර්ගයක් වෙන්න ඕන. නමුත් එහෙම නැතිව ඇයි මේ විවිධ සත්ව ප්‍රභේද හට ගන්නෙ?

ඒ ක්‍රමය දැනගන්න ඕන. ඒකට තමයි සාගරයක් වගේ පටිච්ච සමුප්පාදය විග්‍රහ කර ගැනීමේ චක්‍රය දීල තියෙන්නෙ. ශ්‍රාවක ඥානයෙන් ඒ කාලෙ ඒව විග්‍රහ කරල තිබුණා. එදා හෙළ අටුවා කියල තිබුණෙ ඒව තමයි. නමුත් අද හෙළ අටුවා දකින්න නෑ. මොකක්ද හේතුව? ලාභ, කීර්ති, ප්‍රශංසාවලට ගිජු වෙලා ඒ මත්තෙ හැපෙන භික්ෂු පරපුරක් බිහි වුණාට පස්සෙ මේ දහම වහ කදුරු වගේ වුණා. ඒ නිසා ඒ ක්‍රමය යටපත් වුණා. නමුත් දැන් අපි කරන කියන දේවල් තුළ ඒ තිරිසන් ගති ලක්ෂණ තියෙනව නම්, ඒ ගති ලක්ෂණ මුල් කරගෙන සතාගෙ නම කිව්වම, මේ පුද්ගලයා මේ ජාතියට පත්වෙන සතෙක් කියල දකිනවා. ඒක සුද්ධව පැහැදිලිව දැනගත්තොත් ඥානවන්තයින්ට හරි වැදගත්. නමුත් වසං කරන පුද්ගලයින්ට ඒක මහ වසක්. මොකද ඒක දැනගත්තොත් තමන්ට ලෞකික පාඩුවක්, අපහාසයක් හැටියට හිතනවා. මේ නිසා හරි දහම යට ගිහින් තමන්ගෙ වාසියට මත හදා ගන්නවා.

ගැරහීමයි, ඇඬියාවයි දෙකෙන් යුක්තව ඉන්න පුද්ගලයෙක් නම්, ඒ මනුස්සයා කවුරු වුණත්, හේතු ඵලය වශයෙන් ගැරඬියෙක් වෙනව හැර දෙවියෙක් වෙන්නද? හැබැයි බලාපොරොත්තුව දෙවියෙක් වෙන්න පුළුවන්. නමුත් බලාපොරොත්තු වුණාට වැඩක් නෑ, ගොඩනගපු හේතුවේ ඵලය තමයි ලැබෙන්නෙ. ඉතින් මේ කාරණා කියල දෙන එක බොහොම වටිනවා. නමුත් පිළිගන්න කැමති නෑ. පිළිගත්ත නම් ගැරහීමයි ඇඬියාවයි නතර කරල ගැරඬියෙක් වෙන හේතුවෙන් මිදෙනවා. එහෙම තේරුම් අරගෙන ගැරහීමයි ඇඬියාවයි අත්හැරියෙ නැත්නම් ඒකෙන් මිදෙන්නත් බෑ.

ඉතින් මේ වගේ දහම වැහිල ගියාම තේරුම් ගන්න බැරි තැන් තියෙනවා. නමුත් පද නිරුක්තිවලින් මේ කාරණා දකින්න පුළුවන්. යම්කිසි පදයක්, ශබ්දයක් කටට හුරු වෙලා දිගටම පැවතිලා එනව නම්, ඒකෙ හේතුව පද නිරුක්ති සම්බන්ධයෙන් හොයාගන්න පුළුවන්. විශේෂයෙන් එහෙම පදයක් කෘතිමව ගොඩ නගල දුන්නත් සමාජයේ භාවිතාවට එන්නෙ නෑ. ඒක උත්සාහයෙන්, වීර්යෙන් ගොඩ නගාගෙන කිය කියා ඉන්න කල් ටික කාලයක් පැවතෙනවා. නමුත් ඊට පස්සෙ ඒක ස්වභාවයෙන්ම පිහිටන්නෙ නෑ, ගෙවිල යනවා.

උදාහරණ විදියට අම්ම තාත්ත තමන්ගෙ දූවට, පුතාට හොඳ නමක් දානවා. එහෙම දාල පාසලට යවනවා. දැන් මේ විදියට දාපු නම්වලින් අවසානයේ භාවිතා වෙන්නෙ කී දෙනෙක්ගෙන් කී දෙනෙක්ගෙ නම්ද? කෙනෙකුට කලුව කියනවා. තවත් කෙනෙකුට කිරා කියනවා. අනෙකට කොටා කියනවා. මේ වගේ ඉතින් විවිධාකාර නම්. බලන කොට ඔක්කොම ඔච්චමට, කවට කමට හදපු නම්. එහෙම නැත්නම් ලේසියට හදාගත්තු නම්. ඒකෙන් කතා කරන කල් ඒ නම් දැම්මෙ කවුද කියලවත් දන්නෙ නෑ. ටික කාලයක් යනකොට අර මුල් නම අමතක වෙලා ගති ලක්ෂණයකට හෝ හැඩරුවකට හෝ භාවිතාවේ පහසුවට අනුව හෝ දාපු භාවිතා නමක් හැදෙනවා. ඊට පස්සෙ ඒක ඉතිරි වෙනවා. අන්තිමට ඒ වගේ නමක් නැති ළමයෙක් හොයා ගන්නත් අමාරුයි. සමහර විට නියම නමින් කතා කළත් අනෙක් ළමයි දන්නෙත් නෑ. නමුත් ඔච්චමින් එහෙම නැත්නම් පසු කාලීනව හදාගත්තු නමින් කතා කළොත්, ආ... ඒ අහවල් ළමයනෙ...! කියල දන්නවා. ඒ වගේ සාමාන්‍ය ජීවිතය ගත කරන බොහෝ අයටත් තමන්ගෙ මූලික නම් නෙවෙයි, විවිධාකාර නම්වලින් තමයි කතා කරන්නෙ. අත පයවල හැඩය අනුව, ශරීරයෙ හැඩය අනුව, කතා බහේ හැටියට, පහසුවට මේ වගේ විවිධාකාර ක්‍රමවලට අනුව නමක් හදා ගන්නවා. ඊට පස්සෙ ඒක බොහොම ප්‍රසිද්ධ වෙනවා.

ඒ වගේම ගස්වැල් ආදියට නම් දාන කොටත්, අපිට හිතිච්ච විදියට නම් දැම්මොත් ඒව පිහිටන්නෙ නෑ. ඒක ගොඩනැගිච්ච ගති ලක්ෂණයට අනුකූල නම මතු වෙච්ච දාට, ඒ නම දිගටම පවතිනවා. ඒ ක්‍රමයට තමයි ගස්වැල්වලට වුනත් නම් පටබැඳිල දිගටම ඒ නම්වලින් එන්නෙ. හදාගත්ත නම්වලින් නම් එච්චර කල් පවත්වන්න බෑ. උරුම නම් තමයි පවතින්නෙ. හෙළයින් විසින් දාපු නම් තියෙනව නම් ඒව කවුරුවත් හදපු ඒව නෙවෙයි. ගතියෙන් ආපු, භාවිතා කරපු නම් තමයි ඒවට හිමි වෙලා තියෙන්නෙ. ඒ නිසා තමයි ඒ නම්වලට බොහොම පහසුවෙන් නිරුක්ති දෙන්න පුළුවන් වෙන්නෙ. ඒ නිරුක්තියෙන් මූලධර්මය පෙන්වනවා. ඒක දහම් අවබෝධ කරගන්න හරි පහසුයි. යමක් හේතුඵල වශයෙන් බලාගන්න පුළුවන් පටිච්ච සමුප්පන්න දහම් ක්‍රම නිතර භාවිතා කරනව නම් මේ වගේ දේවල් පේන්න, අවබෝධ වෙන්න පටන් ගන්නවා. එතකොට ඒක ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. අමුතු විරුද්ධ නමක්, නොගැලපෙන නමක් ඒකට කියවෙන්නෙත් නෑ. ඒ වචනෙට නොගැලපෙන අදහසක් එන්නෙත් නෑ. ඒ වචනය ශබ්ද කිහිපයකින් විග්‍රහ කළත් එකම අදහස එනවා. ඒක පද නිරුක්තිවල, ශබ්ද නිරුක්තිවල තියෙන තවත් විශේෂත්වයක්. ද්‍රව්‍ය පදාර්ථ ඥානය තිබිච්ච පෙර හිටපු සෘෂිවරු ඒ කාලෙ ගස් වැල්වලට බොහෝ නම් දාල තිබුණා. අදත් බොහෝ සිංහල නම් විදියට එන්නෙ ඒව තමයි. ඒ සෘෂිවරු කියන්නෙ ප්‍රඥා පාරමිතාව පුරන මහ බෝසතාණන් වහන්සේලා.

දැන් ඉතින් මේව විවේචනය කර කර ඉන්න එක නෙවෙයි කරන්න ඕන. යමක් තුළින් ධර්මාවබෝධය ලැබෙනව නම්, පැහැදිලිවම ඒකෙන් විමුක්තිය ලැබෙන බවට හේතු තියෙනව නම් ඒක බාරගත්තම වැඩේ ඉවරයි. බුදුන් වහන්සේ දේශනා කළේ ඒ තුළින් සත්‍යය යථාර්ථය හොයා ගන්න කියල මිසක්, එක එක්කෙනාගෙ හරි වැරදි, මති මතාන්තරවලින් හොයන්න කියල නෙවෙයි. අක්ෂර, පද ප්‍රභේද, ඉතිහාසය, ව්‍යාකරණ සහිත පද හැදෑරීම, සකස් කර ගත් ව්‍යාකරණ නිරුක්ති සහිත ලෝකායත ශාස්ත්‍ර ආදිය හැදෑරීම බමුණන්ගෙ ත්‍රිවේදයට අයත් දේවල්. මේවා ආර්ය විනයේ ත්‍රිවිද්‍යාවෙන් සොළොස් කලාවෙන් කලාවක්වත් (1/16) නොවටිනා බව බුදුන් වහන්සේ පෙන්වා තියෙනවා. අංගුත්තර නිකාය (1) 292 පිටුවේ එන තිකන්ණ බමුණට කරපු දේශනාවත්, 299 පිටුවේ එන ජානුස්සෝනි බමුණට කරපු දේශනාවත් මෙතනදී වැදගත් වෙනවා. ඒ වගේම මුලදි විග්‍රහ කරපු නිරුක්ති න්‍යාය පෙන්වා තියෙන්නෙ බුදුන් වහන්සේ බවත් දීඝ නිකාය (3) අග්ගඤ්ඤ සූත්‍රයේ 136 වන පිටුවේ සඳහන් වෙලා තියෙනවා.

දැන් මේ කාරණා මේ විදියට තේරුම් ගන්න ඕන. ලෞකික උගතුන් ලෙස පෙනී සිටියත්, පෘතග්ජන නම්, දහම් අවබෝධයෙන් බාල නම්, ඒ භාෂා විශාරදයන්ගේ ව්‍යාකරණ නිරුක්ති නෙවෙයි දහම් අවබෝධයට අවශ්‍ය වෙන්නෙ. ආර්ය ධර්මයට අයත් නිරුක්ති පටිසම්භිදා ඥානයට ගෝචර වෙන නිරුක්ති ක්‍රමය තමයි දහම් අවබෝධයට ඉවහල් වෙන්නෙ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ඇස්වහ කටවහ මගින්
# ලෙඩ රෝග කරදර ඇති වන හැටි.

*(පසුගිය කලාපයෙන් - පිල්ලි යැවීම් මගින් ලෙඩ රෝග කරදර ඇති වන හැටි....)*

අපේ ඇස, කන, නාසය, දිව, ශරීරය කියන මේ ඉන්ද්‍රියන් අතරින් ඇස් දෙක කියන්නෙ ප්‍රධාන වශයෙන් කිරණ විහිදන ඉන්ද්‍රියක්. කිරණ කිව්වම චිත්ත කිරණ විතරක් නෙවෙයි, බාහිර ලෝකයට ඇස් දෙකෙනුත් කිරණ විශේෂයක් විහිදෙනවා. ඒ වගේම අපි වචන කතා කරනකොට ඒ වචන එක්ක ශබ්ද තරංග බාහිර ලෝකයට නිකුත් වෙනවා. ඒවත් විහිදිලා එක්තරා කිරණක් හැදෙනවා. දැන් මේ ඇස් දෙකෙන් හා කටින් පිටවන කිරණමය තරංග ඒ විදියට පිටවෙන්නෙ, අදාළ පුද්ගලයාගේ සිතිවිලි හා ගති ස්වභාවයන් අනුව. කෙනෙක් ඇස් දෙකෙන් යමක් දිහා බලල හිතින් යමක් හිතුවත් ඇති, ඒ කිරණ ශක්තිය විහිදෙනවා. එහෙම බලල හිතීමෙන් විතරක් නවතින්නෙ නැතිව ඒ පිළිබඳව යමක් ප්‍රකාශ කළොත්, ඒ වචනත් බාහිර ලෝකයට පිට වෙලා ශක්තියක් නිපදවෙනවා.

කොහොම හරි මේ වගේ, යම් කිසි කෙනෙක්ගෙ ඇස්වලින් විහිදෙන විස කිරණ ශක්තිය හෙවත් වස නිසා ඇස්වහ කියල දෙයක් ඇති වෙනවා. වස කියන එක තමයි වහ කිව්වෙ. ඒ වගේම කටින් පිට කරන්නා වූ වචනවලින් පිටවන විස ශක්තියෙන්, කටවහ කියල දෙයක් ඇති වෙනවා. ඇහෙන් යම්කිසි කෙනෙක් දිහා බලල ''මගෙ අම්මෝ මේක හැදිල තියෙන හැටි! මේකගෙ ලස්සන! පොඩි එකා පැලෙන්නම ලොකු මහත් වෙලානෙ! හරියට පුහුල් ගෙඩිය වගේ... '' මේ ආදී වශයෙන් එක පාරටම හිතනවා. ඒකට හුරු පුරුදු වෙලා තියෙන නිසා සමහර අයට එහෙම නොහිත, නොකිය ඉන්න බෑ. ගහක් කොළක් දක්කමත් ''මගෙ අම්මෝ මේක හැදිල තියෙන හැටි! හරි ලස්සනට කරල් හැදිල මේ බර උස්සන් ඉන්නව මදැයි! අපේ වත්තෙ නම් මෙහෙම හැදේවි...'' මෙහෙම හිත හිතා බලනවා. මේ දිහා බලල එහෙම හිතුවොත් ඒක ඇස්වහ වෙනවා. හිතපු වචන ප්‍රකාශ කරල කිව්වොත් ඒක කටවහ වෙනවා. ඒ විදියට ඇස්වහ කටවහ දෙකම එනවා.

එතකොට මේ ඇස්වහ කටවහත්, බලන කියන හැමෝගෙන්ම එන්නෙ නෑ. තමන්ගෙ හිත ඇතුලෙ තියෙන දාහ සහගත බව, දැඩි ලෝභ සහගත බව නිසා උන්ට නොවේවා, මට වේවා කියන හැඟීමත් එක්කයි මේ වගේ දෙයක් එන්නෙ. ''අරුන්ගෙ ගස්වල ගෙඩි හැදිල තියෙන හැටි! අපිට නම් හැදෙයි ඔහොම! උන්ගෙ එවුන්ට හරි ගියාට අපේ එවුන්ට තමයි... '' මේ වගේ හිතනවා, කියනවා. මට වේවා කියල නොකිව්වත්, ඒ විදියට හිතුවත් ඇති.



මේ නිසා තමන්ට තියෙන අඩුපාඩුවක් නිසා දාහයට පත්වෙමින් අනුන්ගෙ දේට පැලෙනවා. ඒකට තමයි පැලියාව (පැලීමට යාවීම) කියල කියන්නෙ. ''මූට මේක දැකල ඉන්න බෑ පැලෙන්න හදනව'' මෙහෙම අපි අතර අදත් කතා වෙනවා. ඒ කියන්නෙ අනුන් කෙරෙහි විනාස වෙයන් කියන හැඟීමෙන්, ඔහොම හැදෙන්න එපා කියනවා. ඒ හැඟීමෙන් යුක්තව බලන කොට, කියන කොට ඇස්වහ කටවහ කියල දෙයක් ඇති වෙනවා. මේක මනුස්සයින්ට, ගහකොළට විතරක් නෙවෙයි, මනුස්සයින් විසින් ඇති දැඩි කරන සතුන්ටත්, කරන කියන රැකී රක්ෂා ව්‍යාපාර ආදියටත්, ඉදිකරන ගෙවල් දොරවල් ඇතුළු ගොඩනැගිලි ආදී මේ හැම දේකටමත් බලපානවා. ඒකෙන් ඒවායේ එළදාව, දියුණුව අඩු වෙනවා.

ඒ වගේම හුඟක් පුංචි ළමයින්ට මේ ඇස් වහ කටවහ කියන එක වදිනවා. සමහර අය ළඟ තියෙන ඒ වගේ ඇස් වහ කටවහ නිසා, ගෙදරකට ආවම ඒ අයට පුංචි ළමයෙක්වත් පෙන්නන්නෙ නෑ, හංගනවා. ළමය දිහා බැලුවොත් ''අම්මේ මේ ලස්සන හොඳ පැටිය, ඒකට අපේ එවුන් තමයි කටු ගැහිල ඉන්නෙ.....'' මෙහෙම කියල ඔළුවත් අතගාල යනවා. නමුත් මේ ලස්සනයි කියල හිතුවට ඇතුලෙන් එන්නෙ දාහ සහගත අදහස්. හිත යටින් ඒ අදහස තමයි තියෙන්නෙ. එතකොට තමන්ගෙ එකාට පැත්තක් දෙනවා. අනුන්ගෙ එකාට ඊර්ෂියා කරනවා, සාප කරනවා. දැනගෙන සාපයක් වශයෙන් හිතල නොකළත්, ඒක ස්වභාවයෙන්ම එනවා. අභ්‍යන්තරයේ තියෙන දැඩි ලෝභ ස්වභාවය නිසා එහෙම එනවා. ඒක හරි තදබල දෙයක්. ඉතින් අන්තිමට ඒ ඇස්වහ කටවහ නිසා ඒ ළමය අසනීප වෙනවා, එක්කො නොවැඩී තියෙනවා, එහෙම නැත්නම් විවිධ කරදර එනවා.

☞

සමහර අය ගස්කොළන් දිහා බලල මේ විදියට හූල්ලනවා. නමුත් එහෙම බලන කියන සියල්ලන්ගෙන්ම ඇස්වහ කටවහ වදින්නෙ නෑ. ඒකට සුදුසු පුද්ගලයො කලාතුරකින්, ගමක දෙතුන් දෙනෙක් තමයි ඉන්නෙ. සමහරු ඇත්තටම අවංකවම යහපත දැකල සන්තෝසෙන් එහෙම කියන අයත් ඉන්නවා. ඒ අයගෙන් ප්‍රශ්නයක් නෑ. මොකද ඒ අය අතින් අර වගේ දාහ සහගතව යමක් දිහා බැලෙන්නෙ නෑ, කියවෙන්නෙ නෑ. නමුත් අර වගේ දාහයක් තියෙන අයගෙන් ඇස්වහ කටවහ කියල දෙයක් සිද්ධ වෙනවා. ඒ වගේම දාහය තියෙන අය සමහර විට ඒ වගේ දේපල, සම්පත් අනුන්ට හරි යන්නෙ නැති වෙන්න සසරෙදි ඒ වගේ කටයුතු කරල තිබුණ නම්, ඒ ගති ලක්ෂණවලට සමාන, පාරම්පරිකව එන යම්කිසි අමනුස්ස කොටස් ඒ පුද්ගලයන්ට සම්බන්ධ වෙන්න පුළුවන්. එතකොට ඒ අයගෙ ඒ ගති ලක්ෂණ දැනුත් පොඩ්ඩක් හරි තිබුණොත්, ඒ වගේ අමනුස්සයින් ඒ අයට අරක් ගන්නවා. ඒක පරම්පරාවෙන් එන්නත් පුළුවන්. ඉතින් ඒ වගේ අමනුස්සයින්ගෙත් බලාපොරොත්තුව ඒ ලෝකෙ දුක් විඳ විඳ ඉන්නවට වඩා, අර වගේ අනුන්ගෙ හැදෙන සම්පත්වලට සාප කරන එක. මොකද පුරුදු කරල තියෙන්නෙ ඒ වගේ දාහ සහගත ගති ලක්ෂණ නිසා. එහෙම වුණාම අර දාහ සහගත ගති ලක්ෂණ තියෙන පුද්ගලයො මාධ්‍ය කරගෙන ඒ අමනුස්සයොත් ක්‍රියාත්මක වෙනවා.

දැන් මේ වගේ ඇස්වහ කටවහ ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් එන පැරණි කතාවකුත් තියෙනවා. එක ගමක හිටපු එක්තරා මනුස්සයෙක්ගෙ ගේ පිටිපස්සෙ ලොකු කොච්චි ගහක් තිබුණා. ඒ කොච්චි ගහේ කොළ හොඳට හැදිල තිබුණා. ඒ වගේම ගහත් මහ විශාලයි. නමුත් කරල් හැදෙන්නෙ නැතිලු. ඒ ගමේ අර වගේ ඇස්වහ කටවහ තදබල විදියට තියෙන කෙනෙකුත් හිටියලු. දැන් මේ කොච්චි ගහ අයිති කෙනා ඒ බව දැනගෙන, ඒ පුද්ගලය ගෙදරට ආපු වෙලාවක මේ කොච්චි ගහ පෙන්වන්න ඕන කියල හිතුනලු. මොකද ඒ කරල් නැති ගහේ හැටි මෙහෙමයි කියල පෙන්නුවොත්, අනෙක් අතට ඒ පුද්ගලය, ගහ තිබුණට වැඩක් නෑ කරල් නැනෙ කියල කිව්වොත් එහෙම, කරල් හැදෙයි කියන බලාපොරොත්තුවෙන්. මොකද මේ ඇස්වහ කටවහ කියන එකත් දෙපැත්තටම වැඩ කරනවා. ඒ කියන්නෙ එලදාව තියෙන ගහකට කිව්වොත් එලදාව නැති වෙන්නත්, එලදාව නැති ගහකට කිව්වොත් එලදාව හැදෙන්නත් බලපානවා. හැබැයි එලදාව නැති ගහකට කිව්වම එලදාව හැදෙන්න හේතු වෙන්නෙ, ඒකෙන් තමන්ටත් වාසියක් වෙනවනම් සහ ඒ බලාපොරොත්තුවෙන් කිව්වොත් තමයි. මොකද එතකොට කාරණා 2 ක් සිද්ධ වෙනවා. එකක් මනස මුල් වෙලා එන කිරණ, අනුන්ගෙ සම්පත් වැනසී යාවා කියන දාහ සහගත අදහසින් නෙවෙයි ඒ අවස්ථාවෙදි එන්නෙ. තමන්ටත් වාසියක් ලැබෙන නිසා, එලදාව ලැබෙන්න කියන අදහසින්මයි එන්නෙ. ඒ වගේම ඒ පුද්ගලයට සම්බන්ධ අර වගේ අමනුස්ස කොටස් ඉන්නව නම්, ඒ අවස්ථාවෙදි ඒ පුද්ගලයගෙ අදහසට අනුකූලව ඒ අමනුස්සයොත් ක්‍රියාත්මක වෙලා, ඒකට සහයෝගයක් ලැබෙන විදියට ක්‍රියා කරන්න පුළුවන්. මොකද තමන්ගෙ කෙනාට වාසියක් වෙනවට අමනුස්සයොත් කැමතියි.



කොහොම හරි අර ඇස් වහ කටවහ තියෙන මනුස්සය මේ ගෙදරට ආවම ඒ ගෙදර මනුස්සය, යංකො අපි පොඩි ගමනක් කියල ගේ පිටිපස්ස පැත්තට යන ගමන් අර කොච්චි ගහත් පෙන්නන්න එක්කගෙන ගියාලු. කොච්චි ගහ දැකපු ගමන් ඒ මනුස්සය මෙහෙම කිව්වලු. ''අප්පුහාමිගෙ කොච්චි ගහම මදැයි කරල් නැතිවට! ගහේ හැටි පේනව නේද!'' ඒ කියපු දවසෙම හවස් වෙද්දි ගහ මැරුණලු. දැන් එක්කගෙන ගිහින් පෙන්නුවෙ වෙන කාරණයකට. නමුත් සිද්ධ වුණේ තව එකක්. ඒකෙන් අර තිබ්බ ටිකත් නැති වුණා. ඒ කියන්නෙ අර මනුස්සයගෙ අභ්‍යන්තරයේ තියෙන දාහ සහගත බව නිසා එහෙම නොකිය ඉන්න බෑ. ඒ ගහේ කොච්චි හැදුනයි කියල තමන්ට වැඩක් නැති බව දන්නවා. තමන්ට එල ප්‍රයෝජන ගන්න ඇවිත්, ප්‍රයෝජනයක් නැති වුණාම තමයි ඒ වගේ වචන පිට වෙන්නෙ. එහෙම නැතිව තමන්ටත් ප්‍රයෝජනයක් වෙනව නම් කියවෙන්නෙ, ''ගහ ලොකුවට තිබුණට වැඩක් නැනෙ, කරල් නැනෙ...'' ඔය වගේ අදහස් තමයි. ඉතින් අනුන්ගෙ දේකින් තමන්ට එල ප්‍රයෝජනයක් නැති නිසා, හද පත්ලෙන්ම නොදැනුවත්වම හරි එහෙම අදහසක් පිට වෙනවා. පටිච්ච සමුප්පන්නව මනස මුල් වෙලා තමයි මේ වගේ අදහස් මතු වෙන්නෙ. **කට බොරු කිව්වත් දිව බොරු කියන්නෙ නෑ කියල එන පැරණි කියමනෙන් කියන්නෙත් මේ වගේ දෙයක්. ඒ කියන්නෙ ඇත්තටම හිතේ තැන්පත් වෙලා තියෙන අදහස තමයි එන්නෙ. ඒක පාලනය කරගන්න බෑ.**

ඒ වගේම මේ ඇස්වහ කටවහ කියන එකත් අපි හිතනවට වඩා වෙනස්, හරි භයානක දෙයක්. කොහෙන් හරි කර්ම විපාකයක් එක්කත් සම්බන්ධයි. ඒව හැමෝටම යම් යම් ප්‍රමාණවලින් තියෙනවා. ඒ වගේම වස් කවි ගත්තමත් එතනත් එක්තරා කටවහක් සම්බන්ධයි. සමහර විට ඒ වස් කවිය සමග ඒක කියන පුද්ගලයගෙ කටවහත් සම්බන්ධයි. මොකද අනුන්ට වස් කරන වස් කවි කියන්නෙත් අර වගේ නරක අදහස් තියෙන පුද්ගලයොමයි. හොඳ හිතකින් ඒ වගේ දෙයක් කරන්න බෑ. ඉතින් වස් කවියක් කිව්වට පස්සෙ හේතු තියේ නම් කොහේ හිටියත් වදිනවා. සමහර මන්තර කියන ඒවත් ඒ වගේමයි. ගස්වලට වතුර දාල මන්තරය කියල අත ගෑවම ගහ විනාස වෙලා යන මන්තරත් තියෙනවා. ඒ වගේම ඒවත් එක්ක අමනුස්ස බලවේගත් ක්‍රියාත්මක වෙන අවස්ථා තියෙනවා.

මේ විදියට මේ මන්තර ක්‍රම ක්‍රියාත්මක වෙන බවට සාක්ෂියක් පැරණි සිද්ධියකින් පෙන්වන්න පුළුවන්. හරකෙකුගෙ ශරීරයෙ තුවාල දාල, පණුවො ගහල ඔඩු දුවපු අවස්ථාවක, ඒ පණුවො අහක් කරල හොඳ කරන්න මන්තර ක්‍රමයක් දන්න කෙනෙක් එක්තරා ගමක හිටියා. ඒ පුද්ගලයට ඒ සඳහා හරක ඉන්න ස්ථානයට යන්න අවශ්‍ය වුණේ නෑ. හැතැප්ම 50 - 60 ක් දුරින් හිටියත් ඒක කරන්න පුළුවන්කම තිබුණා. ඉතින් යම් කිසි හරකෙක් අයිති කෙනෙක් ඔහු මුණ ගැහෙන්න ගිහින්, මගෙ හරකගෙ මෙහෙම තුවාලයක් තියෙනව කිව්වට පස්සෙ, ඒ පුද්ගලය කාරණා 3 ක් විමසනවා. ඒ තමයි හරක අයිති කෙනාගෙ නම, හරකගෙ පාට සහ තුවාලය තියෙන්නෙ වම් පැත්තෙද දකුණු පැත්තෙද කියන කාරණා. දැන් මේ කාරණා ටික දැනගෙන අබ ටිකක් අරන් මන්තරයකින් මතුරනවා. අප්පුහාමිගෙ හරකගෙ වම්පස තුවාල... ඔය ආදී වශයෙන් තමයි පටන් ගන්නෙ. ඒ කියන්නෙ හරක අයිති කෙනාගෙ ☞

නම මුලට දානවා. මේ විදියට අබ ටික කිහිප වතාවක් මතුරල රත් වෙච්ච කබලකට දානවා. එච්චරයි කරන්නෙ. ඒ ටික කරල දූන් හරි කියනවා. ගෙදර ගිහින් බලන කොට අර අබ පුපුරපු ගාණට හරකගෙ ඇගේ හිටපු ඔක්කොම පණුවො ටික පුපුරල වැටිල තියෙනවා. පණුවො වැඩියෙන් ඉන්නව නම් අබ වැඩියෙන් දානවා. ඒකෙන් ඒ හරකගෙ තුවාල හොඳ වෙනවා. හරකට විසක් නෑ. නමුත් පණුවන්ට හරි විසයි.

දූන් මෙතනදි වැදගත් කාරණයක් තියෙනවා. මේ අවස්ථාවේදී ඒ පුද්ගලය කොච්චර ඈතක හිටියත්, ඒ කිරණ ශක්තිය අදාල ස්ථානයට එල්ල වෙනවා. එතකොට මේ වගේම මිනිස්සුන්ට හෝ මිනිස්සු ඇසුරු කරන ද්‍රව්‍ය වස්තුවලටත් මෙහෙම කරන අවස්ථා තියෙන්න පුළුවන්. නම්, ගම් අරගෙන එල්ල කළාම අර වගේ කිරණ ශක්තිය ගිහින් පුද්ගලයින්ටත් වදිනවා. ඉතින් එහෙම වුණොත් ඒක හරිම භයානකයි. ඒකෙන් මහ අයහපතක් වෙනවා.

කොහොම හරි ඇස්වහ කටවහ වගේම, අමනුස්සයොත් එක්ක සම්බන්ධ වීම නිසා හෝ අක්ෂර, ගණ බලවත්වීම නිසා හෝ ලොකු කුඩා භේදයක් නැතිව හේතු තියේ නම් මේ බලපෑම හැමෝටම ක්‍රියාත්මක වෙනවා. සර්පයා ලොකුයි පුංචියි කියල විසේ අඩුවක් නෑ වගේ. ඒ වගේම තමයි වැඩිහිටි, පොඩි ළමයි කියල නෑ මේ ඇස්වහ කටවහ කියන එක වදිනවා. ගස්වැල්, පුද්ගලයො, ව්‍යාපාර, ගොඩනැගිලි මේ ඔක්කොටමත් බලපානවා. ඒ නිසා තමයි ඉස්සර ඉඳන් එන සිරිතක් විදියට, අලුත හදාගෙන එන නිවසක පේන තැනක පුහුල් ගෙඩියක් එල්ලන්නෙ. එතකොට ඇස්වහ කටවහ තියෙන කෙනෙක්, ගේ දිහා බැලුවම එක පාරටම පේන්නෙ අර එල්ලල තියෙන පුහුල් ගෙඩිය. ඒ නිසා වැඩිකල් යන්න පෙර ඒ පුහුල් ගෙඩිය කුණු වෙලා ඕජස් වැක්කෙරෙන්න ගන්නවා. මොකද අර ඇස්වහ කටවහ කියන විස වදිනකොට, ඒක ගෙට නොවැදී පුහුල් ගෙඩියට තමයි වදින්නෙ. ඒක යම් කිසි උපක්‍රමයක්. හැබැයි කඩවල විකුණන්න තියෙන පුහුල් ගෙඩි නිකන් තිබ්ල අන්තිමට පුළුං වෙවී යනව මිසක් අර වගේ කුණු වෙන්නෙ නෑ. එතනින් වෙනස හඳුනගන්න පුළුවන්. අලුත් ගෙයකට තමයි මේක බොහෝ විට කරන්නෙ. මොකද පරණ ගෙවල් නම් ඉතින් මිනිස්සු ඒක දිහා බලලම ගාණක් නෑ. නමුත් අලුතින් හදපු ගෙයක්, එහෙම නැත්නම් හදාගෙන එන ගෙයක් දැක්කම මිනිස්සු ඒ දිහා බලල හූල්ලනවා. ඒ නිසා එහෙම ගෙදරක තමයි එල්ලන්නෙ. ගේ දිහා බලන කොට ඉස්සෙල්ලම අර පුහුල් ගෙඩිය දකල තමයි දෙවනුවට ගේ දකින්නෙ.

ඒ වගේම සමහර උදවිය ගේ ඉස්සරහ යක්ෂ වෙස් මුහුණු ආදියත් එල්ලනවා. මේ සඳහා ගරා යක් මුහුණු කියල ඒවට ගැලපෙන වෙස් මුහුණු තියෙනවා. එතකොටත් ඒ යක්ෂ වෙස් මුහුණු තමයි ඉස්සෙල්ලම දකින්නෙ. මෙතනදි තමන්ගෙ බලයට විරුද්ධ බලවේගයක් තමයි ඒ වෙස් මුහුණෙන් එන්නෙ. එතකොට අර ඇස්වහ කටවහ කියන විස එන්නෙ නැතිව යනවා. දූන් මෙතනදි **පුහුල් ගෙඩිය හෝ යක් මුහුණ ඉස්සෙල්ලම එක පාරටම දකින කොට ඒ පුද්ගලයගෙ මනස වෙනස් වෙනවා.**




**එතකොට හූල්ලන්න හෝ පුදුම වෙලා ඒ දිහා බලා ඉන්න හිතෙන ගතිය, ඒ පුහුලය හෝ යක් මුහුණත් සමගම නැති වෙලා යනවා.** එක පාරටම මනසෙ වික්ෂිප්ත භාවයක් ඇති වෙනවා. එතකොට ඒකට තියෙන දාහ ගතිය යටපත් වෙලා ඒ බලවේගය නැති වෙලා යනවා. මේ නිසා දෙවන වතාවට හිතල ආයාසයෙන් එහෙම දාහයක් ගන්න බෑ. ගහෙන් ගෙඩි එන්න වගේ, වෙඩිල්ල පත්තු වෙනව වගේ එක පාරටම හද පත්ලෙන්ම නැගිල පිටවෙන දෙයක් තමයි මේ ඇස්වහ කටවහ විදියට බලවත් වෙන්නෙ. එහෙම නැතිව හිත හිතා කිව්වට ඇස් වහ කටවහ වදින්නෙ නෑ. අභ්‍යන්තරයෙන්ම නැගිල ආවොත් තමයි ඒක වදින්නෙ. සාපයක් වුණත් නැගෙන්නෙ එහෙමයි. ඒ වගේම සමහර ගෙවල්වල ඉදිරිපස, නිතර පේන තැනක 'බුදු සරණයි, දෙවි පිහිටයි....' ආදී වශයෙන් සටහන් කරල තියෙන්නෙත් මේ ඇස් වහ කටවහ වැදීමෙන් ආරක්ෂා කරගන්න. ඒකත් යහපත් පැත්තට යොදපු උපක්‍රමයක්.

දූන් මේ ඇස්වහ කටවහ නිසා යම්කිසි වෙළඳ භාණ්ඩයක් වුණත් කෙනෙකුට ඉස්සෙල්ලම අලෙවි කරන කොට ඒක ඉදිරි ලැබීමට බලපානවා. මේ නිසා සමහර කඩ හිමියො උදේ පාන්දර තමන්ගෙ කඩේට ඉස්සෙල්ලම බඩු ගන්න කියල, යම්කිසි අත් ගුණයක් තියෙන තමන් දන්න හඳුනන විශ්වාස කෙනෙක් තෝර ගන්න අවස්ථාත් තියෙනවා. සමහර කඩ හිමියො එහෙම නැත්නම් කඩේ අරින්නෙත් නෑ. එක්කො භාණ්ඩ අලෙවි කරන්නෙ නෑ. මොකද සමහර අයට ඉස්සෙල්ලම බඩු අලෙවි කළාම එදාට ආදායම බොහොම පිරිහෙනවා. ඒ වගේම සමහර අයට අලෙවි කළාම බඩු සීඝ්‍රයෙන් අලෙවි වෙලා හොඳ ආදායමක් ලැබෙනවා. දූන් මේ ඔක්කොම අත්දැකීම් බොහෝ කාලයක් කඩ කරන කඩ හිමියන්ට තියෙනවා. ඒක දූනගෙන සමහර අය මොකද කරන්නෙ, කල් තියාම තමන් දන්න හඳුනන කාට හරි කියනවා, උදේට ඇවිත් සීනි තේ කොළ ටිකක් හරි අරගෙන යන්න කියල. අර වගේ ඇස් වහ කට වහ තියෙන අය එන්න පෙර වෙළඳාම් කරන්න, උදේ පාන්දර කඩේ ඇරියම සමහරු එහෙම විශේෂයක් කරනවා.

ඒ වගේම සමහරු හරි කැමතියි, උදේ පාන්දර කඩේ අරින කොට යම්කිසි කෙනෙක් කිරි අරන් එනව නම්. මේ නිසා ඒ වගේ අයට උදේ පාන්දරින්ම එන්න කියනවා. මොකද උදේට පිරිච්ච කිරි බඳුනක් දැකීම යම් කිසි සුබ ලකුණක් විදිහට සලකන නිසා. ඒ වගේ දේවල්වල යම්කිසි ඇත්තකුත් තියෙනවා. නමුත් ඒව යම්කිසි කර්ම බලවේග නිසා තමයි සිද්ධ වෙන්නෙ. මේ නිසා තමයි බුදුන් වහන්සේ කිව්වෙ යම්කිසි වත ලකුණු, දූත ලකුණු වගේ දේවල් බොදුනුවො ගණන් ගන්නෙ නෑ කියල. හැබැයි ගණන් ගන්නෙ නෑ කියන එකෙන් අදහස් කළේ එහෙම දෙයක් නෑ කියල නෙවෙයි. ඒ ලකුණු නිසා ඒ සිද්ධිය වෙන්නෙ නෑ, යම්කිසි තමන් කරපු කර්ම වේගයක් අනුව යමක් සිද්ධ වෙනවයි කියන එක. නමුත් කර්මයක් අනුව යමක් සිද්ධ වෙන කොට වුණත් විවිධ ලකුණු පෙන්නුම් කරනවා. ඒ ලකුණු නෑ කිව්වෙ නෑ. ඒක මත එල්බ ගෙන ඉන්න එපා කියලයි කිව්වෙ.

ඒ වගේම උන් වහන්සෙත් බුදු වෙන්න පෙර, බුදු වෙනව නම් පාත්‍රය උඩුගම් බලා යාවයි කියල යැව්වම, උඩුගම් බලා ගිය නිසා බුදු වුණා නෙවෙයි. බුදු වෙන්න හේතු තිබ්ච්ච නිසා ඒ පාත්‍රය උඩුගම් බලා ගියා. බුදු වෙන බවට ලකුණක් ඒකෙන් පෙන්නුවා. ඒ විදියට උන් වහන්සෙත් නිමිත්තක් ඇල්ලුවා. ඒ වගේම හීන තේරුවා. ඒ හීනවලින්, මතු බුදු වෙලා ලෝකයට සෙතක්, ශාන්තියක් කරන බවත් පෙන්නුවා. නමුත් හීන දැකපු නිසා

☞

එහෙම වුණා නෙවෙයි. එහෙම වෙන්න හේතු තිබ්ච්ච නිසා ඊට අනුකූල යම් කිසි ක්‍රම රටාවක ලකුණු පෙන්නුම් කළා. ඒවා පෙර ලකුණු. නමුත් මේ කරුණු අද බොහෝ අය පටලවා ගෙන, මේවා විග්‍රහ කරල නැති නිසා පිළිගත්තොත් මිථ්‍යා දෘෂ්ටිකයො වෙනවයි කියනවා. නමුත් මේ කිව්වෙ ඒක නෙවෙයි. එහෙම දෙයක් දැක්කම තමන්ගෙ ප්‍රයෝග සම්පත්තිය පාවිච්චි කරල ඒකෙන් ඵල ප්‍රයෝජන ගන්න, එහෙම නැත්නම් යම්කිසි විනාසයක පෙර ලකුණු දැක්කම, ඒකෙන් ප්‍රවේසම් වෙලා ඊට ගත යුතු පියවර අරගන්න කියන අදහස තමයි මේ කිව්වෙ. දැන් මේ වගේ කාරණාවල සත්‍යතාවයන් තියෙන බවට අදත් ඔප්පු කරන්න පුළුවන් සාක්ෂි තියෙනවා.

ඉස්සර හිටපු මුස්ලිම් මුදලාලිලගෙ සිරිතක් තිබුණා, පළමුවෙන්ම යම්කිසි මුදලක් අතට ගත්තම ඒක අතේ ගුලි කරගෙන, ටක් ටක් ගාල ඇඟිලි ඇට පනින්න ඇඟිලි තද කරනවා. ඒක පුරුදු වුණාම හොඳට ඇඟිලි ඇට පනිනවා. ඉස්සෙල්ලම ගන්න මුදල ඒ විදියට හිර කරගෙන ඇඟිලි ඇට පනින ගාණෙන්, එදා තමන්ට වෙළඳාම් වෙන මට්ටම හොයා ගන්න සාස්ත්‍ර ක්‍රමයක් තිබුණා. මෙහෙම ගියොත් පාඩු වෙනවද, ලාභ වෙනවද කියල ඒ ක්‍රමයට හොයා ගත්තා. එදා අද වගේ මහ කඩවල් නෙවෙයි තිබුණේ. පයින් වෙළඳාමෙ ගිය එක තමයි කළේ. ඒ අනුව වෙළඳාම් කරල ගන්න පළමු මුදල ඇඟිලි අතර තියාගෙන ඇඟිලි ඇට පැන්නුවම දෙකක් පැන්න නම් මෙහෙමයි, තුනක් පැන්න නම් මෙහෙමයි ආදී වශයෙන් ගණින ක්‍රමයක් තිබුණා. ඒ ක්‍රමය දන්න නිසා මොකද කළේ, වැඩි පුර ලාභයක් තිබුණ දවසක් වුණොත් එදාට හැම තැනම ඇවිදල වෙළඳාම් කරනවා. එහෙම නැත්නම් දෙක තුනක් වෙළඳාම් කරල ගෙදර ගිහින් නිවාඩු පාඩුවේ විවේක ගන්නවා.

දැන් මෙතනදිත් අඩුවෙන් ඇඟිලි ඇට පැන්න නිසා වෙළඳාම් අඩු වුණා කියන එකවත්, වැඩියෙන් පැන්න නිසා වෙළඳාම් වැඩිවුණා කියන එකවත් නෙවෙයි මේ කියන්නෙ. ඒ සිද්ධියෙන් ඒ දවසෙ දෛවය පෙන්නුම් කළා. ඒ දෛවය බලපාන විවිධ ක්‍රම තියෙනවා. මේ නිසා ප්‍රයෝග සම්පත්තිය යොදවල, ඒ දෛවය එදා හොඳට ක්‍රියාත්මක වුණොත් ඒකෙන් ඵල ප්‍රයෝජන ගන්නවා. දැන් මේ වගේ දේවල් නෑ කියන එකක් බුදු දහමෙ නෑ. ඒවායින් වුණත්, ඒවාට විශ්වාසයක් තියන්න එපා, ඒ නිසා මේ දේ තමන්ට සිද්ධ වුණයි කියල, තමන්ට මේ දියුණුව හෝ පිරිහීම ආවෙ ඒ නිසා කියල පිළි නොගෙන, ප්‍රයෝග සම්පත්තිය ක්‍රියාත්මක කරන්න කියන එක තමයි මේ කියන්නෙ. නමුත් මේ කාරණා දන්නෙ නැතිව, තෝර ගන්න බැරිව මේවා නිකම්ම මිථ්‍යා දෘෂ්ටි කියල සමහරු අහක දානවා. ඒක වැරදි ආකල්පයක්. පෙළ දහමෙ මේ කාරණා පැහැදිලිව සඳහන් වෙලා තියෙනවා. තෝර ගන්න බැරි එකයි මේ ප්‍රශ්නෙ වෙලා තියෙන්නෙ.

දැන් මේ වගේ දේවල් මෙහෙම වෙනව කියන කාරණය සම්බන්ධයෙන් අත් දැකීම් තියෙන බොහෝ පිරිස් අදත් ගැමි ජනතාව අතර ඉන්නවා. නමුත් ඒව වෙන්නෙ කොහොමද කියල ඇහුවම, වෙන හැටි තමයි දන්නෙ නැත්තෙ. ඒ නිසා තමයි මේක උගත් කියල සම්මත බොහෝ උදවිය පිළි නොගන්නෙ. නමුත් මේ සිද්ධ



වෙන විදියත් විද්‍යානුකූලව පහදන්න පුළුවන්. **පුද්ගලයෙක්ගෙ හද පත්ලෙන් නැගෙන්නා වූ දාහ සහගත හැඟීමත් එක්ක එක පාරටම යමක් දිහා බලන කොට, එහෙම නැත්නම් කටින් එළියට වචන පනින කොටම ඒ බැල්මට හා වචනවලට තියෙන බලය, ශක්තිය වැඩියි. ඒක චිත්ත කිරණක් එක්කයි පිටවෙන්නෙ. ඒ චිත්ත කිරණ ඒ අවස්ථාවේදී ප්‍රබලව වැඩ කරනවා. මනුස්ස හිතේ ස්වභාවය තමයි, යම් කිසි දෙයකට අරමුණු කරන්න පුළුවන් හැකියාව. විවිධ අරමුණු ඔස්සේ හිත මෙහෙයවන්න පුළුවන්. එතනදි යම්කිසි අරමුණක් එල්ල වෙනවා.**

උදාහරණ විදියට යම්කිසි එල්ලයකට තුවක්කුවක් එල්ල කරල පත්තු කළොත්, ඒක ඒ එල්ලෙට පත්තු වෙලා, ඒ ස්ථානයේ තියෙන දේවල් කුඩු වෙලා යනවා. ඒ වගේම යම්කිසි විදියකට යම් කිසි ආලෝකයක් යම් තැනකට එල්ල කළොත්, ඒ එල්ල කරපු තැන ආලෝකමත් වෙනවා. යම්කිසි නිශ්චිත තැනක් එල්ල කරල වතුර පාරක් යැව්වොත්, ඒ ස්ථානය තෙමෙනවා. මේ විදියට ඒ එල්ල කරපු තැනට යමක් යැව්වම ඒ හේතුවෙන් ඒ ස්ථානයේ ඊට අනුකූල යමක් සිද්ධ වෙනව වගේ, මනුස්ස හිතත් විවිධ තැන්වලට එල්ල කරන්න පුළුවන්. ඒකට ඇහැට පේන, කනට ඇහෙන මට්ටමක් හෝ සීමාවක් අවශ්‍ය නෑ. බොහෝ දුරකට එල්ල කරන්න පුළුවන්. එහෙම එල්ල කළාම චිත්ත කිරණ ඒ ස්ථානයට යනවා. හැබැයි මෙතනදී ඇස්වහ කටවහ කියන එකට බලපාන්නෙ ඒ ද්‍රව්‍ය වස්තු හෝ පුද්ගලයො ළඟ ඉඳගෙන බලන, කියන ඒවා. දුර ඉඳන් විහිදන චිත්ත කිරණ බලපාන අවස්ථා ඇස්වහ කටවහට නෙවෙයි සම්බන්ධ වෙන්නෙ. ඒක වෙනම පැත්තක්. (මේ වගේ ශරීරයෙන් විවිධ කිරණ විහිදෙන ආකාරයන් දැක බලාගන්න, කිරිලියානු තාක්‍ෂණ ක්‍රමයේ නවීනතම කැමරා ක්‍රමයක් වන ඕරා කැම් වීඩියෝ කැමරා ක්‍රමය උපයෝගී කරගනිමින් සිදු කළ විවිධ පර්යේශන www.japanaura.com වෙබ් අඩවියට පිවිසීමෙන් දැක බලා ගන්න පුළුවන්.)

කොහොම හරි මේ චිත්ත කිරණත් විවිධයි. සමහර චිත්ත කිරණ, සාප මනසකින් කළොත් ගිනි කිරණක් වෙනවා. ඒ වගේම මෙත්තා, කරුණා, මුදිතා... ආදී සෙත් ගුණයකින් කිව්වොත් සිසිල් කිරණක් පිට වෙනවා. ඒ ආකාරයෙන් අපි හිතන පතන විදියට තමයි ඒ කිරණත් හැදෙන්නෙ. ඒක නිකන් හිතුවට බෑ, හද පත්ලෙන්මයි නැගෙන්න ඕන. ඒ අනුව ඒ කිරණ වර්ගය සකස් වෙනවා. ඒ විදියට ඇස්වලින් කිරණ, වචනවලින් එන ශබ්ද මුල් කරගෙන චිත්ත කිරණ එහෙම සකස් වෙලා, අර එල්ල කරපු වස්තුව වටා ගිහින් භ්‍රමණය වෙනවා. ඒ භ්‍රමණය වෙන කොට ඒ කිරණවල ශක්තියට බාහිර ලෝකයේ තියෙන රූප කලාප සහජාත ප්‍රත්‍ය, ආසේවන ප්‍රත්‍ය ආදී වශයෙන් කියන ප්‍රත්‍යවලින් එකතු වෙලා ක්‍රියාත්මක වෙනවා. ඒ කියන්නෙ, ඒ කිරණ ශක්තියට අනුකූල දේවල් බාහිර ලෝකයෙන් ඇදල ගන්නවා. එහෙම ඇදල අරගෙන ඒක ක්‍රියාත්මක වෙනවා.

මෙතනදී මේ සහජාත - ආසේවන ප්‍රත්‍යයන් ක්‍රියාත්මක වෙන ආකාරයත් යම් පමණකට දැන ගැනීම වැදගත්. සහජාත කියන වචනයේ මූලික අර්ථය තමයි සහායට ජාතක වෙනව කියන එක. ඒ කියන්නෙ යම් කිසි ප්‍රධාන කාරණයක් මුල් කරගෙන, ඒ කාරණයේ බලය නිසා ඊට සහායක වස්තූන් සහයට සම්බන්ධ කරගන්න බලයක් ක්‍රියාත්මක වෙනවා. උදාහරණ විදිහට කොස් ඇටයක් ගත්තොත්, ඒකෙ සහජාත ශක්තිය තියෙනවා. හැබැයි නිකන් තිබුනට ඒ

ශක්තිය ක්‍රියාත්මක වෙන්නෙ නෑ. ඒක පැලවෙන්න දැම්මොත් බාහිර පරිසරයේ තියෙන පොහොර, ජලය, රසායන ද්‍රව්‍ය වගේ දේවල් සහාය කරගෙන අවසානයේ විශාල කොස් ගහක් බවට පත් වෙනවා.

ඊළඟට යම් කිසි දෙයක් සේවනය වෙන කොට ඒක සිද්ධ කරන්න තවත් උදව් උපකාර වෙන ප්‍රත්‍යය තමයි ආසේවන ප්‍රත්‍යය කියන්නෙ. ඒ කියන්නෙ ආසේවනයට උදව් දෙන ප්‍රත්‍යය. මෙතනදී ඒ ප්‍රධාන බලයට තවත් බලයක් එකතු වෙලා ඒ බලය දෙගුණ තෙගුණ වෙනවා. එක් දෙයකින් කරන්න පුළුවන් බලයට සමාන තවත් බල එකතු වෙනවා. එහෙම එකතු වෙලා ඒ අනුග්‍රහයෙන් හැදෙන බලය තවත් බලවත් වෙනවා. උදාහරණ විදිහට බීමට ඇබ්බැහි නොවෙච්ච කෙනෙක් මුලින්ම බොහොම පොඩ්ඩකින් තමයි මත් පැන් පානය පටන් ගන්නෙ. නමුත් ඒ විදිහට ටික කාලයක් ඒ පුද්ගලයා නැවත නැවතත් (ආසේවනය) මත් පැන් පානය කරන්න ගත්තම අවසානයේ බේබද්දෙක් බවට පත් වෙනවා. මේ වගේ දෙයක් ඇස් වහ කටවහේදීත් සිද්ධ වෙනවා. ඉස්සෙල්ලම කියන වචනයට, ඊළඟට එන වචනය අනුබලයක් වෙනවා. ඒ අනුබලයෙන් අර පළමු වචනය බලවත් වෙනවා. ඊළඟට ඒ හා සමාන වචනයක් හෝ ගති අදහසක් ගත්තොත්, ඒ මාත්‍රයත් අර පළමු අදහස බලවත් කරනවා. ඒක තමයි ආසේවන ප්‍රත්‍යයෙන් කරන්නෙ.

ඇස්වහත් මේ විදියටම තමයි. තත්පරයකටත් අඩු කාලයකදී මේ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. නමුත් අපිට තත්ත්පරයකදි හිතන්න බෑ. අපිට දැනෙන්නෙ නැතුවට තත්පරයට හිත් කෝටි ගාණක් පහළ වෙනවා. මොකද හැම වෙලේම පළවෙනි ජවන හිතේ තියෙන ගති ලක්ෂණය ඊළඟ ජවන හිතට ආසේවනය වෙනවා. එතකොට ඒක වේගවත් වෙනවා. ආසේවන ප්‍රත්‍යය කියන්නෙ ඒ වගේ දෙයක්. ඒකෙන් ආධාරයක් වෙනවා. මේ ප්‍රත්‍ය හුඟක් එකතු වෙලා තමයි සූවිසි (24) ප්‍රත්‍යවලින් යමක් ප්‍රත්‍ය වෙලා ක්‍රියාත්මක වෙන්නෙ. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර වේ, සංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ වේ.... ආදී වශයෙන් ප්‍රත්‍ය වෙනවයි කියනව මිසක් ප්‍රත්‍ය වෙන ආකාරය පෙන්වන්නෙ නෑ. අපි කෙටියෙන් තමයි එහෙම කියන්නෙ. නමුත් මේ කාරණය පට්ඨාන ප්‍රකරණය කියන විශාල විග්‍රහයක තියෙනවා. ඒකෙන් ප්‍රත්‍ය වෙන හැටි පෙන්වනවා. හැබැයි ඒව හරි ගැඹුරුයි. සංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ වෙනවයි කියන කොට, මේ සංඛාරවලට අපේ ක්‍රියා කලාපයන් ඔක්කොම අහු වෙනවා. එතකොට ඒකත් සහජාත ප්‍රත්‍යයෙන් එකතු වෙනවා. එහෙම එකතු වෙලා එකටම ජාතක වෙනවා. එතකොට නිශ්‍රය ප්‍රත්‍යය කියන්නෙ ඒ සඳහා ඒ කාරණය තියෙන්න ඕන, ඒකටම සම්බන්ධව තියෙන්න ඕන කියන එක. ඒ කියන්නෙ එකකට එකක් සම්බන්ධ වෙලා නිශ්‍රය වෙන්න ඕන, ඇසුර තියෙන්න ඕන. ඊළඟට උපනිශ්‍රය ප්‍රත්‍යයත් පැත්තක ඉඳන් ආධාර දෙනවා. මේ වගේ මේ ප්‍රත්‍යවල විවිධාකාරයෙන් විශේෂත්වයන් තියෙනවා.

මේ කාරණා උදාහරණයකින් මේ විදියට පහදන්න පුළුවන්. යම්කිසි තැනකට ගිනි කූරක් පත්තු කරල දැම්මොත්, එතැන තියෙන රොඩු බොඩු ආදියත් ඒකට එකතු වෙලා ඒ ගින්න ලොකු වෙනවා. ඒ වගේ යම්කිසි කිරණ ශක්තියක් බාහිර ලෝකයට නිකුත් වුණාම, ඊට අනුකූල දේවල් බාහිර ලෝකයේ තියෙනව නම් ඒව ඇදල අරගෙන අර ශක්තිය වර්ධනය කරනවා. මේ නිසා තමයි ඇස්වහ කටවහ කිව්වමත් ඔක්කොගෙන්ම වදින්නෙ නෑ කිව්වෙ. සමහර විට කෙනෙක්ගෙ ඇස්වහ කටවහ යම්කිසි තැනකට එල්ල වුණාම, ඒකට ප්‍රතිචාර දක්වන්න, ගිනි ඇති කරන ජාතියෙ මනසක් නම් ඒකට ලක් වෙන කෙනාගෙ හෝ ලක්වෙන වස්තුව හිමි කෙනාටත් තියෙන්නෙ, ඒ පුද්ගලයට හෝ ඒ වස්තුවට ඒක වදිනවා වැඩියි. මොකද හේතුව ඒ යවපු විස කිරණ ශක්තියට ඒ පුද්ගලයගෙ ආධාරක ටිකත් ඇදල අරගෙන වර්ධනය කරල දෙනවා. ඒ කියන්නෙ සමාන ගතියට සමාන ගතිය ආකර්ශනය වෙනවා. එහෙම ආකර්ශනය වෙලා ඒකෙන් ප්‍රත්‍ය වෙන ඵලය වැඩි කරල දෙනවා.

හැබැයි වතුරට ගිනි කූරක් පත්තු කරල දැම්මොත් නිවිල යනව මිසක් ඒක පත්තු වෙන්නෙ නෑ. මොකද වතුරෙ ඒ ගිනි ගන්නා ගතිය නැති නිසා. නමුත් පෙට්‍රල් ටිකකට, එහෙම නැත්නම් ගෑස් ටිකකට ගිනි කූරක් පත්තු කරල දැම්මොත් හෝස් ගාල ඇත තියාම ගිනි ගන්නවා. ඒ කියන්නෙ අවශ්‍ය කරන මූල ධාතුව එතැන තියෙනව නම්, දීපු දේට අනුව එහි ගති ලක්ෂණයට අනුකූලව ප්‍රතිචාර දක්වල ඒ ගතිය වර්ධනය කරනවා. ඒ වගේම තමයි මෙත්තා, කරුණා.... ආදී ගුණ තියෙන කෙනෙකුට කවුරු හරි ඒ විදියට ඇස්වහ කටවහ කළොත්, ඒ ගුණ තියෙන ප්‍රමාණයට අනුකූලව කර්ම ශක්තියටත් යටත්ව ඒක වැදීම බාල වෙනවා. ඇස්වහ කටවහ ආවත්, ඒකෙන් ගිනි ගන්න බැරි වෙනවා. මොකද ඔහු ළඟ ඒකට හේතු නෑ. හරියට වතුරට ගිනිකූරක් පත්තු කරල දැම්ම වගේ. සියල්ලන්ටම එක විදිහට ඇස් වහ කටවහ වදින්නෙ නැතිවෙන්න හේතුව ඒකයි. ඒ වගේම කෙනෙක්ගෙ පුණ්‍ය ශක්තිය මහා බලවත් නම්, ඒ අවස්ථාවේ ඒ පුද්ගලය මොන විදියෙ කෙනෙක් වුණත්, ඒ ගතිය අභිබවා අර පුණ්‍ය ශක්තිය ක්‍රියාත්මක වුණොත්, එතකොටත් ඒ වගේ ඇස් වහ කටවහ වදින්නෙ නැතුව යනවා. කොහොම හරි ඉතින් මේකට එකක් කියල නෑ. කර්ම ශක්තිය වගේම කාල වකවානුත්, පුද්ගලයගෙ ගති ස්වභාවයත්, පරිසරයත් බලපානවා.

**මේ නිසා මනුස්සයො වශයෙන් ජීවත් වෙන කොට හොඳම ක්‍රමය තමයි, හැම වෙලේම හද පත්ලෙන්ම යහපත නගන්න පුරුදු වෙන්න ඕන. දකින දකින හැම කෙනාටම හිතින් හරි සුවපත් වේවා, යහපතක්ම වේවා.... ආදී වශයෙන් කියන්න හදවත හුරු කරගන්න ඕන.** අර වගේ විස අදහසක් එන්න ඉස්සර වෙලා, එහෙම කියන්න පුරුදු වෙන්න ඕන. ඒ වගේම කවුරු හරි එක්ක කතා කරන්න පටන් ගත්තත්, ආයුබොවන්ඩ... සුවපත් වේවා... ජය වේවා... දීඝායු වේවා... නිරෝගි වේවා... ආදී වශයෙන් මේ වගේ මොනව හරි ආශිර්වාද වාක්‍යයකින් නිතරම පටන් ගන්න පුරුදු වෙන්න ඕන. මේ වගේ ගැමි වහරේ තියෙන ආශිර්වාද වාක්‍ය බොහොම හොඳයි. අදටත් හුඟ දෙනෙක්, කෙනෙක් දැක්ක ගමන් ආයුබොවන්ඩ කියල කියන්න පුරුදු වෙලා තියෙනවා. එතකොට ඇස් වහ කටවහ වුනත් නැති වෙනවා. ඒක බොහොම හොඳයි. යහපත් දෙයක්.

ඒ වගේම සමහරු තමන්ට කෙනෙක් වැන්දම එකපාරටම අහක බලා ගන්නවා. සමහර භික්ෂූන් වහන්සේලාත් එහෙම කරනවා. සුවපත් වේවා කියල කියන්න ඕන දේවත් කියන්නෙ නෑ. නමුත් ඇත්ත වශයෙන්ම එහෙම ආශිර්වාද වාක්‍යයක් කියන්න ඕන. කවුරු හරි දරුවෙක් දැක්කත් නිකම්ම ඔළුව අතගාන්නෙ නැතිව, නිරෝගි වේවා.... සුවපත් වේවා..... ආදී වශයෙන් ආශිර්වාද කරන්න පුරුදු වෙන්න ඕන. මේ වගේ වචන නිතර භාවිතා කරන්න පුරුදු වුණා නම්, අභ්‍යන්තරයෙන්ම ඒක නැගෙන්න පටන් ගන්නවා. ඒකෙන් ඒ පුද්ගලයටත් තමන්ටත් හොඳයි. දෙපැත්තටම හොඳයි. එතකොට ඇස්වහ කටවහ තියේනම් ඒකට හේතුවත් ඒ ඒ පුද්ගලයන් කෙරෙන් ඉවත් වෙනවා. මෙලොව වශයෙන් අභිවෘද්ධියත් සැලසෙනවා. දැන් මේ වගේ ඇස් වහ කටවහ සම්බන්ධයෙන් සිදු වෙච්ච සත්‍ය අත්දැකීම් සහ සමහර අවස්ථාවලදී ඒවාට කරපු ප්‍රතිකර්මත් අභයරතනාලංකාරය ලිපි පෙළ තුලින් ඉදිරියේදී බලාපොරොත්තු වෙන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ප්‍රත්‍යක්ෂ ඖසුවකට තවත් එකතුවක්...

හෙළ බොදු පියුම දහම් සඟරාවේ 20 වන කලාපයෙන් පෙන්වා දුන් ''ශරීර ගත සියලු වස විස නසන ප්‍රත්‍යක්ෂ ඖෂධයක්'' නම් ලිපිය යටතේ පළ වූ, ගොටුකොළ සහ කෝමාරිකා මිශ්‍ර ඖෂධය තවත් බල ගන්වන, ප්‍රත්‍ය කරවන ඖෂධයක් තමයි මේ හඳුන්වා දෙන්නෙ. මේ ඖෂධයත් අභයරතනාලංකාර හිමියන්ගේ සමාධියට හසු වූ, අත් දැකීම් සහිත ඖෂධයක්.

මේ සඳහා යොදා ගන්නෙ ඉඟිනි ඇට කුඩු. ගොටු කොළ මිටවල් 2 ක් සහ කෝමාරිකා පිති කැබැල්ලක් යොදා සකස් කළ ඖෂධය, තවත් හොඳින් ප්‍රත්‍ය වීමට ඉඟිනි ඇට කුඩු තේ හැඳි 1/2 ක් ඒකට එකතු කර මිශ්‍ර කර ගැනීමෙන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබාගන්න පුළුවන්. ඒ කියන්නෙ වකුගඩු ආබාධවල මූලික අවස්ථාවන්ගේ පටන් තුනටිය කැක්කුම, රක්ත උෂ්ණය, බඩ පපුව දැවිල්ල (ගැස්ට්‍රයිටිස්), යම් වස විස කැවීම් නිසා හට ගන්නා ආබාධයන් සහ විවිධ සතුන් දෂ්ඨ කිරීමෙන් ශරීර ගත වූ විස ඉවත් කිරීමටත් මේ ඖෂධය ඉතා හොඳයි. මේ ඉඟිනි ඇට කියන්නෙ හුඟක් තද ඇට වර්ගයක්. හැබැයි ඉඟිනි ඇට කුඩු බොහොම අති සියුම්. සාමාන්‍යයෙන් තේ හැඳි 1/2 ක් කියන්නෙ එක ඇටයක පමණ කුඩු ප්‍රමාණයක්. මේ විදියට කුඩු කර ගත් ඉඟිනි ඇට සිංහල ඖෂධ වෙළඳ සැල්වලින් පහසුවෙන් ලබාගන්න පුළුවන්.

ඒ වගේම මේ ඉඟිනි කියන වචනයේ පද නිරුක්තිය ගත්තොත්, ඉඟි කියන එකෙන් පෙන්වන්නෙ යම්කිසි ඉඟියක්, එහෙම නැත්නම් හෝඩුවාවක් ලබාදීම. ඒ කියන්නෙ යමෙකුට යම් ඌනතාවයක් අඩුපාඩුවක් තියේනම්, ඒක හොයල දීල ඒකට හේතුව නැති කරන්න ඉඟියක් දෙන එක තමයි මේ ඖෂධයෙන් කරන්නෙ. මේ ඉඟිනි ඇට දිය වුණාම අති සියුම්, ලිස්සන ස්වභාවයෙන් යුක්ත වෙනවා. එතකොට ඒ ඖෂධය ශරීරයට ඇතුළු වුණාම, ශරීරය ඇතුලෙ හැම තැනම


ඉඟිනි ඇට

ගිහින් ඔත්තු බලල, තියෙන විසබීජ විනාස කරන්න අල්ලල දෙනවා.

පැරණි ආයුර්වේදයේ පෙන්වා තියෙන්නෙ, විසබීජ නමැති සතුරන් සමග සටන් කරල, කය නමැති රාජ්‍යය ජයග්‍රහණය කිරීමට නම්, අට එකට ඉඳවා (ඉන්දවා) බෙහෙත ප්‍රත්‍ය කරගත යුතු බව. පසු කාලීනව තමයි ඒක අට එකට හිඳවා කියල හදාගෙන තියෙන්නෙ. නමුත් අට එකට හිඳවන කොටත් ඒකෙන් සිද්ධ වෙන්නෙ අට එකට ඉඳවන එක තමයි. මෙතනදි අටක් කිව්වෙ සටන ජයගන්න අවශ්‍ය රජතුමා, පුරෝහිතයො, බිසව, මහ ඇමති, සෙන්පති, සොල්දාදුවො, ඔත්තුකරුවො සහ කසල සෝදකයො කියන මේ අට දෙනා. දැන් මේ අට දෙනා එකතු වුණාට පස්සෙ තමයි රාජ්‍යය ජය ගෙන හරියට පවත්වාගෙන යන්න පුළුවන් වෙන්නෙ. ඉතින් මේ අට එකට එකතු කරනවා හා සමානව, ඖෂධ වර්ග අටත් එකට එකතු කරන්න කියන එක තමයි මේ පෙන්වන්නෙ. සමහර විට එකම ඖෂධයක මේ අටම තියෙන්නත් පුළුවන්. ඒක රෝගවල හැටියට තමයි තීරණය වෙන්නෙ. (මේ පිළිබඳ විශේෂ විග්‍රහයක් ඉදිරියේදී බලාපොරොත්තු වෙන්න.)

දැන් මේ ඖෂධයේදී ගොටු කොළ තමයි මූලික වෙන්නෙ. ඒ කියන්නෙ මෙතනදී ගොටුකොළ කියන්නෙ රජතුමා සහ පුරෝහිතයො. කෝමාරිකා කියන්නෙ බිසව. ඉඟිනි ඇට කියන්නෙ ඔත්තුකරුවො. මේ හතර දෙනා ඇතුළු ඉතිරි හතර දෙනාත් මේ ඖෂධවලම අඩංගුයි. දැන් මේ තුන මිශ්‍ර වුණාම ඖෂධය ඉතාම හොඳින් ප්‍රත්‍ය වෙනවා. එතකොට ගොටුකොළ මිටවල් දෙකයි, කෝමාරිකා පිති කැබැල්ලයි, ඉඟිනි ඇට කුඩු තේ හැඳි 1/2 යි එකට අරගෙන මිශ්‍ර කරල, හොඳින් කොටා ගෙන අවශ්‍ය ප්‍රමාණයට වතුර ටිකක් දාල ඉස්ම අරගෙන, ඒකට ලුණු බිංදු දෙක තුනකුත් දාල ඒ ඉස්ම තමයි කලින් ලිපියේ සඳහන් කළා වගේ උදේ හවස අමුවෙන්ම පානය කරන්න ගන්නෙ.

**සටහන:**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ 22 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**<u>ශ්‍රම දායකත්වය</u>** ¤ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ¤ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ¤ සමන් සිල්වා මහතා - කළුතර ¤ ඩී.සී.ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ¤ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ¤ රාජ් නිල්මිණි විජේවික්‍රම මහතා - ගොඩගම ¤ චිත්‍ර ශිල්පී එස්. එම්. ජයසේකර මහතා - මාලබේ ¤ ගයාන් ගුණරත්න මහතා - ගොතටුව ¤ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ¤ ඩබ්. ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ¤ ප්‍රසාද් ද සිල්වා මහතා - දෙල්ගොඩ ¤ පර්ෆෙක්ට් ඩිසයින් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ¤ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ¤ නන් අයුරින් දායකවූ පින්වතුන්

**<u>මූල්‍යමය දායකත්වය</u>** ¤ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු.20,000/- ¤ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ¤ තුසිත නාකන්දල මහතා - මහනුවර - රු. 6,000/-¤ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු. 5,000/- ¤ චරිත් ඉන්දික මහතා- ඉතාලිය- රු. 5,000/- ¤ කැළුම් ලංකේශ්වර මහතා ඇතුළු පවුලේ සැම- නෙළුව- රු.5,000/- ¤ ඔස්ටින් ප්‍රනාන්දු මහතා හා සිසිර සිරිවර්ධන මහතා - පොල්ගහවෙල - රු. 5,000/-¤ දිනුෂිකා ඉෂාදි දුව සහ අශිත හසරංග පුතා - වළස්මුල්ල රු. 5,000/- ¤ අමිල සල්ගාදු මහතා - බෝමිරිය රු. 3,500/- ¤ යශෝධරා රන්මිණි මහත්මිය - පිළියන්දල රු.3,000/- ¤ තුෂාරා පද්මකාන්ති සිල්වා මහත්මිය ඇතුළු පවුලේ සැම -පානදුර - රු. 2,500/- ¤ යමුනා කුලසේකර මහත්මිය - කලගෙඩිහේන - රු. 2,000/- ¤ දුලීකා සමන්ති මහත්මිය ඇතුළු පවුලේ සැම - නෙළුව - රු. 2,000/- ¤ කෝෂලා සිරිවර්ධන මෙනවිය - ගාල්ල - රු.2,000/-¤ රසික ජයලත් මහතා ඇතුළු පවුලේ සැම - පොල්ගස්ඕවිට - රු. 2,000/- ¤ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ¤ නලින් සේකර මහතා - වලල්ලාවිට රු. 1,000/-¤ දර්ශිකා දිසානායක මෙනවිය - බිබිල- රු.1,000/-¤ එස්. එස්. වීරසූරිය මහතා- වීරකැටිය - රු.1,000/- ¤ කේ.ඒ. උපාලි ජිනදාස මහතා- ගැටහැත්ත - රු.1,000/- ¤ චන්ද්‍රසේන අබේගුණවර්ධන මහතා- හක්මන රු.1,000/- ¤ ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා- ගල්කිස්ස රු. 1,000/- ¤ පුබුදු ශ්‍යාමික මහතා - නිට්ටඹුව - රු. 1,000/- ¤ කරුණාවතී රාජපක්ෂ මහත්මිය - තිහාරිය රු. 1,000/- ¤ අසංක ප්‍රේමතිලක මහතා ඇතුළු පවුලේ සැම - මරදගහමුල්ල - රු. 1,000/- ¤ සරත් නිශාන්ත මහතා - නෙළුව - රු.1,000/- ¤ ඥානවතී මදරසිංහ සිරිවර්ධන මහත්මිය - ගාල්ල - රු. 1,000/- ¤ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/-¤ ලොකු උමගිලියගේ ඇග්නස් මහත්මිය - අක්මීමන - රු.1,000/- ¤ නිලූකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,000/- ¤ චතුරිකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු.1,000/- ¤ කේ. ආර්. චාන්දනී ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,000/- ¤ එච්. එම්. රත්නසිරි මහතා - උඩුබැද්දාව - රු. 1,000/- ¤ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය රු. 1,000/- ¤ එච්. පී. විජේරත්න මහතා - කිරුලපන - රු.1,000/- ¤ නදීශා හර්ෂනී ලියනගේ මෙනවිය - කළුබෝවිල - රු. 1,000/-¤ බිසන්තිකා ගුණසේකර මහත්මිය සහ එරංග ලියනගේ මහතා - කළුබෝවිල - රු. 1,000/-¤ රංජිත් වික්‍රමසිංහ මහතා - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, ඉසුරු සම්පත් මහතා - කළුතර, මනෝජ් ජයසූරිය මහතා - මහරගම, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැළණිය, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, එම්. ජී. දයාවතී මහත්මිය - ඉහළ උඩුගම්පොල, මාලිකා මෙන්ඩිස් මෙනවිය- අහුංගල්ල, සුනිල් දිසානායක මහතා - මාලබේ, රංජිත් ප්‍රේමසිරි මහතා - නෙළුව - රු. 9,200/- ¤ විවිධ පින්වතුන් විසින් ලබාදුන් මුදල් පරිත්‍යාග රු. 700/- ¤ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග - රු. 110,400/- ¤ පළමු පිටපත් 8000 සඳහා මුද්‍රණ වියදම රු.189,600/- ¤ අනෙකුත් වියදම් - 8,910/- ¤ සම්පූර්ණ වියදම - රු. 198,510/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වර්ගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා!**

**එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,**
**අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,**
**දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ**
**අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද**
**නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත**
**බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**



සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.



# රිසි සේ නැති ලොවින්...







මල් මෙන් දුටුව පෙර රූ සිරු වසඟ කළ
බොල් වෙයි නොදන්වා නැත පෙර තිබුණු බල
කල් යන විටදී දුක් දෙයි නම් නැතිව එල
අල්වනු හැකිද තම වසඟෙට මැරෙන කල

නටමින් හතර වට මතුවට සැපය බලා
බැඳෙමින් ගිවින මුත් ලෝ දන ලොවට මුළා
නොදෙමින් කැමති දේ මළ විට දුකෙහි හෙළා
හඬමින් නගන දුක නොඇසෙයි කඳුළු සලා

සරන සියලු සත පැතුමන් අහක දමා
දිරන සොබා දම් නියමය සැවොම තෙමා
කරන කියන විට දුන්නත් වටින කමා
පරණ වෙන විටදී කවුරුත් ඔහොම තමා

නාවා සොවින් මේ සා දිවි ගෙවපු දුර
ආවා ගියා පමණකි නැත ලැබුව හර
කීවා වදන් නොලබන සැප නොයෙක වර
මේවා තමයි සසරෙහි අපි දරපු බර

ලද සත් මනු බවින් නිසි ලෙස එල නොගෙන
අදහස් අරන් ලෝ සැප නොගෙවෙන ලෙසින
මඳකුත් නොතකමින් මිය යන බව හැඳින
විඳවත් මහා දුක උපදින තැන නොදැන

මස් ලේ කයට ඇති වන මහ ලෙඩ ගොන්න
උස් මිටි කම් නැතිව එයි පසු පස පන්න
වස් දොස් කරන් පෙර කල ලැග ගෙන උන්න
තිස් එක් තලේ කොහෙවත් නැත සැනසෙන්න

තිබුණත් තැති ගැනුම් බිය ලෝ සත වෙතට
නොම වෙත් විසඳුමක් දහමින් හැර සිතට
වියපත් වෙලා බල නැසෙනට පෙර ගතට
ලැබ ගත් මනු බවින් වැඩ ගනු යහපතට

යන විට කෙමෙන් වැහැරී මරණය දෙසට
පැන ගත යුතුයි දුක් කඳ නොලැබෙන ලෙසට
දැන ගෙන තිලොව නතු නොරැවටී පුහු බසට
නැණ ගුණ වඩොත් පිහිටකි එය තම හිසට

පබැඳුම - නිසිඳු චන්දන සිරිවර්ධන









# කොච්චර කලකටද මේ... ?




බිමේ අඟලට කපා ගන්නා මරා ගන්නා මනු සතා
නැමේ මුළු ලොව වුණත් නැසුමට ලෝකයේ කම් සැප පතා
ළැමේ අඹ මල් රේණුවකවත් තරම් මෙත් සිතිවිලි නැතා
නිමේසයකින් නගන පවු කඳ ගියත් කප් කෙළ නොනැසෙතා

ඇගේ රෙදිකඩ නැතිව ඉපදෙන විටදි මොනවද ගෙනාවේ
මගේ කියලා අල්ල ගත් කිසි දෙයක් නොගෙනා කෙනා වේ
වගේ අද මුළු ලොවම තමනගෙ දිනෙන් දින හිමි වුණා වේ
රඟේ නොදැනෙයි මැරෙන තෙක් ඒ විකට විතරක් සිනා වේ



තමන්ගේ පරපුරට කියමින් ජාතියෙන් මෙහි ගෙනා සේ
රඟන්නේ නොමැරෙනා ලෙසටයි තිලෝ තලයම දිනා සේ
මැරෙන්නේ සන්තොසින් දෝ එන විටදි අත්බැව විනාසේ
හෙළන්නේ යම් දිනද පණ නල මරුත් එදිනට සිනා සේ



ආව ලොව පෙර දවස මතකයෙ තියේ නම් සිහියට එනා
භාව එහි ඇති දකිනු හැකි වෙත මොනවදෝ මෙලොවට ගෙනා
වාව ගනු බැරි දුකින් එ දවස චුත වුණිද හිටි ලොව දිනා
දාව කාටද ඉපදුනේ අද කිව හැකිද පරපුර ගැනා



පෙරත් සසරේ කළත් අනුවණකම් මෙදා කෝ එහි එලේ
වෙරත් යොදවා රැකත් වස්තුව කාටදෝ එය හිමි කළේ
මරත් මෙම දා අන් සතුන් ඒ තවත් රැක ගන්නද බලේ
හැරත් මෙ කයා තවත් අල්වා රකින්නද මේ මනු තලේ



මෙතෙක් ආ දුර සසර ගමනේ බලොත් සසඳා මෙම භවේ
ඈතෙක් බර නම් ලබපු කයවල් කුහුඹුවෙකු බර අද නොවේ
එතෙක් මැරි මැරි ඉපදුනේ මේ මොනව ලැබ ගන්නද ලොවේ
කොතෙක් කෙරුවත් එදා අද සහ හෙටත් එක ලෙසටම ගෙවේ

පබැඳුම
නිහිඳු චන්දන සිරිවර්ධන

නිහිඳු චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල විහාර පාරේ අංක 98/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී